# ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් පවතින නෛතික හා ප්‍රතිපත්තිමය ගැටලු පිළිබඳ විවරණයක්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2021 දෙසැම්බර්

CPA

Centre for Policy Alternatives
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු ස්වාධීන දේශපාලන පක්ෂවාදිත්වයෙන් තොර සංවිධානයක් වන අතර එය මූලික වශයෙන් රාජ්‍යකරණය සහ ගැටුම් නිරාකරණය හා සබැඳි ගැටලු කෙරෙහි සිය අවධානය යොමු කරයි. 1996 දී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පිහිට වනු ලැබුයේ මහජන ප්‍රතිපත්තීන් පිළිබඳව වූ කතිකාවත සඳහා සිවිල් සමාජයේ සජීවි දායකත්වය අත්‍යවශ්‍ය වන බවට හා එය ශක්තිමත් කළ යුතුව පවතින බවට වන දැඩි විශ්වාසය පෙරදැරි කොට ගෙන ය. මහජන ප්‍රතිපත්තීන් විවේචනාත්මක විමර්ශනයට භාජන කරන, විකල්පයන් හඳුනා ගන්නා හා ඒවා ව්‍යාප්ත කරන පර්යේෂණ හා බලපෑම් කිරීමේ වැඩසටහන් වෙනුවෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය කැපවී සිටී.


නො. 6/5, ලෙයාර්ඩ්ස් පාර, කොළඹ 5, ශ්‍රී ලංකාව

දුරකථන: +9411 2081384, +94112081385, +94112081386

ෆැක්ස්: +9411 2081388

වෙබ්: www.cpalanka.org

ඊමේල්: info@cpalanka.org

ෆේස්බුක්: www.facebook.com/cpasl

ට්විටර්: @cpasl



ප්‍රකාශකඃ විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, කොළඹ,ශ්‍රී ලංකාව

ISBN number – ISBN 978-624-5914-15-9

Bar Code – 9 786245 914159



Copyright © | CPA

## පටුන


**හැඳින්වීම** ........ 4

**ව්‍යුහයන්** ........ 4

කාර්ය සාධක බලකායන් සහ විශේෂඥ කමිටු ........ 4

**නීතිමය රාමුව** ........ 6

සංචරණය සීමා කිරීම ........ 6

රැස්වීමේ සීමාවන් ........ 7

නව නීති සහ රෙගුලාසි ........ 8

**පාලනය** ........ 11

හමුදාකරණය සහ දේශපාලනීකරණය ........ 11

වසංගතය සන්දර්භයෙහි පාර්ලිමේන්තුවේ කාර්යභාරය ........ 12

**අයිතිවාසිකම්** ........ 13

පොලිස් අපචාර ........ 13

මර්දනය ........ 14

සුළුතර ප්‍රජාවන්ට දිගින් දිගටම වෙනස්කොට සැලකීම ........ 15

අවදානමට ලක්විය හැකි ජනගහන සහ ප්‍රජාවන් සහ ව්‍යුහාත්මක අසමානතාවයන්හි බලපෑම ........ 16

**වගවීම සහ පාලනය** ........ 17

ඉටුකම අරමුදලේ අක්‍රමිකතා ........ 18

එන්නත් ප්‍රසම්පාදනය සම්බන්ධ වන අක්‍රමිකතා ........ 19

එන්නත් නිකුත් කිරීමේ වැඩසටහන සම්බන්ධ අක්‍රමිකතා ........ 20

**ඇමුණුම I** ........ 22

ලුහුඬු මාර්ගෝපදේශ I ........ 22

කොවිඩ්-19 වසංගත පසුබිම තුළ ඉස්මතු වන නෛතිකමය ගැටළු ........ 22

**ඇමුණුම II** ........ 33

ලුහුඬු මාර්ගෝපදේශ II ........ 33

ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන ව්‍යුහයන්: ජනාධිපති කාර්ය සාධක බලකාය පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක් ........ 33

**ඇමුණුම III** ........ 45

ලුහුඬු මාර්ගෝපදේශ III ........ 45

කොවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් ඇඳිරි නීතිය: ........ 45

ශ්‍රී ලංකාවේ නෛතික රාමුව සහ අදාළ ප්‍රශ්න ........ 45

**ඇමුණුම IV** ........ 54

ප්‍රශ්න සහ පිළිතුරු: ........ 54

නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ ........ 54

නිකුත් කරන ලද රෙගුලාසි ........ 54

සහ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 ප්‍රතිචාර සම්බන්ධයෙන් ඒවායෙහි බලපෑම ........ 54

**ඇමුණුම V** ........ 62

ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වයට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් අදාළ වන නෛතික රාමුව පිළිබඳ දැනුවත් කිරීම ........ 62

# හැඳින්වීම

වර්ෂ 2020 මාර්තු මාසයේ සිට ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පෙර නොවූ විරූ නීතිමය, දේශපාලනික, ආර්ථික සහ සමාජීය අභියෝග රාශියක් කොවිඩ්-19 සෞඛ්‍ය අර්බුදය හමුවේ ඉස්මතු වී ඇත. කොවිඩ්-19 වසංගතයෙහි පළමු රැල්ල පාලනය කිරීමට රජය සමත් වූ අතර, එතැන් සිට එකී වසංගත තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේ දී රජය විසින් නැඹුරුතාවයක් දක්වන දැඩි ලෙස මිලිටරිකරණය වූ සහ දේශපාලනීකරණය වූ ප්‍රවේශය සමඟ එහි ඇති සංකීර්ණත්වය පිළිබඳ ගැටලු හෙළිදරව් වී ඇත. කොවිඩ්-19 හි මෑතකාලීනම රැල්ලෙන් රට ක්‍රමක්‍රමයෙන් හිස ඔසවන්නට වෙර දරන විට, වසංගතය සහ ඒ සම්බන්ධයෙන් අනුගමනය කරන්නට යෙදුනු වැරදි පාලනය මගින් ඇති වූ ආර්ථික කඩාවැටීම සහ ඉහළ යන ජීවන වියදම සමඟ පොරබදන්නට සිදුව ඇති අතර එකී තත්ත්වය සම්බන්ධයෙන් පිළියම් යෙදීම උදෙසා කඩිනම් සහ ශක්තිමත් නෛතික සහ ප්‍රතිපත්තිමය ප්‍රතිචාරයක් අවශ්‍ය විය හැකිය.

මූලික වශයෙන්ම ගත්කල, මිලිටරිකරණය, දේශපාලනීකරණය, මර්දනය සහ ආන්තිකකරණය ආදී වශයෙන් වූ පුළුල් ප්‍රවණතා මගින් සෞඛ්‍ය අර්බුදය කළමනාකරණය කිරීමේ ප්‍රවේශය සංලක්ෂිත විය. අද වන විට වසංගත තත්ත්වය පාලනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන්නට යෙදුනු පිළිවෙත හේතුවෙන් වර්තමානයෙහි සිදුවෙමින් පවතින ඒකාධිපතිවාදයේ සහ විධායක අසීමිතව ශක්තිමත් කිරීම තවදුරටත් තීව්‍ර තත්ත්වයකට පත් කර ඇති සේම ඒ ඔස්සේ නීතියේ ආධිපත්‍යය, බලතල බෙදීම සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය කෙරෙහි බරපතල අගතිදායක ප්‍රතිවිපාකයන් උද්ගත කර ඇත.

වසංගත තත්ත්වය මෙන්ම ඒ හා බැඳි අනුශංගික ගැටලු සම්බන්ධයෙන් වන ප්‍රතිචාරයේ විවිධ අවස්ථා වලදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඒ ඒ තත්ත්වයන්ට අදාළ විවිධ නෛතික සහ ප්‍රතිපත්තිමය පැතිකඩයන් ග්‍රහණය කර ගනිමින් විවිධ සංක්ෂිප්ත සටහන්, මාර්ගෝපදේශයන් සහ වෙනත් ලියකියවිලි නිකුත් කරන ලදී (සහ මෙම ලේඛනයේ අවසන් කොටස්හි ඇමුණුම් වශයෙන් එකී ලේඛන ඇතුළත් කර ඇත).

මෙම ලේඛනය ඔස්සේ සිදු කෙරෙන විග්‍රහය වූ කලී, වසංගත තත්ත්වයට ප්‍රතිචාරය දැක්වීම සම්බන්ධයෙන් සමස්ථයක් වශයෙන් පරිපූර්ණ විශ්ලේෂණයක් නොවුව ද, වර්ෂ 2020 මාර්තු සිට 2021 නොවැම්බර් දක්වා කාල පරාසය තුළ ඉස්මතු වූ ගැටළු සහ ඇඟවුම් පිළිබඳව විමසුමට ලක් කිරීමේ අරමුණින් සකසන ලද්දකි. මේ සඳහා, ලේඛනය ප්‍රථමයෙන් කොවිඩ්-19 පැතිරීම පාලනය කිරීම සඳහා හඳුන්වා දී ඇති අදාළ ව්‍යුහයන් සහ නීති රාමු පිළිබඳ දළ විශ්ලේෂණයක් සපයනු ඇත. දෙවනුව, එකී වසංගත තත්ත්වය පාලනය කිරීමට අදාළ ගැටළු හඳුනා ගැනීම, මූලික අයිතිවාසිකම් සීමා කිරීම සහ අපයෝජනය කිරීම, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අඛණ්ඩව බැහැර කිරීම සහ වසංගත ප්‍රතිචාරය තුළ ඇති වූ අක්‍රමිකතා සම්බන්ධයෙන් සීමිත වගවීම ආදී වශයෙන් වූ තත්ත්වයන් ඉස්මතු කරනු ලබන අතර ඒ ඔස්සේ වත්මන් ප්‍රවේශය හේතුවෙන් වසංගත ප්‍රතිචාරයේ විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා ඇති සීමිත ඉඩ ප්‍රස්ථාව සහ සිවිල් නිදහස සීමා කිරීම්, සෞඛ්‍ය අර්බුදයේ වැරදි කළමනාකරණය සහ වෙනත් අක්‍රමිකතා උද්ගත වී ඇති බව පෙන්වාදෙනු ලැබේ.

# ව්‍යුහයන්

ප්‍රධාන කරුණු:

- සීමිත වගවීමකින් සහ විනිවිදභාවයකින් යුතු කාර්ය සාධක බලකායන් කිහිපයක් පත් කර ඇත
- මෙම තාවකාලික ව්‍යුහයන් හරහා දැනට පවතින ආයතන මඟහැරීම හෝ අතිච්ඡාදනය වේ
- හමුදාකරණය සහ දේශපාලනීකරණය ඔස්සේ මෙම ව්‍යුහයන්හි ස්වරූපය නිරූපණය කරනු ලබයි
- කාර්ය සාධක බලකායන්හි සහ විශේෂඥ කමිටු වල ක්‍රියාකාරකම් පිළිබඳ ලබා ගත හැකි තොරතුරු සීමිත වීම

## කාර්ය සාධක බලකායන් සහ විශේෂඥ කමිටු

වර්ෂ 2020 මාර්තු මාසයේ සිට, ගැටලු රාශියකට විසඳුම් සෙවීම සඳහා කාර්ය සාධක බලකායන් 10කට වැඩි ප්‍රමාණයක් ස්ථාපිත කර ඇති අතර, ඒ ඔස්සේ ජනාධිපතිවරයාට පමණක් වගකිය යුතු තාවකාලික ව්‍යුහයන් විසින් පාලනය කිරීමේ ව්‍යාප්ත සංස්කෘතියක පෙර ලකුණු පෙන්නුම් කෙරේ. වසංගතය තත්ත්වය මගින් ඇති කරන ලද විවිධ අවිනිශ්චිතතාවයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා එවැනි තාවකාලික ව්‍යුහයන් කිහිපයක්

විශේෂයෙන් ස්ථාපිත කරන ලදී.[1] 'රට හදන සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනත් කාර්ය සාධක බලකායන් ද පිහිටුවන ලදී.[2]

**2020 මාර්තු මාසයේ සිට පත්කරන ලද කාර්ය සාධක බලකායන්,**

**කොවිඩ්-19 ආශ්‍රිත ගැටළු:**

❖ කොවිඩ් -19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය (NOCPCO), 2020 මාර්තු 17[3]

❖ වර්ෂ 2020 මාර්තු 26 දිනැති අංක 2168/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත, සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසු විපරම පිණිස ජනාධිපති කාර්ය සාධක බලකාය

❖ වර්ෂ 2020 අප්‍රේල් 27 වැනි දින අංක 2173/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත, ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කොරෝනා වෛරසය ආසාදනයෙන් වලක්වා ගැනීම සඳහා සෑම හමුදාවක් විසින්ම ගත යුතු ක්‍රියාමාර්ග අධ්‍යයනය කර එකී පියවර ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදීම පිණිස ජනාධිපති කාර්ය සාධක බලකාය

❖ වර්ෂ 2020 දෙසැම්බර් 31 දිනැති අංක 2208/33 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය

**'රට හදන සෞභාග්‍යයේ දැක්ම' සහ 'එක් රටක්, එක් නීතියක්' පිළිබඳ ප්‍රතිපත්තීන්:**

❖ වර්ෂ 2020 ජූනි 2 දිනැති අංක 2178/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත, සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය

❖ වර්ෂ 2020 ජූනි 2 වැනි දිනැති අංක 2178/17 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත, නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුම කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය

❖ වර්ෂ 2021 ඔක්තෝබර් 26 දිනැති අංක 2251/30 දරන  අති විශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත, එක් රටක්, එක නීතියක් සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය.

මෙම තාවකාලික ව්‍යුහයන්ගේ සාමාජිකත්වය සහ ක්‍රියාකාරකම් සම්බන්ධව හඳුනාගත හැකි ප්‍රධාන ගැටළු වන්නේ ඒවා තුළ ඇති මිලිටරිකරණය සහ දේශපාලනීකරණය යි. මෙම කාර්ය සාධක බළකාවල බලතල ද පුළුල් වන අතර ඒවයෙහි වගවීම සහතික කිරීමට නිසි යාන්ත්‍රණයක් නොමැති අතර, එය බලය අනිසි ලෙස භාවිතා කිරීමට මෙන්ම වසංගතයට අදාළ ගැටලු සම්බන්ධයෙන් ඵලදායී විසඳුම් ලබා ගැනීම පිළිබඳව අසමත් වීමට හේතු විය හැක.[4]

---

[1] තෝරාගත් කාර්ය සාධක බලකායන් පිළිබඳ වැඩි විස්තර සඳහා ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාළ ව්‍යුහයන්: ජනාධිපති කාර්ය සාධක බලකාය පිළිබඳ කෙටි විවරණයක්, 2020 අප්‍රේල් 8 දින, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය බලන්න. https://www.cpalanka.org/structures-to-deal-with-covid-19-in-sri-lanka-a-brief-comment-on-the-presid ential-task-force/ (ඇමුණුම II) සහ 'ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වයට පිළියම් කිරීම සඳහා වන නෛතික රාමුව පිළිබඳ දැනුවත් කිරීම, 2021 මැයි 12, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/an-update-on-the-legal-framework-to-address-the-covid-19-pandemic-in-sri-lanka/ (ඇමුණුම V)

[2] 'ජනාධිපති කාර්ය සාධක බලකා ද්විත්වය පත් කිරීම', 2020 ජූනි, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/the-appointment-of-the-two-presidential-task-forces/

[3] කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය (NOCPCO) වසරකුත් මාස නවයක් සම්පූර්ණ වීමෙන් පසු එහි ක්‍රියාත්මක වීම නවත්වනු ඇත. බලන්න, ශවේන්ද්‍රගේ ප්‍රධානත්වයෙන් යුත් කොවිඩ් කාර්ය සාධක බලකායෙහි මෙහෙයුම් නවත්වයි. 2021 දෙසැම්බර් 9 වෙනි දින, ද කළඹු ගැසට්. https://colombogazette.com/2021/12/09/covid-task-force-headed-by-shavendra-ceases-operations/

[4] ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාළ ව්‍යුහයන්: ජනාධිපති කාර්ය සාධක බලකාය පිළිබඳ කෙටි විවරණයක්, 2020 අප්‍රේල් 8 වැනි දින, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/wp-content/uploads/2020/04/FINAL-Presidential-Task-Force-on-COVID19-April-2020-copy.pdf (ඇමුණුම II)

මෙම කාර්ය සාධක බලකායන් සහ අනෙකුත් ව්‍යුහයන් පාර්ලිමේන්තු අධීක්ෂණය යටතට නොගැනේ. බලගතු විධායකයෙකුට පක්ෂ වන අන්දමින් සංවරණ හා තුලන තත්ත්වයන් ද ඒ කෙරෙහි සංකේන්ද්‍රණය වී ඇති පසුබිමක මෙන්ම සක්‍රීය පාර්ලිමේන්තුවක් නොමැති කාලය තුළ මෙකී කාර්ය සාධක බලකායන් ගණනාවක් පත් කිරීමද සිදුව ඇත.

පාර්ලිමේන්තු අධීක්ෂණය යටතේ පවතින අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතනවල කාර්යය කර්තව්‍යයන් බොහොමයක් ඉහත කී කාර්ය සාධක බලකායන්හි බොහෝ කාර්යයන් ඔස්සේ අතිච්ඡාදනය වීමට හෝ අභිබවා යාම සිදුවිය හැකිය.[5] මෙම ව්‍යුහයන්ගේ අඛණ්ඩ ක්‍රියාකාරකම්වලට අදාළව මහජනතාවට ප්‍රවේශ වියහැකි මට්ටමේ පවතින සීමිත තොරතුරු මගින් ඒවායෙහි නීත්‍යානුකූලභාවය, විනිවිදභාවය සහ වගවීම පිළිබඳ ගැටළුකාරී තත්ත්වයන් තවදුරටත් සංකීර්ණ වේ.

මෙම කාර්ය සාධක බලකායන්ට අමතරව, කොවිඩ්-19 ආශ්‍රිත ගැටළු සම්බන්ධයෙන් නිර්දේශ ලබා දීම සහ මාර්ගෝපදේශ සැපයීම සඳහා විශේෂඥ කමිටු කිහිපයක් ද පත් කරන ලදී. වර්ෂ 2020 දෙසැම්බර් 24 වන දින, මුස්ලිම් ප්‍රජාවට වෙනස් කොට සැලකීම සිදු වූ සහ ඔවුන්ගේ මෘතදේහයන් භූමදානය කිරීමේ අයිතිවාසිකම් පිළිබඳ මතභේදාත්මක තත්ත්වයක් ඇති කළ අනිවාර්ය ආදාහන රෙගුලාසි අධ්‍යයනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විශේෂඥ කමිටුවක් ස්ථාපිත කරන ලදී. ආදාහනය සහ භූමදානය යන දෙකම ඇතුළත් වන පරිදි රෙගුලාසි සංශෝධනය කිරීමට එකී කමිටුව විසින් නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

වර්ෂ 2021 පෙබරවාරි මස එකී රෙගුලාසි සංශෝධනය කරන ලදී.[6] අනෙකුත් විද්වත් කමිටු ද පත් කර ඇති බව වාර්තා වන අතර,[7] ඔවුන්ගේ කාර්යය කර්තව්‍යයන් පිළිබඳ සීමිත තොරතුරු පමණක් මහජනතාවට ප්‍රවේශ විය හැකි මට්ටමේ තිබේ.

# නීතිමය රාමුව

ප්‍රධාන කරුණු:

- සංචරණය කිරීම සහ ඒකරාශී වීම සඳහා වූ විවිධ සීමා කිරීම් සඳහා නීතිමය පදනම පැහැදිලි කර නොමැත
- විරෝධතා තහනම් කිරීම සම්බන්ධයෙන් වන නෛතික පදනම ප්‍රශ්න කළ හැකි ස්වභාවයේ වීම
- සෞඛ්‍ය අර්බුදය කළමනාකරණය කිරීම සඳහා පවතින නීති භාවිතා කිරීමට හෝ අවශ්‍ය නව නීති හඳුන්වා දීමට රජය දැක්වූ මූලික අකමැත්ත
- අලුතින් හඳුන්වා දුන් නීති මගින් වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස ඉස්මතු වූ පුළුල් පරාසයක විහිදුනු ගැටලුවලට ප්‍රමාණවත් ලෙස විසඳුම් නොලැබීම
- හදිසි නීති රෙගුලාසි හරහා අත්තනෝමතික ක්‍රියාමාර්ග සඳහා ඇති හැකියාව

## සංචරණය සීමා කිරීම

වසංගතය ආරම්භයේ සිටම, කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය කිරීමේ අරමුණින් මහජනතාවගේ ගමනාගමනය සීමා කිරීම සඳහා විවිධ අවස්ථා වලදී සීමාවන් ගණනාවක් පනවා ඇත. සීමා කිරීම් ප්‍රකාශයට පත් කරන ලද්දේ 'ඇඳිරි නීතිය', 'නිරෝධායනය', 'පොලිස් ඇඳිරි නීතිය' සහ 'නිරෝධායන

[5] ප්‍රදීප් පීරිස් සංස්කරණය කළ *'ප්‍රතිකර්මයට වඩා රෝගය භයානකද? ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2021) ප්‍රකාශනයෙහි භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ විසින් රචිත 'වසංගතයක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි සීඝ්‍ර පරිහානිය'.*
https://www.cpalanka.org/wp-content/uploads/2021/08/06-Chapter-2.pdf

[6] වැඩි විස්තර සඳහා, 'නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි සහ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට මෙය බලපාන ආකාරය පිළිබඳ ප්‍රශ්න සහ පිළිතුරු' බලන්න, 2020 නොවැම්බර් 6, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 'ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වයට පිළියම් කිරීම සඳහා වන නෛතික රාමුව පිළිබඳ දැනුවත් කිරීම, 2021 මැයි 12, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/an-update-on-the-legal-framework-to-address-the-covid-19-pandemic-in-sri- lanka/(ඇමුණුම IV); ශ්‍රී ලංකාවේ රට හදන සෞභාග්‍යයේ දැක්ම: ලබාදුන් පොරොන්දු සහ වර්තමාන ප්‍රවණතා පිළිබඳ විග්‍රහයක්' 2021, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/sri-lankas-vistas-of-prosperity-and-splendour-a-critique-of-promises-made-and-present-trends/

[7] නිදසුනක් වශයෙන්, සිනෝෆාම් එන්නත කුමන වයස් කාණ්ඩවලට ලැබිය යුතුද යන්න නිර්දේශ කිරීම සඳහා විශේෂඥ කමිටුව පිහිටුවන ලදී.

ඇඳිරි නීතිය' ආදී වශයෙනි.[8] මෙම සීමා කිරීම් සඳහා අදාළ වන නීතිමය පදනම අඛණ්ඩව ප්‍රශ්න කර ඇත්තේ ඒවා භාවිතයට යෙදෙන අන්දමෙහි පැහැදිලි බවක් සහ අනුකූලතාවයක් නොමැතිකම හේතුවෙනි. මෙම සීමාවන් හඳුනා ගැනීමට 'නිරෝධායන ඇඳිරි නීතිය' වැනි පාඨයන් භාවිත කිරීම කිසිදු නීතියකින් සඳහන්ව ඇති බවක් සොයාගත නොහැක.

නිවේදන හෝ මාධ්‍ය නිවේදන හරහා මෙකී සංචරණ සීමාවන් සම්බන්ධයෙන් මහජනතාවට දැනුම් දෙනු ලබන අතර දෙමළ භාෂාවෙන් එවැනි නිවේදන ගණනාවක් නොමැතිවීම පිළිබඳව ද අවධානය යොමු කර ඇත.

මෙම ගැටළුකාරී තත්ත්වය පැවතියේ දී පවා, සංචරණ සීමා කිරීම් උල්ලංඝනය කිරීම් හේතුවෙන් වාර්තාගත අන්දමේ අත්අඩංගුවට ගැනීම් ගණනාවක් සිදු විය.[9] වර්ෂ 2021 මැයි මාසයේදී පොලිස්පතිවරයා වෙත ලිපියක් යවමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ස්වකීය නිරීක්ෂණයන් ඉදිරිපත් කරමින් පෙන්වා දෙන ලද්දේ සෞඛ්‍ය ගැටළුව කළමනාකරණය කිරීමේදී පුද්ගලයන්ගේ ගමනාගමනයට අදාළව සංචරණ සීමා පැනවීම වැදගත් වන නමුදු, එවැනි සීමා පැනවීමේදී නීත්‍යානුකූල භාවය සහ වෙනස් කොට සැලකීමේ තත්ත්වයක් ඇති නොවන අන්දමින් පවතින නීති සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ආරක්ෂාවන්ට අනුකූලව කිරීමට පියවර ගත යුතු බවය.[10]

## රැස්වීමේ සීමාවන්

වර්ෂ 2021 ජූලි 6 වන දින, පොලිස් මාධ්‍ය අංශය නිවේදනයක් නිකුත් කරමින් විරෝධතා සහ මහජන රැස්වීම් තහනම් කරන බව ප්‍රකාශ කළ අතර, එම තහනම කඩකරන්නන් සම්බන්ධයෙන් නිරෝධායන රෙගුලාසිවලට අනුව කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී.[11] කොවිඩ් -19 සම්ප්‍රේෂණය වීමේ ඉහළ අවදානමක් පවතින බැවින් නැවත දැනුම් දෙන තුරු මහජන විරෝධතා සහ රැස්වීම් නොපවත්වන ලෙස සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පොලිසියට දන්වා තිබූ ලිපියක් අනුව මෙම තහනම පැනවිණි. එකී තහනම සඳහා වන නීතිමය පදනම එම නිවේදනයේ පැහැදිලි කර නොතිබුණි. වසංගතය අතරතුර විරෝධතාවලට රජයේ ප්‍රතිචාර දැක්වීම සම්බන්ධ නීතිමය ගැටළු පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෑතකදී අදහස් දක්වා ඇත.[12] තත්ත්වය එසේ තිබියදීත්, කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාල [Kotelawala National Defence University (KNDU) Bill] පනත් කෙටුම්පත, පාසල් ගුරුවරුන්ගේ වැටුප් වර්ධක ඉල්ලීම්,[13] මෑතකදී ඉහළ ගිය ඉන්ධන මිල සහ රසායනික පොහොර තහනම[14] ඇතුළු කරුණු ගණනාවකට අදාළ දුක්ගැනවිලි සම්බන්ධයෙන් ස්වකීය දුක්ගැනවිලි පෙන්වාදීමට රට පුරා පැවති විවිධ විරෝධතාවලදී අත්අඩංගුවට ගැනීම් රැසක් සිදු විය.

---

[8] මෙම සීමා කිරීම් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සඳහා, 'කොවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් ඇඳිරි නීතිය: ශ්‍රී ලංකාවේ නෛතික රාමුව සහ අදාළ ප්‍රශ්න, 2020 අප්‍රේල් 21, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය https://www.cpalanka.org/curfew-in-response-to-covid-19-legal-framework-and-relevant-questions-in-sri-lanka/ (ඇමුණුම III)

[9] වැඩි විස්තර සඳහා, 'ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වයට පිළියම් කිරීම සඳහා වන නෛතික රාමුව පිළිබඳ දැනුවත් කිරීම, 2021 මැයි 12, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, බලන්න. https://www.cpalanka.org/an-update-on-the-legal-framework-to-address-the-covid-19-pandemic-in-sri-lanka/ (ඇමුණුම V)

[10] ඇඳිරි නීතිය පැනවීම විධිමත් කිරීම පිළිබඳ නිර්දේශ, 2020 ජූනි 08, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව. https://www.hrcsl.lk/wp-content/uploads/2020/02/curfew.HRCSL-recommendation-final.pdf

[11] විරෝධතා සහ මහජන රැස්වීම් පැවැත්වීම ශ්‍රී ලංකාව තහනම් කරයි, 2021 ජූලි 6, කළඹු පේජ් http://www.colombopage.com/archive_21A/Jul06_1625587252CH.php

[12] 'කොවිඩ්-19 වසංගතයේ පසුබිම තුළ විරෝධතා දැක්වීමට ඇති අයිතියට රාජ්‍ය ප්‍රතිචාරයේ නීත්‍යානුකූලභාවය පිළිබඳ විග්‍රහය' 2021 නොවැම්බර්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/comment-legality-of-the-state-response-to-the-right-to-protest-in-the-light-of-the-covid-19-pandemic/

[13] නෛතික වශයෙන් ප්‍රශ්න ඉස්මතු කළහැකි තත්වයන් යටතේ වුවද ලංකා ගුරු සංගමයේ (CTU) ප්‍රධාන ලේකම් ජෝසප් ස්ටාලින් ඇතුළු වෘත්තීය සමිති සාමාජිකයින් 22 දෙනෙකු විරෝධතා සහ මහජන රැස්වීම් තහනම් කිරීමේ විධිවිධානය උල්ලංඝණය කිරීමේ චෝදනාව මත 2021 ජූලි 8 වන දින අත්අඩංගුවට ගෙන නිරෝධායන කඳවුරු වෙත යවන ලද අතර පසුව ඔවුන්ව නිදහස් කරන ලදී. ශ්‍රී ලංකාවේ නිරෝධායනය කරන ලද විරෝධතාකරුවන් දින 14 ක හුදකලා කාලයට දින කිහිපයක් අඩුවෙන් නිදහස් කරන ලදී. 2021 ජූලි 16, ඉමේෂ් රණසිංහ, ඉකොනොමි නෙක්ස්ට් බලන්න, . https://economynext.com/quarantined-protestors-in-sri-lanka-released-several-days-short-of-14-day-iso lation-period-84091/

[14] 'ආනන්ද පාලිත ඇප මත නිදහස්', 2021 අගෝස්තු 22, ද මෝර්නින්, දිනිත රත්නායක සහ පමෝදි වරාවිට. https://www.themorning.lk/ananda-palitha-released-on-bail/

විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීම් සහ බලහත්කාරයෙන් නිරෝධායනය කිරීම හේතුවෙන් මෙකී තහනමේ නීත්‍යානුකූලභාවය සහ සංචරණයේ, රැස්වීමේ සහ සමාගමයේ නිදහස සීමා කිරීම සඳහා නිරෝධායන රෙගුලාසි සහ මධ්‍යස්ථාන අනිසි ලෙස භාවිතා කිරීම ආදී වශයෙන් වූ ගැටළු පිළිබඳ කනස්සල්ල මතු කළේය. අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩියෙන් ස්වකීය බලය යෙදවීම සහ සිවිල් ඇඳුමින් සැරසී සිටි පොලිස් භටයින් විසින් විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීමේ අවස්ථා සම්බන්ධයෙන් මාධ්‍යවල වාර්තා වීමත් සමඟ පොලිසියේ එකී ප්‍රශ්නකාරී ක්‍රියාකලාපය සම්බන්ධයෙන් ද අවධානයට ලක් විය.[15]

විරෝධතාකරුවන් සහ මහජන රැස්වීම් පාලනය කිරීම සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහයේ 98 සහ 106 වගන්ති භාවිත කරන ලෙසට මහේස්ත්‍රාත්වරුන්ට මඟපෙන්වීමක් සිදු කළ මහේස්ත්‍රාත්වරුන් ඇතුළු විනිසුරුවරුන් කිහිප දෙනෙකු සම්බන්ධ වූ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පවත්වන ලද රැස්වීමක් පිළිබඳව මාධ්‍ය වාර්තා පළ විය.[16] මෙම වාර්තාවලට අනුව, මහේස්ත්‍රාත්වරුන්ගේ අධිකරණ මනස ක්‍රියාත්මක කිරීමේ අභිමතය සම්බන්ධයෙන් මෙම මාර්ගෝපදේශ සැපයීම හරහා ඇති කළ හැකි බලපෑම පිළිබඳව කනස්සල්ල මතු විය. ශ්‍රී ලංකා නීතිඥ සංගමය ද ඒ සම්බන්ධයෙන් ප්‍රතිචාර දක්වමින් පෙන්වා දෙන ලද්දේ එවන් මඟපෙන්වීමක් සහ ඒ ඔස්සේ අධිකරණයේ ස්වාධීනත්වය කෙරෙහි ඇති විය හැකි බලපෑම පිළිබඳ ස්වකීය කනස්සල්ල ඉදිරිපත් කරන බවය.[17] අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් වර්ෂ 2021 අගෝස්තු 23 වැනි දින රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත යොමු කරන ලද ලිපියකින් පැහැදිලි කරන ලද්දේ එකී වෙබිනාර් රැස්වීම සංවිධානය කරන ලද්දේ ශ්‍රී ලංකා විනිසුරුවරුන්ගේ ආයතනය මිස අධිකරණ සේවා කොමිෂන් සභාව නොවන බවයි.[18]

රැස්වීම්, ක්‍රියාකාරකම්, සිදුවීම් හෝ ඒ හා සමාන රැස්වීම් ස්ථාන පැවැත්වීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම අනිවාර්ය කිරීම සඳහා වර්ෂ 2021 නොවැම්බර් 9 වන දිනැති අංක 2253/10[19] දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නව රෙගුලාසි හඳුන්වා දෙන ලදී. විපක්ෂය විසින් කොළඹදී මහජන උද්ඝෝෂණයක් පැවැත්වීමට සැලසුම් කිරීමට දින කිහිපයකට පෙර මෙම රෙගුලාසි ගෙන ආ අතර, සමගි ජන බලවේගයේ ජනතා විරෝධතාව වැළැක්වීමට පොලිසිය අධිකරණ නියෝග කිහිපයක් ලබාගෙන තිබියදී වුවද, රටේ විවිධ ප්‍රදේශ නියෝජනය කරමින් සහභාගි වූ ජනතාව සමඟින් එය පැවැත්වුණි.[20]

## නව නීති සහ රෙගුලාසි

වසංගත තත්ත්වය ආරම්භයේ සිටම, සෞඛ්‍ය අර්බුදය කළමනාකරණය කිරීම සඳහා පවතින නීති[21] භාවිතා කිරීමට හෝ නව නීති ක්‍රියාත්මක කිරීමට රජය විසින් මූලාරම්භයක් නොගැනීම විවේචනයට ලක්ව ඇත. මේ සම්බන්ධයෙන් ආණ්ඩුවේ අකමැත්ත, වර්ෂ 2020 දී විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සහ වර්ෂ 2021 දී පෝට් සිටි පනත් කෙටුම්පත[22] කඩිනමින් සම්මත කිරීමට අනුගමනය කළ

---

[15] 'විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීමේදී නිසි ක්‍රමවේදයක් අනුගමනය කරන්න: අනුර' අජිත් සිරිවර්ධන සහ යොහාන් පෙරේරා, 2021 අගෝස්තු 6, ඩේලි මිරර් ඔන්ලයින්.//www.dailymirror.lk/latest_news/Adopt-proper-procedure-when-arresting-protesters-Anura/342-217690

[16] 'විනිසුරුවරුන් සහ නීතිඥයින් මෑතකදී පැවති අධිකරණ සේවා කොමිෂන් සභා රැස්වීම' පිළිබඳව කණගාටුව පළ කරති. ලක්මාල් සූරියගොඩ, 2021 අගෝස්තු 15 වන දින, ඩේලි මිරර් ඔන්ලයින්. https://www.dailymirror.lk/latest_news/Judges-and-lawyers-express-dismay-over-recent-JSC-meeting/342-218276

[17] ශ්‍රී ලංකා නීතිඥ සංගමය දැඩි කනස්සල්ල පළ කරයි; අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පිළිතුරු අපේක්ෂා කරයි, 2021 අගෝස්තු 22, ද සන්ඩේ ටයිම්ස්. https://www.sundaytimes.lk/210822/news/basl-expresses-grave-concerns-seeks-answers-from-jsc-452873.html

[18] 'අධිකරණ සේවා කොමිෂන් සභාව පවසන්නේ තමන් වෙබිනාර් රැස්වීමක් සංවිධානය නොකළ බවයි' 2021 අගෝස්තු 23, පමෝදි වරාවිට, ද මෝර්නින්. https://www.themorning.lk/jsc-says-it-did-not-organise-webinar/

[19] 2021 නොවැම්බර් 9 දිනැති අංක 2253/10 දරණ ගැසට් (අති විශේෂ) පත්‍රය. http://www.documents.gov.lk/files/egz/2021/11/2253-10_S.pdf

[20] වාරණ නියෝග මධ්‍යයේ ශ්‍රී ලංකාවේ විපක්ෂය අද විරෝධතාවයේ නිරත වේ, 2021 නොවැම්බර් 16, කළම්බුපේජ්. http://www.colombopage.com/archive_21B/Nov16_1637044208CH.php

[21] වැඩි විස්තර සඳහා, 'සංක්ෂිප්ත මාර්ගෝපදේශය I: කොවිඩ්-19 වසංගත සන්දර්භය තුළ විකාශනය වන නීතිමය ගැටළු පිළිබඳ නෛතික රාමුව' බලන්න, 2020 මාර්තු 28, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය https://www.cpalanka.org/brief-guide-i-evolving-legal-issues-in-the-context-of-covid-19/ (ඇමුණුම I)

[22] ප්‍රදීප් පීරිස් සංස්කරණය කළ *'ප්‍රතිකර්මයට වඩා රෝගය භයානකද? ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2021) ප්‍රකාශනයෙහි භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ විසින් රචිත 'වසංගතයක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි සීඝ්‍ර පරිහානිය'.*

ක්‍රියාපිළිවෙත හා බැලීමේ දී පැහැදිලි පරස්පරතාවයක් පෙන්නුම් කරනු ලබයි. මහජන සෞඛ්‍ය හදිසි තත්වයක් ප්‍රකාශ කිරීම සහ මහජන සෞඛ්‍ය සඳහා විශේෂ ක්‍රියාමාර්ග අනුගමනය කිරීම සඳහා වර්ෂ 2020 ඔක්තෝබර් 20 දින පාර්ලිමේන්තු මන්ත්‍රී සුමන්තිරන් විසින් ඉදිරිපත් කරන ලද පුද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත වැනි කොවිඩ්-19 සම්බන්ධ නීති හඳුන්වා දීමට දරන ලද උත්සාහ කිරීම් නොසලකා හරින ලදී.[23] කොවිඩ්-19 අර්බුදය කළමනාකරණය කිරීම සඳහා මෑතකදී හඳුන්වා දුන් නීති සහ රෙගුලාසි අතර කැපී පෙනෙන්නේ කොරෝනා වයිරස් රෝගය 2019 (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත සහ හදිසි නීති (අත්‍යවශ්‍ය ආහාර සැපයීම) රෙගුලාසි වේ.

වර්ෂ 2021 අගෝස්තු 17 වන දින, ශ්‍රේෂ්ඨාධිකරණයේ මතය අනුව සිදු කරන ලද සංශෝධන සහිතව, කොරොනා වයිරස් රෝගය 2019 (කොවිඩ්-19) (තාවකාලික විධිවිධාන) පනත් කෙටුම්පත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. පනත් කෙටුම්පත 2021 මාර්තු 01 සිට ක්‍රියාත්මක වන අතර එය වසර 2ක කාලයක් සඳහා ක්‍රියාත්මක වේ. මෙම පනත මඟින් නඩු කටයුතු සහ නෛතික බැඳීම් සහිත ගිවිසුම් සම්බන්ධයෙන් සහන සලසයි.

කෙසේ නමුත්, වසංගත තත්ත්වය හේතුවෙන් පැන නගින හදිසි අවස්ථා නිරාකරණය කිරීම සඳහා නීති සම්පාදනය කිරීමට අවශ්‍ය විය හැකි වෙනත් ක්ෂේත්‍ර තිබේ. නිදසුනක් වශයෙන්, මාත්‍රාව නාස්ති කිරීම සහ අවදානම් ප්‍රමුඛතාවය උල්ලංඝනය කිරීම පිළිබඳ චෝදනා ඇතුළුව එන්නත් කිරීමේ ක්‍රියාවලියේ දන්නා අක්‍රමිකතා තිබියදීත්, එකී එන්නත් කිරීමේ ක්‍රියාවලිය නියාමනය කිරීමට සහ අධීක්ෂණය කිරීමට පනත ඔස්සේ කිසිදු ප්‍රතිපාදන සලසා දී නොමැත.[24] එපමණක් නොව, ශ්‍රී ලංකාව තුළ වසංගත සහ අනෙකුත් මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා වාර්තා කිරීම සම්බන්ධයෙන් නෛතික විධිවිධානයන් නොමැතිකම ඉස්මතු කර ඇත. ලෝක සෞඛ්‍ය සංවිධානයේ ජාත්‍යන්තර මාර්ගෝපදේශ වලට පටහැනිව කොවිඩ්-19 හේතුවෙන් සිදුවන මරණ සම්බන්ධයෙන් වන නිර්වචනය විකෘති කිරීම සහ නිල සංඛ්‍යාලේඛනවල නිරවද්‍යතාවය පිළිබඳ ඇති ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳව අඛණ්ඩ අවධානය යොමු කිරීම සම්බන්ධයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් මතු කරන ලද ගැටළු වල පසුබිම සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ මාර්ගෝපදේශ අනුව[25] වසංගත වාර්තා කිරීම සම්බන්ධ ප්‍රොටෝකෝල සහ ක්‍රියාවලීන් සම්බන්ධයෙන් වත්මන් වසංගත ප්‍රතිචාරය තුළ දැනට ප්‍රතිපාදන නොමැති බව පැහැදිලිය.[26]

වත්මන් සෞඛ්‍ය හදිසි අවස්ථාවට ප්‍රතිචාර දැක්වීමේ සියලු ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නීතිමය බැඳීම්වලට අනුකූල බව සහතික කිරීම ද වැදගත් වේ. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ සීමා කිරීම් සහ අවමන් කිරීමේ ප්‍රතිපාදන පිළිබඳ සිරකුසා මූලධර්ම (1984) පොදු හදිසි අවස්ථාවන්ට ප්‍රතිචාර වශයෙන් රාජ්‍යයන් විසින් ගනු ලබන සියලුම පියවරයන් හි නිශ්චය කළ හැකි නීත්‍යානුකූල අරමුණු තිබිය යුතු බව සඳහන් කරයි.

---

https://www.cpalanka.org/wp-content/uploads/2021/08/06-Chapter-2.pdf

23 සමන් ඉන්දජිත්, හදිසි සෞඛ්‍ය අවස්ථා නිරාකරණය කිරීමට උදෙසා සුමන්තිරන් විසින් පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරයි, 2021 ඔක්තෝබර් 21, ද අයිලන්ඩ්. https://island.lk/sumanthiran-moves-private-members-bill-to-tackle-health-emergency/

24 රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් කොවිඩ් එන්නත් වැඩසටහනේ අක්‍රමිකතා පෙන්වා දෙමින් පරීක්ෂණයක් ඉල්ලා සිටී, 2021 ජුනි 12, නිව්ස්වයර්. https://www.newswire.lk/2021/06/12/gmoa-points-out-irregularities-in-covid-vaccination-program-demands-inquiry/; අරුන්දතී සංගක්කාර, ශ්‍රී ලංකාවේ එන්නත් සොරුන්, 2021 මැයි 20, ද කළඹු ග්‍රාෆ්.
https://www.colombotelegraph.com/index.php/vaccine-thieves-of-sri-lanka/

25 රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් කොවිඩ් එන්නත් වැඩසටහනේ අක්‍රමිකතා පෙන්වා දෙමින් පරීක්ෂණයක් ඉල්ලා සිටී, 2021 ජුනි 12, නිව්ස්වයර්. https://www.newswire.lk/2021/06/12/gmoa-points-out-irregularities-in-covid-vaccination-program-demands-inquiry/

26 කොවිඩ්-19 හේතුවෙන් සිදු වූ මරණ පිළිබඳ වැරදි සංඛ්‍යා හෙළි කිරීමෙන් පසු රාජපක්ෂ විසින් ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ සෞඛ්‍ය නිලධාරියකු මාරු කරයි, 2021 ජුනි 19වෙනි දින, ද නිව් ඉන්දියන් එක්ස්ප්‍රස්.
https://www.newindianexpress.com/world/2021/jun/19/sri-lanka-shuffles-senior-health-official-after-rajapaksa-reveals-wrong-covid-19-death-figures-2318540.html

**හදිසි අවස්ථා සහ හදිසි නීති රෙගුලාසි**

වර්ෂ 2021 අගෝස්තු 30 වැනි දිනැති අතිවිශේෂ ගැසට් නිවේදන අංක 2243/3 මගින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඟවා තැබීම වැළැක්වීම සඳහා මහජන ආරක්ෂක ආඥාපනත යටතේ ජනාධිපතිවරයා විසින් හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන ලදී. සංශෝධිත මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තිය (40 වැනි පරිච්ඡේදය) යටතේ ජනාධිපතිවරයා විසින් අංක 2243/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් කරන ලද ප්‍රකාශයකට පසුව අගෝස්තු 30 වැනි දින මෙකී ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

වර්ෂ 2021 අංක 1 දරන හදිසි (අත්‍යවශ්‍ය ආහාර සැපයීම) රෙගුලාසිය ද වර්ෂ 2021 අගෝස්තු 30 දිනැති 2243/3 ගැසට් පත්‍රය මගින් බලාත්මක විය. එහි 2 වන රෙගුලාසියේ විස්තර කර ඇති මෙම නියෝගයේ අරමුණු වන්නේ 'සහල්, සීනි ඇතුළු අත්‍යවශ්‍ය ආහාර තොග සැඟවීම, බෙදා හැරීම, අඩපණ කිරීම, අධික මිල ගණන් අය කිරීම සහ පාරිභෝගික ජනතාව අපහසුතාවයට පත් කරන වෙළඳපල අක්‍රමිකතා ආදී කටයුතු වැලැක්වීම සඳහා සහ පාරිභෝගික ජනතාවගේ සුභසිද්ධිය සඳහා කටයුතු කිරීම'' වේ. එහි 12 වැනි රෙගුලාසියට අනුව, ''ජනතාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයීම් හා සේවා පවත්වාගෙන යාම සඳහා, වී, සහල් හා අත්‍යවශ්‍ය ආහාර ඇතුළු පාරිභෝගික ද්‍රව්‍ය හා ඒවා ප්‍රවාහනය කරනු ලබන වාහන අධිග්‍රහණය කිරීම අවශ්‍ය යයි හෝ යෝග්‍ය යයි නිසි බලධාරියකුට අදහස් වුවහොත්, එබඳු වීල සහල් හා අත්‍යශ්‍ය ආහාර පාරිභෝගික ද්‍රව්‍ය හා ඒවා ප්‍රවාහනය කරනු ලබන වාහන ඒ බලධාරියා විසින් අධිග්‍රහණය කළ හැකි ය.''

වර්ෂ 2021 අගෝස්තු මාසයේදී අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සඟවා තැබීම වැළැක්වීම සඳහා හදිසි නීති රෙගුලාසි හඳුන්වා දෙන ලදී. 'අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාමට අදාළ සියලු කටයුතු ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා[27] ලෙස 9[28] වැනි රෙගුලාසි යටතේ ජනාධිපතිවරයා විසින් හිටපු යුද හමුදාපතිවරයකු පත් කරන ලදී. කෙසේ නමුත්, පසුව වාර්තා වූයේ සහල් සහ වී මිල පාලනය අහෝසි කිරීමෙන් පසු අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් තනතුර පිහිටුවීමේ තීරණය රජය සමාලෝචනය කිරීමට අපේක්ෂා කරන බවයි. වර්ෂ 2021 සැප්තැම්බර් 27 වැනි දින අමාත්‍ය මණ්ඩලය විසින් අදාළ ගැසට් පත්‍රය අවලංගු කිරීමට තීරණයක් ගත් බව වාර්තා විය. අත්තනෝමතික ක්‍රියාමාර්ග සඳහා ඉඩ සලසන පැහැදිලි ක්‍රියා පටිපාටි නොමැති වීම පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මූලික කනස්සල්ල මතු කළ අතර හදිසි අවස්ථා රෙගුලාසි මගින් පිළිගෙන ඇති විශේෂිත අරමුණු සඳහා පමණක් භාවිතා කරන බව සහතික කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලදී.[29] මෙම හදිසි රෙගුලාසි පවතින නීතිමය රාමුව සඳහා ආදේශකයක් ලෙස නොසැලකිය යුතු බව ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නැවත අවධාරණය කළේය.[30] කෙසේ වෙතත්, හදිසි අවස්ථා තත්වයක් මාසයක කාලයකට පසුව අවලංගු වේ.[31]

[27] 2021 අගොස්තු 30 දිනැති අංක 2243/5 දරණ ගැසට් (අති විශේෂ) පත්‍රය http://documents.gov.lk/files/egz/2021/8/2243-05_S.pdf

[28] 2021 අගොස්තු 30 දිනැති අංක 2243/5 දරණ ගැසට් (අති විශේෂ) පත්‍රය http://documents.gov.lk/files/egz/2021/8/2243-03_S.pdf

[29] හදිසි තත්වයක් ප්‍රකාශ කිරීම සහ අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවාවන් පවත්වාගෙන යාම සඳහා වන රෙගුලාසි, 2021 සැප්තැම්බර් 2, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://cpalanka.org/wp-content/uploads/2021/09/Initial-Comment-CPA-Essential-Food-Serivces-ERs-2021-1.pdf

[30] ඉහත එම

[31] හදිසි තත්වයක් ප්‍රකාශ කරනු ලබන ප්‍රකාශයක් වලංගු වන්නේ මාසයක කාලයක් සඳහා පමණි. හදිසි තත්ත්වය දීර්ඝ කිරීම පාර්ලිමේන්තුවේ අනුමැතිය ඇතිව කළ යුතුය.

## පාලනය

ප්‍රධාන කරුණු:

- වසංගතයට අදාළ සෞඛ්‍ය ප්‍රතිචාර දැක්වීම් සඳහා හමුදාවේ මැදිහත්වීම ඉහළ මට්ටමක පැවතීම
- කාර්ය සාධක බළකායන්ට සහ අනෙකුත් රජයේ ආයතනයන්ට අදාළව කෙරෙන පත්වීම් දේශපාලනීකරණය කිරීම
- පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද කාල සීමාව තුළ පාර්ලිමේන්තු අධීක්ෂණයක් නොතිබීම හේතුවෙන්, රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් විධායකයට අසීමිත පාලනයක් ඇති කිරීමට මග පෑදීම
- විධායකයේ ආධිපත්‍යය වැඩි වීම

### හමුදාකරණය සහ දේශපාලනීකරණය

සිවිල් අවකාශයන් සහ අධිකාරී ආයතන හමුදාකරණය කිරීම සහ වසංගත ප්‍රතිචාරය අතරතුර සිවිල්-මිලිටරි අන්තර්ක්‍රියාවන් වූ කලී වර්ධනය වෙමින් පවතින කනස්සල්ලට හේතුවක් වී ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් වැනි රජයේ තනතුරු සඳහා හිටපු සහ වත්මන් හමුදා නිලධාරීන් පත් කිරීමත් සමඟ පවතින සිවිල් අධිකාරී ආයතනික ව්‍යුහයන් වෙත හමුදාකරණය ආරෝපණය වී ඇත. සෞඛ්‍ය අර්බුදය ඇති පසුබිමෙහි ස්ථාපිත කරන ලද විවිධ කාර්ය සාධක බලකායන්ට හමුදාමය පසුබිමක් ඇති සාමාජිකයින් කිහිප දෙනෙකු ද ඇතුළත් විය.

කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයෙහි ප්‍රධානී, යුධ හමුදාපති ශවේන්ද්‍ර සිල්වා, වසංගත තත්ත්වය සම්බන්ධයෙන් වූ සෞඛ්‍ය ප්‍රතිචාරයේ ඉදිරියෙන්ම සිටි අතර, සෞඛ්‍ය රෙගුලාසිවලට සම්බන්ධ ප්‍රධාන තීරණ අඛණ්ඩව මහජනතාවට සන්නිවේදනය කළේය.[32]

වර්ෂ 2021 ජනවාරි මාසයේදී, කොවිඩ්-19 වැළැක්වීමේ පියවර සම්බන්ධීකරණය කිරීම සහ දිස්ත්‍රික් මට්ටමින් නිරෝධායන ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා යුද හමුදාපතිවරයා විසින් නිර්දේශ කරන ලද ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් පත් කරන ලදී.[33]

නිරෝධායන මධ්‍යස්ථාන වෙත පුද්ගලයින් බලහත්කාරයෙන් ප්‍රවාහනය කිරීම, සම්බන්ධතා සොයා ගැනීම, එන්නත් කිරීම වැනි ක්‍රියාකාරකම් නිරීක්ෂණයට අමතරව මුරපොලවල් වල සේවයෙහි යෙදීම සහ හුදකලා ප්‍රදේශවල ඩ්‍රෝන යානා භාවිත මඟින් සංචරන සීමා උල්ලංඝණය කරන්නන් නිරීක්ෂණය කිරීම ආදී කටයුතු වලට හමුදාව සම්බන්ධ විය.[34] සහල්, සීනි ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය රජයේ සහතික මිලට හෝ ආනයන වියදම් මත රේගුවෙන් විකිණීමට සහ තොග සඟවා තැබීම වැළැක්වීමට නිලධාරීන්ට බලය ලබා දෙන ක්‍රියාමාර්ගය හමුදාව විසින් අධීක්ෂණය කරන බව වඩාත් මෑතක දී ජනාධිපති මාධ්‍ය ප්‍රකාශකවරයා විසින් ප්‍රකාශ කළේය.[35]

---

[32] ප්‍රදීප් පීරිස් සංස්කරණය කළ *'ප්‍රතිකර්මයට වඩා රෝගය භයානකද? ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2021) ප්‍රකාශනයෙහි භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ විසින් රචිත 'වසංගතයක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි සීඝ්‍ර පරිහානිය'.* https://www.cpalanka.org/wp-content/uploads/2021/08/06-Chapter-2.pdf

[33] දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන් සමඟ කොවිඩ්-19 පාලන කටයුතු තවදුරටත් ශක්තිමත් කිරීමට නියමිතය, 2021 ජනවාරි 01 වැනි දින, ශ්‍රී ලංකා යුධ හමුදාව. https://www.army.lk/news/covid-19-control-work-be-further-strengthened-district-coordinating-officers

[34] ප්‍රදීප් පීරිස් සංස්කරණය කළ *'ප්‍රතිකර්මයට වඩා රෝගය භයානකද? ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2021) ප්‍රකාශනයෙහි භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ විසින් රචිත 'වසංගතයක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි සීඝ්‍ර පරිහානිය'.* https://www.cpalanka.org/wp-content/uploads/2021/08/06-Chapter-2.pdf

[35] විදේශ විනිමය අර්බුදය නරක අතට හැරෙන විට ආහාර මිල පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාව ආර්ථික හදිසි අවස්ථාවක් ප්‍රකාශයට පත් කරයි, 2021 සැප්තැම්බර් 1 වන දින, ද හින්දු. https://www.thehindu.com/news/international/sri-lanka-declares-economic-emergency-to-contain-food-prices-as-forex-crisis-worsens/article36226141.ece

තවද, ප්‍රධාන පත්වීම් කිහිපයක් හරහා තාවකාලික ව්‍යුහයන්ගේ දේශපාලනීකරණය වූ ස්වභාවය නිරීක්ෂණය කළ හැකිය.

නිදසුනක් වශයෙන්, අත්‍යාවශ්‍ය සේවා අඛණ්ඩව සැපයීම, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය ද ඇතුළුව, මෙකී කාර්ය සාධක බලකායන් කිහිපයක සභාපතිත්වය දරන්නේ බැසිල් රාජපක්ෂ වන අතර, බෙදාහැරීමේ දාමයේ දී ආණ්ඩුවේ ආධාරකරුවන්ට ප්‍රමුඛත්වය ලබා දීම පිළිබඳ කනස්සල්ලට එකී තත්ත්වය හේතු විය. මේ අන්දමින් සිදු වූ හමුදා සහ දේශපාලන පත්වීම් සෞඛ්‍ය සහ අනෙකුත් අදාළ ක්ෂේත්‍රවල විශේෂඥ දැනුම සහිත පළපුරුදු රාජ්‍ය සේවය නොසලකා හරින මට්ටමකට පත් වූ බව සැලකිය යුතු කරුණකි.[36] පසුගිය මාස කිහිපය තුළ රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් කිහිප දෙනෙකුගේ ඉල්ලා අස්වීම් ද සිදු වූ බව දැකගත හැකි වූ අතර, මෙම ආයතනවල ස්වාධීනත්වය නොමැතිකම සම්බන්ධයෙන් වැඩෙන සැකයන් ඒ හරහා තරවදුරටත් වැඩි කරනු ලබයි.

## වසංගතය සන්දර්භයෙහි පාර්ලිමේන්තුවේ කාර්යභාරය

කොවිඩ්-19 සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ සෞඛ්‍ය හදිසි අවස්ථාවක් නොතිබූ අවස්ථාවක, වර්ෂ 2020 මාර්තු 2 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරින ලදී. කෙසේ නමුත්, පසුව රට තුළ කොවිඩ් -19 වෛරසය ආසාදිත රෝගීන් කිහිප දෙනෙකු හඳුනා ගැනීමත් සමඟ මැතිවරණ කල් දමන ලෙස ඉල්ලා සිටියේය. මාර්තු මස 19 වැනි දින නාමයෝජනා භාරදීමේ කාලය අවසන් වීමත් සමඟම මැතිවරණ කොමිසම විසින් මැතිවරණ කල් දැමීමට තීරණය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස වසංගතය පැතිරී මාස කිහිපයක් යන තුරු රට තුළ ක්‍රියාත්මක පාර්ලිමේන්තුවක් තිබුණේ නැත. පාර්ලිමේන්තුව විසුරුවා හරින ලද ගැසට් පත්‍රය ඉල්ලා අස්කර ගැනීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ කිසිවක් ජනාධිපතිවරයාට බාධාවක් නොවූ බව මෙහිදී සඳහන් කළ යුතුය.[37] පාර්ලිමේන්තු අධීක්ෂණයක් නොමැතිකම නිසා විධායකයට රාජ්‍ය මූල්‍ය පිළිබඳ අසීමිත පාලනයක් ඇති කර ගැනීමට ඉඩ සැලසී තිබුණි.[38] වසංගත ප්‍රතිචාරයේ තීරණාත්මක අවස්ථාවන්හිදී, පාර්ලිමේන්තුව කැඳවීමට අපොහොසත් වීම හරහා වසංගතයට ප්‍රතිචාර දැක්වීම සඳහා පවතින යාන්ත්‍රණ කිහිපයක් භාවිතා කිරීමට තිබූ ඉඩ ප්‍රස්ථාව රජයට අහිමි විය.[39]

ගෝලීය වශයෙන්, වසංගතය හේතුවෙන්, ඵලදායී නීති සහ පරිපාලන ක්‍රියාමාර්ගවලට ප්‍රවේශ වීම වෙනුවට, විධායක ආධිපත්‍යය වැඩි කිරීම, ඒකාධිපති පාලන තන්ත්‍ර තහවුරු කිරීම, පාර්ලිමේන්තු අධීක්ෂණයක් නොමැතිකම සහ සාමාන්‍ය ජනතාවගේ ගැටළු ආමන්ත්‍රණය කිරීමට කැප වන පාලකයන්ගේ අවුකම ආදී තත්ත්වයන්ට හේතු වූ බව නිරීක්ෂණය වී ඇත.[40]

එවැනි තත්වයක් තුළ, වසංගතයේ මුල් මාස කිහිපය තුළ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොතිබීම හේතුවෙන්, හදිසි අවස්ථා ප්‍රතිචාර දැක්වීම් අධීක්ෂණය කිරීම, මහජන සෞඛ්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා අරමුදල් අනුමත කිරීම, කොවිඩ් වසංගතය සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමෙහි විනිවිදභාවය සහතික කිරීම ආදී වශයෙන් වූ පාර්ලිමේන්තුවේ කාර්යභාරයන් බරපතල ලෙස අවතක්සේරුවට කළේය.[41]

---

[36] ප්‍රදීප් පීරිස් සංස්කරණය කළ *'ප්‍රතිකර්මයට වඩා රෝගය භයානකද? ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2021) ප්‍රකාශනයෙහි භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ විසින් රචිත 'වසංගතයක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි සීඝ්‍ර පරිහානිය'.* https://www.cpalanka.org/wp-content/uploads/2021/08/06-Chapter-2.pdf

[37] වැඩි විස්තර සඳහා, 'සංක්ෂිප්ත මාර්ගෝපදේශය I: කොවිඩ්-19 වසංගත සන්දර්භය තුළ විකාශනය වන නීතිමය ගැටළු' බලන්න, 2020 මාර්තු 19, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය https://www.cpalanka.org/wp-content/uploads/2020/03/Brief-Guide-I-_Evolving-Legal-Issues-in-the-Context-of-COVID-19.pdf (ඇමුණුම I)

[38] ඉහත එම.

[39] උදාහරණයක් වශයෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ මහජනතාවගේ සහ ජනාධිපතිවරයා විසින් පනවන ලද ඇඳිරි නීතිය සඳහා ආරක්ෂක ආඥාපනත, නියෝගයක් පාර්ලිමේන්තුවට දන්වා යැවිය යුත්තේ මහජන ආරක්ෂක ආඥාපනතේ 21(2) වගන්තිය යටතේ හදිසි තත්වයක් ප්‍රකාශ කිරීම, කෙටියෙන් බලන්න මාර්ගෝපදේශය III: කොවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් ඇඳිරි නීතිය: ශ්‍රී ලංකාවේ නීතිමය රාමුව සහ අදාළ ප්‍රශ්න' අප්‍රේල්, 2020, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/wp-content/uploads/2020/04/Brief-Guide-III-CURFEW.pdf (ඇමුණුම III)

[40] රෝනන් කෝමැසියන් සහ ඉටායි බාර්සීමන් ටෝව්ඩ් (Ronan Cormacain & Ittai Bar-Siman-Tov) කොවිඩ්-19 කාලයේ ව්‍යවස්ථාදායකය (2020) 8 (1-2, 3-9) නීති සම්පාදනයේ න්‍යාය සහ භාවිතය (රූට්ලෙඩ්ජ් 2020). https://www.tandfonline.com/doi/pdf/10.1080/20508840.2020.1816017?needAccess=true

[41] කොවිඩ්-19 සහ වසංගතයක් අතරතුර පාර්ලිමේන්තුවේ කාර්යභාරය, 2020 මාර්තු 24, පර්ල් ඇමරිකාස් http://parlamericas.org/uploads/documents/COVID19_and_Role_of_Parliaments_ENG.pdf

## අයිතිවාසිකම්

ප්‍රධාන කරුණු:

- උද්ඝෝෂණ හෝ සෞඛ්‍ය රෙගුලාසි උල්ලංඝණය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් අයට එරෙහිව සිදු වූ පොලිස් අපයෝජන/අත්අඩංගුවේදී සිදු වූ මරණ සිදුවීම් වැඩි වීම
- 'ව්‍යාජ පුවත්' වලට එරෙහිව නීති මගින් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස මර්දනය කිරීම
- කොවිඩ් බලපෑමට ලක් වූ මියගිය අයගේ මෘත දේහ භූමදානය සම්බන්ධයෙන් සුළුතර මුස්ලිම්වරුන්ට වෙනස් කොට සැලකීමේ ප්‍රතිපත්තිය
- සෞඛ්‍ය ආරක්ෂිත නොවන තත්ත්වයන්, අඩු වැටුප් ලබන්නන්, සංක්‍රමණික සේවකයන් සහ සිරකරුවන් ආදී ක්ෂේත්‍රයන්ට ප්‍රමුඛත්වය දැක්වීමේ දී පැවති අඩු ලුහුඬුකම්
- වසංගතය තුළ කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ගෘහස්ථ හිංසනය වැඩි වීම

### පොලිස් අපචාර

කොවිඩ්-19 අර්බුදයේ පසුබිම සම්බන්ධයෙන් ගත් කල, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම, වධහිංසා පැමිණවීම සහ අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා අනවශ්‍ය ලෙස බලය යෙදවීම පිළිබඳ චෝදනා ඇතුළුව මෑත කාලීන පොලිස් අපයෝජනයන් පිළිබඳ මාධ්‍ය වාර්තා එකී තත්ත්වයන් සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කිරීමට හේතු වී තිබේ.[42] 2020 ජූනි මාසයේදී බ්ලැක් ලයිව්ස් මැටර් (Black Lives Matter) සහයෝගිතා විරෝධතාවයේදී විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීමේදී පොලිස් නිලධාරීන් විසින් භාවිතා කරන ලද අනවශ්‍ය ප්‍රමාණයට බලය භාවිත කෙරෙන ප්‍රදර්ශනය කරන වීඩියෝ දර්ශන හේතුවෙන් පොලිසියේ හැසිරීම[43] විවේචනයට ලක් විය.[44]

නිරෝධායන රෙගුලාසි උල්ලංඝණය කිරීම සහ අනවශ්‍ය ප්‍රමාණයට බලය භාවිත කෙරෙන සහ නිරෝධායන රෙගුලාසි බලාත්මක කිරීම සම්බන්ධයෙන් අනිසි අත් අඩංගුවට පත් වූවන් අත්අඩංගුවේ පසුවන විට සිදු වූ මරණ පිළිබඳ වාර්තා ද දැඩි කනස්සල්ලට හේතු වී ඇත.[45] තම පවුලට ආහාර සොයා යමින් සිටි පුද්ගලයෙකුට පොලිසිය විසින් පහර දී මහමග දමා ගොස් ඇති අතර, එහිදී ඔහු පසුකර ගිය බස් රථයකට යටවී මියයාමේ සිද්ධියක් මෙම වාර්තාවලට ඇතුළත් වේ. සිද්ධියට සම්බන්ධ පොලිස් භටයන් දෙදෙනෙක් සහ තවත් දෙදෙනෙක් පසුව අත්අඩංගුවට ගනු ලැබූහ.[46] වඩාත් මෑතක දී මුල්ලිවයික්කාල් මාර්ග පුවරුවක ඡායාරූපයක් ගැනීම නිසා මාධ්‍යවේදී විශ්වලිංගම් විශ්වචන්ද්‍රන්ට පහර දුන් ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන් හතර දෙනෙකු පිළිබඳ වාර්තා පළ විය.[47]

---

[42] ශ්‍රී ලංකාව: කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ පොලිස් විසින් කෙරෙන අයථා කටයුතු වල වැඩිවීමක්, 2021 අගෝස්තු 6, හියුමන් රයිට්ස් වොච් https://www.hrw.org/news/2021/08/06/sri-lanka-police-abuses-surge-amid-covid-19-pandemic

[43] පසුගියදා පැවති විරෝධතා තහනම් කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් අසේල ගුණවර්ධන සහ පොලිස්පති චන්ද්‍රන වික්‍රමරත්න වෙත ලිපියක් යොමු කරමින් ශ්‍රී ලංකා නීතීඥ සංගමය (BASL) විසින් සෞඛ්‍ය රෙගුලාසි උල්ලංඝනය කිරීමේ තත්ත්වයක් ඇති බව පෙන්වා දෙමින් ඒ සම්බන්ධයෙන් විරෝධතාකරුවන් අත්අඩංගුවට ගැනීමේ දී පොලීසියේ අධික ලෙස බලය යෙදවීම සහ සීමාව ඉක්මවූ දැඩි හැසිරීම සම්බන්ධයෙන් දැඩි කනස්සල්ල පළ කළේය. 'අත් අඩංගුවට ගැනීම සහ සාමකාමී විරෝධතාකරුවන්ව බලහත්කාරයෙන් නිරෝධායනය කිරීම ශ්‍රී ලංකා නීතීඥ සංගමය (BASL) විසින් හෙළා දකියි' 2021 ජූලි 10 වැනි දින, කළම්බු ටෙලිග්‍රාෆ් බලන්න. https://www.colombotelegraph.com/index.php/basl-condemns-arrest-and-forced-quarantining-of-peac eful-protesters/

[44] මීරා ශ්‍රීනිවාසන්, 'ශ්‍රී ලංකාවේ 'පොලිස් ම්ලේච්ඡත්වය' පිළිබඳ කනස්සල්ල', 2020 ජූනි 10, ද හින්දු. https://www.thehindu.com/news/international/concern-over-police-brutality-in-sri-lanka/article31798486.ece

[45] මීට අමතරව, මෙකී චෝදනා හමුවේ ස්කොට්ලන්ත පොලිසිය ශ්‍රී ලංකාවේ පොලිස් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අත්හිටුවන ලදි. අපයෝජන බිය නිසා ශ්‍රී ලංකාවේ පොලිස් පුහුණුව නතර වෙයි, 2021 නොවැම්බර් 27 වැනි දින, ඩේවිඩ් ලීස්ක්, ද ටයිම්ස් බලන්න. https://www.thetimes.co.uk/article/police-training-in-sri-lanka-halted-over-abuse-fears-3w87qk9rp

[46] 'තම පවුලට ආහාර සොයා ගිය මිනිසෙක් පහර දී මරා දැමුවේය', 2021 මැයි 28, බැසිල් ප්‍රනාන්දු, කලම්බු ටෙලිග්‍රාෆ්. https://www.colombotelegraph.com/index.php/a-man-who-went-in-search-for-food-for-his-family-beaten-killed/

[47] 'ශ්‍රී ලංකා සොල්දාදුවන් දෙමළ මාධ්‍යවේදියාට කටු කම්බිවලින් පහර දෙයි', 2021 නොවැම්බර් 27, ටැමිල් ගාඩියන්. https://www.tamilguardian.com/content/sri-lankan-soldiers-attack-tamil-journalist-barbed-wire

වර්ෂ 2021 ජනවාරි මාසයේදී, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් මිෂෙල් බැච්ලෙට් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට ඉදිරිපත් කල ස්වකීය වාර්තාවේ ලියා ඇත්තේ ''නීතිය හා සාමය සහ මත්ද්‍රව්‍ය පාලනය සඳහා හමුදාකරණ ප්‍රවේශයක්'' ඇති පසුබිමක් ''මෑතකදී පොලිස් අත්අඩංගුවේ දී සිදු වූ මරණ ගණනාවක් සහ අපරාධ කල්ලි සමග පොලිස් ගැටුම්කාරී තත්ත්වයන් පැවති සන්දර්භය'' තුළ ඇය කනස්සල්ලට පත්ව සිටින බවයි. වර්ෂ 2020 ජුනි සහ ඔක්තෝබර් අතර ශ්‍රී ලංකා පොලිසිය සම්බන්ධ නීති විරෝධී ඝාතන පහක් එකී වාර්තාවෙන් ඉස්මතු කර ඇත.[48]

මෑත කාලීනව සිදු වූ පොලිස් අපයෝජන සිදුවීම් පිළිබඳව අදහස් දක්වමින් හියුමන් රයිට්ස් වොච් (HRW) සංවිධානය ද ප්‍රකාශ කර ඇත්තේ රජය විසින් "පොලිසිය පිළිබඳ ස්වාධීන අධීක්ෂණය යථා තත්ත්වයට පත් කළ යුතු අතර, පොලිස් අපයෝජනයන් අර්ථවත් ලෙස විමර්ශනය කර නඩු පැවරිය යුතු" බවයි.[49]

## මර්දනය

වර්ෂ 2020 අප්‍රේල් 1 වැනි දින වැඩ බලන පොලිස්පති සී. ඩී. වික්‍රමරත්න රාජ්‍ය නිලධාරීන් විවේචනය කරමින් ඔවුන්ගේ රාජකාරියට බාධා වන අයුරින් සමාජ මාධ්‍ය ජාලාවල අදහස් පළකිරීම් සිදුකරන පුද්ගලයින්ට එරෙහිව නීතිමය පියවර ගන්නා ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) සහ සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන්ට උපදෙස් දෙන ලදී.[50]

එතැන් සිට, සමාජ මාධ්‍ය ඔස්සේ අසත්‍ය පුවත් ප්‍රචාරය කිරීම වැලැක්වීම සඳහා දණ්ඩ නීති සංග්‍රහයේ සහ අපරාධ නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන යොදාගෙන ඇත. "ජාතික ආරක්ෂාවට බලපාන සහ ප්‍රජාවන් අතර ප්‍රචණ්ඩත්වය අවුලුවන ප්‍රකාශ ඇතුළුව" අසත්‍ය ප්‍රවෘත්ති පතුරුවන පුද්ගලයින්ට වසර පහක සිර දඬුවමක් සහ දඩයකට යටත් කළ හැකිය.

වසංගත තත්ත්වය පාලනය කිරීම සම්බන්ධයෙන් රජයේ ක්‍රියා කලාපය විවේචනය කළ පුද්ගලයින් කිහිප දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

උද්ගත විය හැකි ඉන්ධන හිඟයක් පිළිබඳව මාධ්‍ය වෙත කළ ප්‍රකාශයක් හේතුවෙන්[51] වෘත්තීය සමිති සාමාජික ආනන්ද පාලිත අත්අඩංගුවට ගත් අතර පසුව කොළඹ අතිරේක මහේස්ත්‍රාත්වරයා විසින් ඔහුව ඇප මත මුදා හැරිණි. මහේස්ත්‍රාත්වරයා අවධාරණය කළේ සත්‍ය තොරතුරු මත පදනම්ව අදහස් ප්‍රකාශ කිරීම බන්ධනාගාර ගත කිරීමට කරුණක් නොවන බවයි.[52] වර්ෂ 2021 අගෝස්තු 26 දින විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකු ඇතුළු පස් දෙනෙකු ද සාවද්‍ය තොරතුරු හුවමාරු කරගත් බවට වන චෝදනාව මත අත්අඩංගුවට ගන්නා ලදී.[53]

''රාජ්‍ය නිලධාරීන්ව හෝ ප්‍රතිපත්ති විවේචනය කිරීම සම්බන්ධයෙන් ඕනෑම අත්අඩංගුවට ගැනීමක් ව්‍යවස්ථා විරෝධී බව'' ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මීට පෙර ප්‍රකාශ කර ඇති අතර එක්සත් ජාතීන්ගේ සංවිධානය ද ''අසත්‍ය තොරතුරු පැතිරීම නැවැත්වීමට ගන්නා ඕනෑම ක්‍රියාමාර්ගයක් අදාල ක්‍රියාවට සමානුපාතිකව පමණක් විය යුතු බව නැවත අවධාරණය කරන ලදී.''[54]

---

[48] 'බරපතල මානව හිමිකම් කඩකිරීම් නැවත උද්ගත වීම සඳහා ශ්‍රී ලංකාව නැතිගන්වනසුලු මාවතක ගමන් කරයි' - එක්සත් ජාතීන්ගේ වාර්තාව, 2021 ජනවාරි 27, මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) https://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=26695&LangID=E

[49] 'ශ්‍රී ලංකාව: කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ පොලිස් අයථා ක්‍රියාවන්ගේ වැඩිවීමක්, 2021 අගෝස්තු 6, හියුමන් රයිට්ස් වොච් https://www.hrw.org/news/2021/08/06/sri-lanka-police-abuses-surge-amid-covid-19-pandemic

[50] 'සමාජ මාධ්‍යවල රාජ්‍ය නිලධාරීන් විවේචනය කරන්නන්ට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග', 2020 අප්‍රේල් 1, ඩේලි මිරර්. https://www.dailymirror.lk/breaking_news/Strict-action-against-those-criticise-state-officials-on-social- media/108-186028

[51] 'ආනන්ද පාලිත ඇප මත නිදහස්, දිනිත රත්නායක සහ පමෝදි වරාවිට, 2021 අගෝස්තු 22, ද මෝර්නින්. https://www.themorning.lk/ananda-palitha-released-on-bail/

[52] සත්‍යය ප්‍රකාශ කිරීම රිමාන්ඩ් කිරීමට හේතුවක් නොවේ- මහේස්ත්‍රාත්වරයා, වෘත්තීය සමිති සාමාජිකයන් නිදහස් කරයි, 2021 අගෝස්තු 22, නිවුස් ෆස්ට්. https://www.newsfirst.lk/2021/08/22/expressing-the-truth-no-reason-to-remand-magistrate-releases-unionist/

[53] 'කොවිඩ්-19 සම්බන්ධයෙන් අසත්‍ය තොරතුරු බෙදා ගැනීම සම්බන්ධයෙන් පස් දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. 2020 අප්‍රේල් 2 වන දින, ඩේලි මිරර්, https://www.dailymirror.lk/breaking_news/Five-arrested-for-sharing-false-content-on-COVID-19/108-186120 . තවදුරටත් බලන්න, 'සාවද්‍ය තොරතුරු සාපරාධී වරදක් වශයෙන් හුවා දැක්වීම: ඒ සඳහා සුදුසු වෙලාව හෝ ස්ථානය නොවේ' 2021 මැයි 26, ගෙහාන් ගුණතිලක, ග්‍රවුන්ඩ් වීව්ස්. https://groundviews.org/2021/05/26/criminalising-disinformation-neither-the-time-nor-the-place/

[54] කොවිඩ්-19 සෞඛ්‍ය ප්‍රොටෝකෝල සුරක්ෂිතකරණය, අගෝස්තු 2021, ආසියානු කේන්ද්‍රය.

විරුද්ධ මත සහ රජය විවේචනය කිරීම පාලනය කිරීම සඳහා දණ්ඩ සම්බාධක භාවිතා කිරීම ඔස්සේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස කෙරෙහි බරපතල අගතිදායී ප්‍රතිවිපාක උද්ගත කරනු ලබයි. මෙම දඬුවම් වල සමානුපාතිකත්වය සම්බන්ධයෙන් ද කනස්සල්ල මතු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස හානිකර හෝ හුදෙක් කිසිදු අගතියක් නොමැති වැරදි තොරතුරු අතර වෙනස පිළිබඳ හඳුනාගැනීමේ රේඛාව බොඳ විය හැක.

## සුළුතර ප්‍රජාවන්ට දිගින් දිගටම වෙනස්කොට සැලකීම

වර්ෂ 2020 අප්‍රේල් 11 වැනි දිනැති අංක 2170/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලද රෙගුලාසි මගින් කොවිඩ්-19 හේතුවෙන් මියගිය හෝ ඒ හේතුවෙන් මියගිය බවට සැක කෙරෙන පුද්ගලයෙකුගේ මෘත දේහයක් ආදාහනය කිරීම අනිවාර්ය කර ඇත.[55] පසුව රජය විසින් මෙම මතභේදාත්මක රෙගුලාසිය සංශෝධනය කරන ලද්දේ[56] ඒ සම්බන්ධයෙන් පැවති විරෝධතාවයන් සහ ජාත්‍යන්තර වශයෙන් පැවති බලපෑම හේතුවෙන්ය.[57] පසුව භූමදාන කටයුතු සඳහා භාවිත කළහැකි ස්ථානය ලෙස මන්නාරම් මුහුදු බොක්කෙහි පිහිටි ඉරණතිව් දූපත නම් කරන ලදී. එය කොළඹ සිට කිලෝමීටර් 300ක් (සැතපුම් 186ක්) පමණ දුරින් පිහිටා ඇති අතර, එකී ප්‍රදේශයෙහි අඩු ජනාකීර්ණභාවය හේතුවෙන් මෙකී භූමදාන කටයුතු සඳහා තෝරාගෙන ඇත.[58]

කෙසේ නමුත්, ඇතැම් මුස්ලිම් සහ ක්‍රිස්තියානි නායකයින් ආණ්ඩුවේ මෙම අලුත් පියවරට සෘණාත්මක ප්‍රතිචාර දක්වා ඇත. ඒ මන්ද යත් එකී පියවර එය එම ප්‍රදේශවල වෙසෙන දෙමළ ජනතාවට එරෙහිව මුස්ලිම් ජනතාව යොමු කිරීමේ එක් ආකාරයක් බවට කනස්සල්ලක් පවතී. 90 දශකයේ මුල් භාගයේ සිවිල් යුද්ධය හේතුවෙන් අවතැන් වී වර්ෂ 2018 දී නැවත පැමිණි දෙමළ ජාතිකයින් 250 ක් පමණ එම දූපතේ සිටින බව වාර්තා වේ.[59]

ආදාහනය අනිවාර්ය කිරීමේ වෙනස් කොට සැලකීමේ ප්‍රතිපත්තිය වෙනස් කරන ලද නමුදු, මෘත දේහයන් භූමදානය කිරීම සඳහා දුරස්ථ ප්‍රදේශයක් තෝරා ගැනීම හේතුවෙන් පවුලේ අයට සහ මිතුරන්ට වැදගත් ආගමික සහ වෙනත් අවස්ථාවන් සඳහා සහභාගි වීමට සුසාන භූමියට ප්‍රවේශ වීම අපහසු වේ.

මෙම තත්ත්වයට අමතරව, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල සංචරණ සීමා කිරීම් ක්‍රියාත්මක කිරීමේදී හමුදාකරණය වැඩි වී තිබේ. උතුරේ සහ නැගෙනහිර ප්‍රදේශවල ඇඳිරි නීතිය/සංචරණ සීමාවන් උල්ලංඝනය කළ දෙමළ සිවිල් වැසියන්ට පොලිසිය සහ සොල්දාදුවන් විසින් එල්ල කරන ලද ප්‍රහාර පිළිබඳව පුළුල්ව හා වැඩි වැඩියෙන් වාර්තා වී ඇත.[60] වසංගතය පැතිරීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ මුවාවෙන් සුළු ජාතීන් නියෝජනය කරන ජන කොටස් වලට පොලිසිය සහ හමුදාව විසින් හිරිහැර කිරීම සම්බන්ධයෙන් කනස්සල්ල මෙමගින් ඉස්මතු කෙරේ.

---

https://www.hri.global/files/2021/08/18/HRI_Asia_Centre_-_Securitisation_FINA1.PDF

55 'නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි සහ මෙය ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට බලපාන ආකාරය පිළිබඳ ප්‍රශ්න සහ පිළිතුරු, 2021 නොවැම්බර් 6, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/q-and-a-on-regulations-issued-under-the-quarantine-and-prevention-of-dise ases-ordinance-how-this-impacts-the-covid-19-response-in-sri-lanka/ (ඇමුණුම V)

56 වැඩිදුර විස්තර සඳහා 'නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි සහ මෙය ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමට බලපාන ආකාරය පිළිබඳ ප්‍රශ්න සහ පිළිතුරු, 2021 නොවැම්බර් 6, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, බලන්න.
https://www.cpalanka.org/q-and-a-on-regulations-issued-under-the-quarantine-and-prevention-of-dise ases-ordinance-how-this-impacts-the-covid-19-response-in-sri-lanka/ (ඇමුණුම IV) සහ
වැඩි විස්තර සඳහා, 'ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වයට පිළියම් කිරීම සඳහා වන නෛතික රාමුව පිළිබඳ දැනුවත් කිරීම, 2021 මැයි 12, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, බලන්න.https://www.cpalanka.org/an-update-on-the-legal-framework-to-address-the-covid-19-pandemic-in-sri-lanka/ (ඇමුණුම V)

57 කොවිඩ්-19: ශ්‍රී ලංකාව විසින භූමදාන කටයුතු සඳහා දුරස්ථ දූපතක් තෝරා ගනී, 2021 මාර්තු 2, බීබීසී.
https://www.bbc.com/news/world-asia-56249805

58 ඉහත එම

59 ඉහත එම

60 සුභාෂ් සෝමචන්ද්‍රන්, කොවිඩ්-19: යුද්ධයෙන් විනාශ වූ උතුරු ශ්‍රී ලංකාවේ හමුදාව මර්දනය වැඩි කරයි, 2020 මැයි 16, ලෝක සමාජවාදී වෙබ් අඩවිය.
https://www.wsws.org/en/articles/2020/05/16/nort-m16.html

## අවදානමට ලක්විය හැකි ජනගහන සහ ප්‍රජාවන් සහ ව්‍යුහාත්මක අසමානතාවයන්හි බලපෑම

වසංගතයේ බලපෑම සහ එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාජයේ විශේෂයෙන් අවදානමට ලක්විය හැකි සහ අවාසි සහගත කොටස් කෙරෙහි ඇති වන ආර්ථික බිඳවැටීම කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.[61] මෙම කොටස්වලට අඩු වැටුප් ලබන්නන්, නිදහස් වෙළඳ කලාප (FTZ) කම්කරුවන්, සංක්‍රමණික කම්කරුවන් සහ වතු ප්‍රජාව ඇතුළත් වේ. සෞඛ්‍ය අර්බුදය මධ්‍යයේ කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ප්‍රදේශවල සිටින අඩු වැටුප් සහ නිශ්පාදනය කරනු ලබන අයිතම මත පදනම්ව සේවා කටයුතු කරන ඇඟලුම් සේවිකාවන් අයහපත් සහ ජනාකීර්ණ ජීවන තත්වයන්ගෙන් පීඩා විඳිති. නිරෝධායන ක්‍රියාවලීන්හිදී ඇඟලුම් කම්හල් සේවකයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී හමුදාව විසින් වෙනස් කොට සැලකීම කරන ලද අවස්ථාවන් ද පෙනෙන්නට තිබුණි. වර්ෂ 2020 ඔක්තෝම්බර් මාසයේදී, එවැනි සේවකයින්ගේ නියෝජිතයින් විසින් කුරිරු, අමානුෂික සහ අවමන් සහගත සැලකිල්ලක් දක්වන බවට පැමිණිල්ලක් මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී.[62] වඩාත් මෑතක දී වර්ෂ 2021 දෙසැම්බර් මාසයේ, සමකාලීන වහල් ක්‍රම පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරු ඔහුගේ ප්‍රකාශයේ ඇඟලුම් සේවකයින්ගේ සහ සංක්‍රමණික සේවකයින්ගේ අවදානම් තත්ත්වය සම්බන්ධයෙන් අවධාරණය කරන ලදී.[63]

කෙසේ වෙතත්, වර්ෂ 2021 මැයි 21 සිට පනවන ලද රට වසා දැමීම අතරතුර, ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් ඇඟලුම් කම්හල් විවෘතව තබන ලෙස නියෝග කළේය. වෘත්තීය සමිති සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කර්මාන්තශාලාවල මෙන්ම බොහෝ කම්කරුවන් වෙසෙන තදබදයෙන් යුත් තාවකාලික නවාතැන් පහසුකම් ලබාදෙන නිවාසවල වෛරස් පැතිරීම් ගණනාවක් වාර්තා කර ඇති අතර නිෂ්පාදන මට්ටම් පවත්වා ගැනීම සඳහා සේවා යෝජකයන් විසින් අඩු පරීක්ෂණ ප්‍රමාණයක් සහ ඒවා සම්බන්ධයෙන් අඩු වාර්තාවන් ප්‍රමාණයක් ඉදිරිපත් කරන බවට චෝදනා කළහ.[64]

බන්ධනාගාරවල සහ රැඳවුම් මධ්‍යස්ථානවල තදබදය සහ අපිරිසිදු ජීවන තත්ත්වයන් ද බන්ධනාගාර තුළ වෛරසය වේගයෙන් ව්‍යාප්ත වීමට හේතු වී තිබේ. ගම්පහ දිස්ත්‍රික්කයේ මහර බන්ධනාගාරය, මහනුවර බෝගම්බර බන්ධනාගාරය සහ අනුරාධපුර බන්ධනාගාරය තුළ ඇති වූ විරෝධතා හේතුවෙන් ආරක්ෂක අංශ විසින් රැඳවියන්ට ප්‍රහාර එල්ල කිරීමට කටයුතු කෙරුණි. මෙම තත්ත්වය හේතුවෙන් පිළිවෙළින් සිරකරුවන් එකොළොස් දෙනෙකු, එක් අයෙකු සහ දෙදෙනෙකු මිය යාම මෙන්ම පුද්ගලයන් 100 කට වැඩි පිරිසක් තුවාල ලැබීමද සමඟින් අවසන් විය.[65]

---

[61] ශ්‍රී ලංකාවේ රට හදන සෞභාග්‍යයේ දැක්මඃ ලබාදුන් පොරොන්දු සහ වර්තමාන ප්‍රවණතා පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක්, 2021 ජූලි 13, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/sri-lankas-vistas-of-prosperity-and-splendour-a-critique-of-promises-made-and-present-trends/

[62] ශ්‍රී ලංකාවඃ නිරෝධායනය කරනු ලැබ ඇති නිදහස් වෙළඳ කළාප සේවකයන් සම්බන්ධයෙන් කෲර, අමානුෂික සහ අවමන් සහගත සැලකීම සම්බන්ධයෙන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වාට එරෙහිව පැමිණිල්ලක්' 2020 ඔක්තෝම්බර් 17 වන දින, ශ්‍රී ලංකා බ්‍රීෆ්. https://srilankabrief.org/sri-lanka-a-complaint-logged-against-general-shavendra-silva-for-cruel-inhumane-degrading-treatment-in-quarantining-ftz-workers/

[63] 'සමකාලීන වහල් ක්‍රම සහ ඒවාට හේතු හා ප්‍රතිවිපාක පිළිබඳ විශේෂ වාර්තාකරුගේ ශ්‍රී ලංකා සංචාරයේ මෙහෙවර අවසන් කිරීමේ ප්‍රකාශය' (2021 නොවැම්බර් 26-දෙසැම්බර් 3) මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය. https://www.ohchr.org/EN/NewsEvents/Pages/DisplayNews.aspx?NewsID=27895&LangID=E

[64] 'ශ්‍රී ලංකාවඃවසංගතය අතරතුර ඇඟලුම් කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න', 2021 ජූලි 12, හියුමන් රයිට්ස් වොච්. https://www.hrw.org/news/2021/07/12/sri-lanka-protect-garment-workers-rights-during-pandemic

[65] 'ශ්‍රී ලංකාවඃවසංගතය අතරතුර ඇඟලුම් කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්න', 2021 ජූලි 12, හියුමන් රයිට්ස් වොච්. https://www.hrw.org/news/2021/07/12/sri-lanka-protect-garment-workers-rights-during-pandemic

නිදහස් වෙළඳ කලාපයේ කම්කරුවන්[66] සහ රැඳෙවියන්[67] එන්නත් කිරීමට මෑතක දී ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, මෙම ප්‍රජාවන් අතර තවදුරටත් කොවිඩ්-19 පැතිරීම වැළැක්වීම සඳහා ප්‍රමුඛත්වය දීමේ සහ ක්‍රියාත්මක කිරීමේ වැඩපිළිවෙලෙහි අඩු ලුහුඬුකම් සම්බන්ධයෙන් පිළියම් යෙදීම අවශ්‍ය වේ.

කොවිඩ් වසංගතයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සම්බන්ධයෙන් වන බලපෑම රජය විසින් ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය කර නැත. වසංගතය ආරම්භයේ සිටම, කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට එරෙහි ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, "වායා වසංගතයකට" තුඩු දෙන මට්ටමට ප්‍රචණ්ඩත්වය තීව්‍ර කිරීම පිළිබඳ දත්ත සහ වාර්තා ලොව පුරා මතු වී තිබෙන අතර ශ්‍රී ලංකාවේ තත්ත්වය ද ඊට නොදෙවෙනිය.[68] කාන්තාවන් තමන්ට හානිදායක වැරදි සිදු කරනු ලබන අපරාධකරුවන් සමඟම ස්වකීය නිවෙස් වල සිරවී සිටීම, රැකියා අහිමිවීම්, මූල්‍ය දුෂ්කරතා සහ වෙනත් හේතු නිසා ඇතිවන විවිධ හේතූන් නිසා රට වසා දැමීමේදී ගෘහස්ථ හිංසන සිදුවීම් සංඛ්‍යාවේ වැඩි වීමක් පිළිබඳ වාර්තා මතු විය.[69]

වසංගතය සහ සංචරණ සීමා හේතුවෙන් ගමනාගමනයට ඇති බාධාවන් මත බලධාරීන්ට පැමිණිලි කිරීමේ සහ ආධාරක ජාල වෙත ප්‍රවේශ වීමේ දුෂ්කරතා ද නිර්මාණය කර ඇත.[70] එබැවින් වසංගත සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීම කොවිඩ්-19 සෞඛ්‍ය අර්බුදයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ බලපෑම සම්බන්ධයෙන් නිසි අවබෝධයක් ලබා ගත යුතු අතර, කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය වැළැක්වීමට සම්බන්ධ පවතින නීතිමය රාමුව සහ ආයතන ශක්තිමත් කළ යුතුය.

## වගවීම සහ පාලනය

ප්‍රධාන කරුණු:

- ඉටුකම අරමුදල සම්බන්ධයෙන් විනිවිදභාවය සහ වගවීම පිළිබඳ ගැටලු
- එන්නත් සම්බන්ධ ප්‍රසම්පාදනයේ දී ප්‍රමාදය, විනිවිදභාවය නොමැතිකම සහ වැරදි කළමනාකරණය
- ජාතික ඖෂධ නියාමන අධිකාරියට (NMRA) ඇති අනිසි බලපෑම්
- එන්නත් නිකුත් කිරීමේදී අවදානම් ප්‍රමුඛතාවය පිළිබඳ ගැටලුකාරී තත්ත්වයන්

66 කාංචනා රුවන්පුර, සමන්ති ගුණවර්ධන, සහ බුද්ධිමා පද්මසිරි, එන්නත් පිළිබඳ විෂමතාවය සහ ඇඟලුම් අංශයේ සේවකයන් සඳහා වන පිරිවැය, 2021 මැයි 22, ග්‍රවුන්ඩ් විව්ස්. https://groundviews.org/2021/05/22/vaccine-inequality-and-the-cost-to-garment-sector-workers/

67 දිලිනි මධුශංකි, කොවිඩ්-19 ට එරෙහිව බන්ධනාගාර රැඳවියන් එන්නත් කිරීම අද ආරම්භ වේ', 2021 අගෝස්තු 5, සිලෝන් ටුඩේ.
https://ceylontoday.lk/news/vaccination-of-prison-inmates-against-covid-19-begins-today

68 'වසංගත සෙවනැල්ල: කොවිඩ්-19 අතරතුර කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය' එක්සත් ජාතීන්ගේ කාන්තාවන් (UNWomen)
https://www.unwomen.org/en/news/in-focus/in-focus-gender-equality-in-covid-19-response/violence-against-women-during-covid-19

69 මිනෝන් ගමගේ සහ රොෂෙල් තුම්මෝදර, 'ලොක්ඩවුන් සමයේදී ශ්‍රී ලංකාවේ කාන්තාවන් මුහුණ දෙන ඉහළ යන ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය පිළිබඳ අධ්‍යයනයක්' 2021 මාර්තු 12 වැනි දින, කලම්බු ටෙලිග්‍රාෆ්.
https://www.colombotelegraph.com/index.php/a-study-on-the-rise-of-domestic-violence-against-wom
en-in-sri-lanka-during-the-lockdown/

70 පියුමි ෆොන්සේකා, 'වසංගතය ආශ්‍රිත ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය: වින්දිතයින්ට අවශ්‍ය උපකාර බොහෝ විට නොලැබේ', 2021 ජූනි 11, ඩේලි මිරර්. https://www.dailymirror.lk/news-features/Pandemic-related-Domestic-Violence%3A-Victims-don%E2%80%99t-often-get-the-desired-help/131-213849

## ඉටුකම අරමුදලේ අක්‍රමිකතා

වර්ෂ 2020 මාර්තු 23 වන දින, ''රට තුළ කොවිඩ්-19 වෛරසය පැතිරීම පාලනය කිරීම ඉලක්ක කර ගනිමින් එකී වැඩපිළිවෙල ශක්තිමත් කිරීම සහ ඊට අදාළ සමාජ සුබසාධන වැඩසටහන් ශක්තිමත් කිරීම සඳහා" "ඉටුකම කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල'' ජනාධිපතිවරයා විසින් පිහිටුවන ලදී.[71]

ජනාධිපති අරමුදලින් රුපියල් මිලියන 10 ක ආරම්භක පරිත්‍යාගයකින් එකී අරමුදල ස්ථාපිත කරන ලදී. මහජනතාව, දේශීය ආයතන කිහිපයක් මෙන්ම විදේශගත ශ්‍රී ලාංකිකයින් ද මෙම අරමුදලට පරිත්‍යාග ලබා දෙන ලදී.[72]

ඉටුකම අරමුදල පිළිබඳ මහජන නිරීක්ෂණයට ප්‍රතිචාර වශයෙන්, ජනාධිපති මාධ්‍ය අංශය (PMD) විසින් එකී අරමුදල පිහිටුවීමේ සිට එහි ආදායම් සහ වියදම් සඳහන් කරමින් නිවේදනයක් නිකුත් කළේය. එකී ප්‍රකාශයට අනුව, වර්ෂ 2021 මැයි වන විට එම අරමුදලෙන් 23%ක් පමණක් භාවිතා කර ඇත. අරමුදලේ ඉතිරි මුදල එන්නත් කිරීමේ මෙහෙයුම සඳහා වැය කිරීමට බලාපොරොත්තු වේ.[73]

ජාතික විගණන කාර්යාලයේ (NAO) නියෝජ්‍ය විගණකාධිපතිවරයා ප්‍රකාශ කළේ එය වෙනම පනතක් යටතේ පාර්ලිමේන්තුවේ සම්මත කර නොමැති බැවින් එම අරමුදල සෘජුව විගණනය කිරීමට ජාතික විගණන කාර්යාලය වෙත ව්‍යවස්ථාපිත බලතල නොමැති බවයි. එනිසා වාර්ෂික ජනාධිපති ලේකම් කාර්යාලයේ විගණනයේදී අරමුදල විගණනය කිරීමට සිදුවේ.[74]

ජාතික විගණන කාර්යාලය විසින් ඉටුකම අරමුදලේ විගණනය ආරම්භ කර මීළඟ අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර එය අවසන් කරන බවද ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.[75] පාරදෘශ්‍යභාවය සහ වගවීම නොමැතිකම තිබියදීත්, දෙස් විදෙස් පරිත්‍යාගශීලීන් විසින් එම අරමුදලට පරිත්‍යාග කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.[76] වර්ෂ 2021 ඔක්තෝම්බර් මාසයේදී, සන්ඩේ ටයිම්ස් විසින් ගොනු කරන ලද තොරතුරු දැනගැනීමේ අයිතිය සම්බන්ධයෙන් වූ (RTI) ඉල්ලීමකින් හෙළි වූයේ අරමුදලේ රු. බිලියන 1.6 ක් භාවිතයට ගෙන නොමැති බවය. ඒ අනුව රු. මිලියන 189 කට වඩා යම් වැඩි ප්‍රමාණයක් පමණක් වර්ෂ 2021 සැප්තැම්බර් 21 දක්වා වන විට භාවිතා කර ඇත. තොරතුරු දැනගැනීමේ ඉල්ලීම යටතේ නිකුත් කර ඇති තොරතුරු ඔස්සේ වැඩිදුරටත් අනාවරණය වන්නේ රු. මිලියන 42.6 ක් PCR පරීක්ෂණ සඳහා වැය කර ඇති අතර රු. මිලියන 67.5 ක් "උද්දේශන වැඩසටහනක්" සඳහා වියදම් කරන ලද බවයි.

''සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන ලද'' බැවින් පෙරකී උද්දේශන වැඩසටහන් පිළිබඳ තොරතුරු ජනාධිපති කාර්යාලය සතුව නොතිබූ බව වාර්තා වේ. අමතර රු. මිලියන 38ක් පුද්ගලයින් නිරෝධායන මධ්‍යස්ථාන වෙත රැගෙන යාමට ප්‍රවාහන පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් සිදුකර ඇති වියදම ලෙස පෙන්වා දීඇත.[77]

---

71 'රජය වැය කළේ ඉටුකම කොවිඩ්-19 අරමුදල් ශේෂයෙන් 6%ක් පමණයි' 2021 මැයි 5 වැනි දින PublicFinance.lk https://publicfinance.lk/en/topics/The-government-spent-only-6-of-the-Itukama-COVID-19-fund-balance-1620900512

72 ඉටුකම කොවිඩ්-19 අරමුදල: සෘජුව විගණනය කළ නොහැක: විගණකාධිපති දෙපාර්තමේන්තුව, මහීෂා මුදුගමුව 2021 මැයි 23, ද මෝර්නින් https://www.themorning.lk/itukama-covid-19-fund-cannot-be-directly-audited-auditor-general-department/

73 ඉහත එම.

74 ඉහත එම.

75 ප්‍රදීප් පීරිස් සංස්කරණය කළ *'ප්‍රතිකර්මයට වඩා රෝගය භයානකද? ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2021) ප්‍රකාශනයෙහි භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ විසින් රචිත 'වසංගතයක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි සීඝ්‍ර පරිහානිය'.* https://www.cpalanka.org/wp-content/uploads/2021/08/06-Chapter-2.pdf

76 'ඉටුකම අරමුදල සඳහා ලංකා හොස්පිටල්ස් විසින් රුපියල් මිලියන 10 ක් පරිත්‍යාග කරයි' 2021 සැප්තැම්බර් 23 වන දින, ඩේලි නිවුස්. https://www.dailynews.lk/2021/09/23/local/260073/lanka-hospitals-plc-donates-rs10-million-%E2%80%98itukama%E2%80%99-fund

77 ඉතා ප්‍රසිද්ධියට පත් වූ කොවිඩ්-19 අරමුදල: බිලියන 1.6කට වඩා තවමත් භාවිත කර නැත, සඳුන් ජයවර්ධන, 2021 ඔක්තෝබර් 24, ද සන්ඩේ ටයිම්ස්. https://www.sundaytimes.lk/211024/news/highly-publicised-covid-19-fund-more-than-1-6bn-still-not- used-459654.html

## එන්නත් ප්‍රසම්පාදනය සම්බන්ධ වන අක්‍රමිකතා

රට තුළ එන්නත් කිරීමේ ව්‍යාපාරය අඛණ්ඩව ක්‍රියාත්මක වන බැවින්, එන්නත් ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් ප්‍රමාදයන්, වැරදි කළමනාකරණය සහ අනෙකුත් අක්‍රමිකතා ආදී වශයෙන් වූ ගැටලු දැඩි කනස්සල්ලට කරුණු බවට පත්වී ඇත. අවශ්‍ය ඕනෑම ක්‍රමයක් හරහා හදිසි ප්‍රසම්පාදන සිදු කිරීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හරහා රජයට අසාමාන්‍ය බලතල සපයයි. වර්ෂ 2020 අප්‍රේල් 9 වැනි දින ප්‍රකාශයට පත් කරන ලද මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයක විස්තර කර ඇති කොවිඩ්-19 ආශ්‍රිත ප්‍රසම්පාදනය පිළිබඳ දැනට පවතින මාර්ගෝපදේශ මගින් ''ඉතා හදිසි සහ සුවිශේෂී අවස්ථාවන්හිදී'' රුපියල් මිලියන 25 ට වැඩි ප්‍රසම්පාදන සඳහා ටෙන්ඩර් පටිපාටියෙන් බැහැර වීමට කැබිනට් මණ්ඩලයට බලය පවරා ඇති අතර රුපියල් මිලියන 25 ට වැඩි ප්‍රසම්පාදන කැබිනට් මණ්ඩලයට සෘජුවම අනුමත කළ හැකි ය.[78]

ඒ අනුව, රුපියල් මිලියන 25 ට වැඩි ප්‍රසම්පාදන කඩිනම් කිරීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුවක් [Standing Cabinet-Appointed Procurement Committee (SCAPC)] හෝ "සුදුසු" කමිටුවක් මත පදනම්ව විශ්වාසය තබා කටයුතු කළ හැකිය.[79]

ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) අනුමැතිය ද අවශ්‍ය වේ. එන්නතක් පෙර ඇණවුම් කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය අවශ්‍ය නොවන අතර, එන්නත ආනයනය කිරීමට පෙර අනුමැතිය අවශ්‍ය වේ.[80]

නියමිත වේලාවට එන්නත් ලබා ගැනීමට අවශ්‍ය පරිදි එන්නත් කලින් ඇණවුම් කිරීමට සහ මිල දී ගැනීමට රජයට මුලදී නොහැකි විය. ඇණවුමක් කිරීමට පෙර ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය අපේක්ෂාවෙන් රජය සිටි බැවින්, ඉන්දියාවේ සේරුම් ආයතනයෙන් (Serum Institute) කොවිෂීල්ඩ් (Covishield) එන්නත් සඳහා කල්තියා පූර්ව-ඇණවුම් කිරීමක් සිදු නොවීය.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ (SPC) කාර්ය පටිපාටිකමය ගැටළු සහ වැරදි කළමනාකරණය එය තවදුරටත් ප්‍රමාද වීමට හේතු විය. ජාතික ඖෂධ නියාමන අධිකාරිය කෙරෙහි ඇති අනිසි බලපෑම් ද මේ අන්දමේ අක්‍රමිකතාවලට හේතු විය. සේරුම් ආයතනයෙහි ඇති වූ ගින්නක් හේතුවෙන් නිෂ්පාදන ගැටළු වලට මුහුණ දීමට පටන් ගත් දා සිට සහ වර්ෂ 2021 මාර්තු මස මුලදී ඉන්දියාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වය විශාල වශයෙන් පැතිරීම සම්බන්ධ ගැටළු හේතුවෙන් සේරුම් ආයතනයෙහි ප්‍රසම්පාදනය අත්හිටුවීමට සිදු විය. මෙම තත්ත්වයන් රජය විසින් එන්නත් කලින් ඇණවුම් කිරීමට අසමත් වීම සම්බන්ධයෙන් වූ අවධානය වෙනතකට යොමු කිරීමට පහසු නිදහසට කරුණක් සපයන ලදී. මේ හේතුවෙන් පුද්ගලයන් 500,000 කට අධික පිරිසකට AstraZeneca දෙවන මාත්‍රාව ලබා ගැනීමේ ප්‍රමාදයක් ඇති විය.[81]

මීට අමතරව, එන්නත්වල විවිධ පිරිවැය සම්බන්ධයෙන් විනිවිදභාවයක් නොමැතිකම ද විවේචනයට හේතු විය.[82] නිදසුනක් ලෙස, Sinovac සඳහා වන චීන නිෂ්පාදකයා විසින්, එන්නතෙහි මාත්‍රාවක මිල හෙළි කිරීම ශ්‍රී ලංකාවේ දේශීය නියෝජිතයාට තහනම් කළ බව වාර්තා වේ. මෙම වසන් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝණය කිරීමක් විය හැකි බවට

[78] සේරම් ආයතනයේ දේශීය නියෝජිතයා නොසලකා කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ එන්නත් ප්‍රමාදයක් ඇති කිරීමට හේතු වූවේ ද?, 2021ජූනි 22, ඉකොනමි නෙක්ස්ට්. https://economynext.com/did-pushing-aside-serum-institutes-local-agent-cause-a-vaccination-delay-in-sri-lanka-83204/

'වර්ෂ 2006 ප්‍රසම්පාදනය මාර්ගෝපදේශ අත්පොත (භාණ්ඩ සහ වැඩ) සඳහා නිකුත් කරන ලද 35 අතිරේකය යටතේ කොවිඩ් 19 ආශ්‍රිත හදිසි අවස්ථා කඩිනමින් සිදුකරවීමට පහසුකම් සැලසීම සඳහා ප්‍රතිපාදන තවදුරටත් ලිහිල් කිරීම' යන චක්‍රලේඛය ද බලන්න - 2020 අප්‍රේල් 09 දිනැති PFD/PMD/149/000/ 2020-02 https://theleader.lk/images/Vaccine_2.pdf

[79] සේරුම් ආයතනයේ දේශීය නියෝජිතයා නොසලකා කටයුතු කිරීම ශ්‍රී ලංකාවේ එන්නත් ප්‍රමාදයක් ඇති කිරීමට හේතු වූවේ ද?, 2021ජූනි 22, ඉකොනමි නෙක්ස්ට්. https://economynext.com/did-pushing-aside-serum-institutes-local-agent-cause-a-vaccination-delay-in-sri-lanka-83204/

[80] ආචාර්ය ගෙහාන් ගුණතිලක, ජනාධිපතිවරයා විසින් ශ්‍රී ලංකාවේ එන්නත් ඛේදවාචකය ගැන සොයා බැලිය යුතුයි, 2021 අගෝස්තු 20, ඩේලි එෆ්ටී. https://www.ft.lk/opinion/President-must-probe-into-Sri-Lanka-s-vaccine-tragedy/14-721939

[81] ඉහත එම.

[82] ඉහත එම.

විචාරකයන්ගේ තර්කයත් සමඟ මහජන මුදල් යොදවා රජය විසින් මිලදී ගන්නා ලද එන්නතක මිල මහජනතාවට හෙළි කිරීමට ඇති අකැමැත්ත පිළිබඳව අවධානය යොමු විය.[83]

ඊට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාවේ චීන තානාපති කාර්යාලය, Sinovac එන්නත් නිෂ්පාදකයා සහ ශ්‍රී ලංකාව අතර ඇති දැඩි හෙළිදරව් නොකිරීමේ ගිවිසුම ආරක්ෂා කළ අතර, හෙළිදරව් නොකිරීමේ ගිවිසුම් (Non-Disclosure Agreements - NDAs) ඖෂධ සමාගම් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පොදු ලක්ෂණයක් වන බවත්, Sinopharm, Sinovac, Pfizer සහ Moderna ගැනුම්කරුවන් සමඟ ගනුදෙනු කිරීමේදී හෙළිදරව් නොකිරීමේ ගිවිසුම් කොන්දේසි පැනවීම සහ ඔවුන්ගේ ගනුදෙනුකරුවන් සමඟ කටයුතු කිරීමේ දී දඩ මුදල් නියම කරනු ලබන බවත් පෙන්වා දෙන ලදී.[84]

ප්‍රසම්පාදන ක්‍රියාවලිය, මාර්ගෝපදේශ, කාර්ය සාධක බලකායන් සහ ඒවායේ ක්‍රියාවන් පිළිබඳ පොදු ජනතාවට ප්‍රවේශ විය හැකි අන්දමට පවතින තොරතුරු ප්‍රමාණවත් නොවන අතර රාජ්‍ය මූල්‍ය හා ප්‍රසම්පාදන සම්බන්ධ විනිවිදභාවය සහ වගවීම පිළිබඳ ගැටලුකාරී තත්ත්වයක් උද්ගත කරනු ලබයි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා (TISL) විසින් Oxford Astrazeneca සහ අනෙකුත් අදාළ එන්නත් පිළිබඳ ප්‍රසම්පාදනය, එන්නත් සඳහා ප්‍රමුඛතාවය ලබන්නන් තෝරා ගැනීමේ නිර්ණායක ඇතුළුව සාමාන්‍ය ජනතාව සඳහා එන්නත් නිකුත් කිරීමේ සැලැස්ම සහ අදාළ එන්නත් සඳහා වෛද්‍ය අනුමැතියට අදාළ තොරතුරු සහ මෙම කරුණු පිළිබඳ නිවැරදි, කාලෝචිත සහ පුළුල් තොරතුරු සාමාන්‍ය ජනතාවට ලබා දෙන ලෙස රජයෙන් ඉල්ලා සිටිමින් එවැනි කරුණු සම්බන්ධයෙන් අදාළ බලධාරීන් වෙත තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම යටතේ ඉල්ලීම් කිහිපයක් යොමු කරන ලදී.[85]

## එන්නත් නිකුත් කිරීමේ වැඩසටහන සම්බන්ධ අක්‍රමිකතා

ශ්‍රී ලංකාව තුළ එන්නත් කිරීමේ වැඩසටහන වර්ෂ 2021 ජනවාරි 29 දින ආරම්භ විය. ආරම්භයේ සිටම අවදානම් ප්‍රමුඛතා නිර්ණායක සහ එකී වැඩපිළිවෙල දීප ව්‍යාප්තව සිදු කරනු ලබන අන්දම පිළිබඳ තොරතුරු නොමැතිකම සම්බන්ධයෙන් ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳ සැලකිල්ල යොමු කරනු ලැබීය.[86]

එන්නත් කිරීමේ ව්‍යාපාරයේ සැලසුම් කිරීම, ප්‍රමුඛත්වය දීම සහ අවදානම් තත්ත්වයන් සන්නිවේදනය කිරීම ආදී වශයෙන් වූ කරුණු පිළිබඳ ගැටළු කිහිපයක් ද පැහැදිලිව දක්නට ලැබුණි. මහජනතාව දැනුවත් කිරීම සඳහා මහජන ව්‍යාපාරයක් නොමැතිකම එන්නත් කිරීමේ වැඩපිළිවෙල වටා ඇති බිය සහ අවිනිශ්චිතතාවයට ද හේතු වී තිබුණි.[87]

දේශපාලන ඇඟිලි ගැසීම් සහ අනවශ්‍ය බලපෑම් පිළිබඳ චෝදනා මෙම වැඩසටහන ක්‍රියාත්මක ක්ෂේත්‍රයට පත් කිරීමේ ක්‍රියාවලියේදී ඉස්මතු විය.[88] එන්නත් කිරීමේ ව්‍යාපාරයේ කටයුතු සඳහා හමුදාව සම්බන්ධ වීම හමුදාකරණයේ පුලුල් ප්‍රවණතාවයේ තවත් පැතිකඩක් ලෙස විවේචන මතු කර ඇත.

---

[83] ඉහත එම.

[84] සිනොවැක් එන්නත් මිල හෙළිදරව් නොකිරීමට ශ්‍රී ලංකාව සමඟ ඇති ගිවිසුම චීන තානාපති කාර්යාලය විසින් ආරක්ෂා කරයි, 2021ජූනි 28, නිවුස් වයර්. https://www.newswire.lk/2021/06/28/chinese-embassy-defends-sinovac-vaccine-price-non-disclosureagreement-with-sri-lanka/

[85] 'කොවිඩ්-19 එන්නත් නිකුත් කිරීම පිළිබඳ ප්‍රධාන ගැටළු දෙකක් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා ආයතනය විසින් ඉස්මතු කරයි. ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා. 2021 පෙබරවාරි 2, https://www.tisrilanka.org/tisl-highlights-two-key-issues-on-covid-19-vaccine-rollout/

[86] වැඩි විස්තර සඳහා, 'ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වයට පිළියම් කිරීම සඳහා වන නෛතික රාමුව පිළිබඳ දැනුවත් කිරීම, 2021 මැයි 12, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, බලන්න. https://www.cpalanka.org/an-update-on-the-legal-framework-to-address-the-covid-19-pandemic-in-sri-lanka/ (ඇමුණුම V)

[87] ප්‍රදීප් පීරිස් සංස්කරණය කළ *'ප්‍රතිකර්මයට වඩා රෝගය භයානකද? ශ්‍රී ලංකාවේ කොවිඩ් ආණ්ඩුකරණය පිළිබඳ ආවර්ජනා (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 2021) ප්‍රකාශනයෙහි භවානි ෆොන්සේකා සහ කුෂ්මිලා රණසිංහ විසින් රචිත 'වසංගතයක් තුළ ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයෙහි සීඝ්‍ර පරිහානිය'.* https://www.cpalanka.org/wp-content/uploads/2021/08/06-Chapter-2.pdf

[88] ඉමේෂ් රණසිංහ, එන්නත් කිරීමේ අවුල: දේශපාලන බලපෑම්වලට යටවෙන්න එපා යැයි නිලධාරීන්ට රජය කියයි 2021 මාර්තු 9, ඉකොනමිනෙක්ස්ට්. https://economynext.com/the-vaccination-mess-government-tells-officials-dont-give-in-to-political-influence-79633/#modal-one

ශ්‍රී ලංකාවේ දැනට ක්‍රියාත්මක එන්නත් කිරීමේ ව්‍යාපාරය සාර්ථක එකක් ලෙස සලකනු ලැබුවද,[89] මාත්‍රාවන් අපතේ යෑම සහ අවදානම් ප්‍රමුඛතාවය උල්ලංඝනය කිරීම පිළිබඳ චෝදනා අවධානය යොමු කළ යුතු ප්‍රධාන පෙළේ ගැටළු අතර වේ.[90] එබැවින්, මෙම ක්‍රියාවලියේ විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම සඳහා අවැසි නායකත්වය, ඵලදායි තීරණ ගැනීම, සංවිධානය කිරීම සහ එන්නත් ලබාදීමේ වැඩපිළිවෙලට අදාළ තීරණ පිළිබඳ වගකීම් දරන්නන් කවුරුන්ද යන වග[91] ආදිය සම්බන්ධයෙන් ඵලදායී ලෙස මහජනතාවට සන්නිවේදනය කිරීම අත්‍යවශ්‍ය වේ.

---

[89] එන්නත් කිරීම: සාර්ථකත්වය සහතිකයි, 2021 සැප්තැම්බර් 12, සන්ඩේ ඔබ්සර්වර්. https://www.sundayobserver.lk/2021/09/12/vaccination-success-assured

[90] රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් එන්නත් කිරීමේ වැඩසටහනේ අක්‍රමිකතා පෙන්වා දෙමින් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් ඉල්ලයි, 2021 ජුනි 12, නිවුස්වයර්. https://www.newswire.lk/2021/06/12/gmoa-points-out-irregularities-in-covid-vaccination-program-demands-inquiry/; අරුන්දතී සංගක්කාර, ශ්‍රී ලංකාවේ එන්නත් සොරුන්, 2021 මැයි 20, කළම්බු ටෙලිග්‍රාෆ්. https://www.colombotelegraph.com/index.php/vaccine-thieves-of-sri-lanka/

[91] එන්නත ගැන කතා කරමු: උපායමාර්ග, නිශ්චිතභාවය සහ සමානාත්මතාවයේ අවශ්‍යතාවයි, 2021, නීතිය සහ සමාජ භාරය (LST). https://lstlanka.org/images/pdf/2021/Lets_talk_about_the_vaccine_English.pdf

## ඇමුණුම I

# ලුහුඬු මාර්ගෝපදේශ I

# කොවිඩ්-19 වසංගත පසුබිම තුළ ඉස්මතු වන නෛතිකමය ගැටළු

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
වර්ෂ 2020 මාර්තු 28 දින

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම ලුහුඬු මාර්ගෝපදේශය සකස් කරන ලද්දේ ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්ත වෙමින් පවතින කොවිඩ්-19 වසංගතයේ බලපෑම් ඇති සන්දර්භය තුළ ඉස්මතු වන නෛතිකමය ගැටලුකාරී තත්ත්වයන් ගණනාවක් සහ ඒවායෙහි ප්‍රතිවිපාකයන් පිළිබඳ පවතින තත්ත්වය පෙන්වා දීම උදෙසාය. කොවිඩ්-19 වසංගතයෙහි ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් පසුගිය සති කීපය තුළ කඩිනම් පියවර කිහිපයක් ගෙන තිබේ. වර්ෂ 2020 මාර්තු මස 02 වන දින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් පාර්ලිමේන්තුව විසුරවා හරින ලද පසුබිමක් තුළ මෙකී පියවරයන් ගැනීමට කටයුතු කර තිබේ. මෙකී කොවිඩ්-19 වෛරසයෙහි ව්‍යාප්තවීම මැඩපැවත්වීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරන්නා වූ සියලු පාර්ශවයන්ගේ කාර්ය කර්තව්‍යයන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පිළිගන්නා අතර, වර්තමානයේ පවතින හදිසි සෞඛ්‍ය තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමේ දී රාජ්‍ය පාලනය සහ අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැඩි වශයෙන් උද්ගත වන ගැටළුකාරී තත්ත්වයන් මෙම ලුහුඬු මාර්ගෝපදේශ සටහන මගින් පෙන්වා දෙනු ලැබේ. මෙම ලුහුඬු මාර්ගෝපදේශය හරහා ඉස්මතු කරනු ලබන කරුණු ඔස්සේ අපේක්ෂා කරනු ලබන්නේ අදාළ අධිකාරීත්වය ලත් ආයතනික ව්‍යුහයන් සමඟ යථාර්තවාදී අයුරින් එක්ව කටයුතු කර කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් ආණ්ඩුව විසින් ඉටුකරනු ලබන කාර්යයන් කාර්යක්ෂමව, නීත්‍යානුකූලව සහ ව්‍යවස්ථානුකූලව සිදු කිරීමට හැකිවන බව තහවුරු කිරීමයි. මෙම වෛරසය ව්‍යාප්ත වීම පාලනය කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී එකී සියලු ක්‍රියාමාර්ග නීතියේ ආධිපත්‍යයට අනුකූලව සිදුවන ආකාරයට සහ ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල වන අන්දමේ පාලන තත්ත්වයන්ට අනුගතව සිදුවන බවට සහතික වීමේ වැදගත්කම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අවධාරණය කරනු ලබයි.

<u>**විධායක සාරාංශය**</u>

මූලික වශයෙන්ම අවධානය යොමු කරනු ලබන්නේ පාර්ලිමේන්තු මහ මැතිවරණය කල් දැමීම සම්බන්ධයෙනි. කොවිඩ්-19 වසංගත තත්ත්වය පිළිබඳව හදිසි සෞඛ්‍ය තත්ත්වයක් ශ්‍රී ලංකාව තුළ උද්ගතව නොමැති අවස්ථාවක් වූ වර්ෂ 2020 මාර්තු 02 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට කටයුතු කරන ලදී. කෙසේ නමුත්, කොවිඩ්-19 වෛරසය ආසාදනය වුවන්ගේ සංඛ්‍යාව ඉහළ යාමත් සමඟම මැතිවරණය පැවැත්වීම කල් දැමීමේ තීරණය ගැනීමට පියවර ගන්නා ලදී. මෙහිදී විශේෂයෙන්ම සඳහන් කල යුතු කරුණ වන්නේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ ගැසට් නිවේදනය ආපසු කැඳවීමේ බලය සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ පාර්ලිමේන්තු මැතිවරණ පනත යටතේ කිසිදු බාධාවක් නොමැති බවයි.

වර්ෂ 2020 මාර්තු 19 වන දින මැතිවරණය සඳහා නාම යෝජනා භාරගැනීම නිම කිරීමත් සමඟම මැතිවරණ කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු මහ මැතිවරණය කල්දැමීමට තීරණය කරන ලදී. එවන් වූ පසුබිමක මැතිවරණය නැවත කෙදිනක පැවැත්වේද යන්න පිළිබඳව අවිනිශ්චිතභාවය ද සහිතව පාර්ලිමේන්තුව විසුරුවාහරින ලද තත්ත්වය එලෙසින්ම අඛණ්ඩව පවතී. මීට අමතරව, වර්ෂ 2020 මාර්තු මස 2 වන දින නිකුත් කල ගැසට් පත්‍රය ප්‍රකාරව ''නව පාර්ලිමේන්තුව වර්ෂ 2020 මැයි මස 14 වන දින රැස්වේ'' යැයි සඳහන් වුවද, එවන් දිනයක රැස්වීම සඳහා පාර්ලිමේන්තුවක් එදිනට පවතින්නේ නැති බවද මෙහිදී සඳහන් කළ යුතුය.

මෙම ලුහුඬු මාර්ගෝපදේශය ඔස්සේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සහ ඊට අනුශංගිකව පැනනගිනු ලබන සංකීර්ණ ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් වන තත්ත්වය විමසුමට ලක් කිරීමද සිදු කෙරේ. මැතිවරණය කල්දැමීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවටද ඉතා සීමිත වූ විකල්ප අවස්ථාවන් පැවති පසුබිමක වුවද එකී තීරණය මගින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් කෙරේ බලපෑමක් ඇති කර තිබේ. යම් හෙයකින් ජනාධිපතිවරයා විසින් වර්ෂ 2020 මාර්තු මස 02 වන දින

නිකුත් කළ ගැසට් නිවේදනය ආපසු කැඳවීමක් කිරීමට කටයුතු කරන ලද්දේ නම්, පැවැති පාර්ලිමේන්තුව වර්ෂ 2020 අගෝස්තු මස අවසානය දක්වා සක්‍රීයව පැවැතීමට හැකියාව තිබූ බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහිදී පෙන්වා දෙනු ලබයි.

ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොමැති සන්දර්භයක් තුළ උද්ගත වන්නා වූ අගතිදායක ප්‍රතිවිපාකයන් කීහිපයක් සම්බන්ධයෙන් මෙහිදී විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අවධානය යොමු කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව අනුව රාජ්‍ය මුදල් පාලනය සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ඇත්තේ පාර්ලිමේන්තුවට බව ශ්‍රේෂ්ඨාධිකරණය මඟින් ලබා දී ඇති තීන්දු ගණනාවක් හරහා ද අවධාරණය කර ඇත. ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොමැති කල්හි, විසර්ජන පනත් හරහා ජනාධිපතිවරයාට මුදල් වෙන් කිරීම් කටයුතු සම්බන්ධයෙන් ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි වචනාර්ථයෙන් සහ හරයාත්මක වශයෙන් තහවුරු කර ඇති සීමාවන් පිළිබඳ අවම අධීක්ෂණය ද නොමැති වීම ඇතුළුව බරපතල අහිතකර ප්‍රතිවිපාකයන් ගණනාවක්ම උද්ගත වේ. ඊට අමතර වශයෙන්, මෙතුලින් කිසිදු සංවරණ හා තුලන තත්ත්වයක් නොමැතිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් අපේක්ෂිත හරයාත්මක මූලධර්මයන්ට ද ප්‍රතිවිරුද්ධව රාජ්‍ය මුදල් සම්බන්ධයෙන් නියාමනය නොකල පාලන හැකියාව විධායකය වෙත ලබාදිය හැකි වේ. වර්තමානයේ පවතින හදිසි තත්ත්වයට නිසි පරිදි මුහුණ දීමේදී කාර්යක්ෂමතාවය මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූලභාවය ද තහවුරු කිරීම පිණිස අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සඳහා අනුමැතිය ලබා දීම පිණිස පාර්ලිමේන්තුව කඩිනමින් කැඳවීම අතිශයින්ම වැදගත් අවශ්‍යතාවයකි.

විවිධාකාර ව්‍යසන තත්ත්වයන් කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතුව දශක ගණනාවක අත්දැකීම් පැවැතියද, කොවිඩ්-19 වසංගත තත්ත්වය මඟින් මින් පෙර නොදුටුවිරූ අන්දමේ අභියෝගාත්මක තත්ත්වයක් පවතින්නේ ඒ සඳහා අවශ්‍ය කරන්නා වූ නව ව්‍යුහයන්ගේ අවශ්‍යතාවය ද ඉස්මතු කරමිනි. ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොමැති පසුබිමක මෙකී කාර්ය කර්තව්‍යයන් සිදු කරනු ලබන්නේ කවර ආකාරයකින්ද යන්න සම්බන්ධයෙන් ද ගැටළුකාරී තත්ත්වයක් පැන නගී. එමෙන්ම, පාර්ලිමේන්තුව කැඳවීමට කටයුතු නොකිරීම හේතුවෙන්, පවතින හදිසි තත්ත්වය කළමණාකරණය කිරීම සඳහා භාවිතා කළ හැකි යාන්ත්‍රණයන් ගණනාවක්ම ක්‍රියාවට නැංවීමේ හැකියාව ආණ්ඩුවට නොලැබී ඇති අතර එසේ නොවන්නට එකී යාන්ත්‍රණයන් භාවිත කිරීමේ ඉඩ ප්‍රස්ථාව රජයට පැවතුණි.

හදිසි තත්ත්වයන් සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේදී අතිශයින්ම වැදගත් කාර්යභාරයක් පාර්ලිමේන්තුව සතුව පවතින අතර ආණ්ඩුවේ විවිධ අංශයන් අදාළ හදිසි තත්ත්වයන්ට කාර්යක්ෂමව මුහුණ දෙන්නා සේම එකී කාර්ය කාර්තව්‍යයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියේ ආධිපත්‍යයට අනුකූලවද සිදුවන බව තහවුරු කිරීම ඉතා වැදගත් සාධකයකි. පවතින හදිසි තත්ත්වයට මුහුණ දීමේදී ශ්‍රී ලංකාව ස්වකීය ක්‍රියාමාර්ගයන් ඵලදායී ලෙසත් ස්ථිර වූ මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය රාමුව තුළ සිදු කෙරෙන බවත් තහවුරු කිරීම උදෙසා මෙම ලුහුඬු මාර්ගෝපදේශය මඟින් සවිස්තරාත්මකව සාකච්ඡාවට බඳුන් කෙරෙන මෙකී සෑම සියලු ප්‍රශ්නකාරී තත්ත්වයක් සම්බන්ධයෙන්ම කඩිනමින් අවධානය යොමු කල යුතු වේ. මේ සම්බන්ධයෙන් අකර්මණ්‍යව සිටීම සහ/හෝ ක්‍රියාත්මක වීම සම්බන්ධයෙන් ඇති නොකැමැත්ත හරහා දිගුකාලීනව බරපතල අහිතකර ප්‍රතිවිපාකයන්ට මුහුණ දීමට සිදුවනු ඇත.

**පසුබිම**

වර්ෂ 2020 මාර්තු මස 02 වන දින ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.[92] මෙකී ගැසට් නිවේදනය ප්‍රකාරව;

i) වර්ෂ 2020 මාර්තු 02 වන දින මධ්‍යම රාත්‍රී සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබේ;

ii) පාර්ලිමේන්තු මහ මැතිවරණය වර්ෂ 2020 අප්‍රේල් මස 25 වන දින පැවැත්වේ;

iii) වර්ෂ 2020 මාර්තු 12 වන දින සිට වර්ෂ 2020 මාර්තු 19 වන දින මධ්‍යාහන 12 වන තෙක් කාලය තුළ පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා නාම යෝජනාවන් භාර ගනු ලැබේ; සහ

iv) වර්ෂ 2020 මැයි මස 14 වන දින නව පාර්ලිමේන්තුව රැස්වේ.

වර්ෂ 2019 දෙසැම්බර් මස සිටම තමාට ලැබෙන පළමු අවස්ථාවේදීම, එනම් වර්ෂ 2015 අගෝස්තු මස තෝරාපත් කරගත් පාර්ලිමේන්තුවෙහි වසර පහක නිල කාල සීමාවෙන් වසර හතරක් සහ මාස හයක් සම්පූර්ණ කල පසුව එළැඹෙන දිනයේදී පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන බව ජනාධිපතිවරයාගේ ස්ථාවරය විය. ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවන ලද අවස්ථාව වන විට කොවිඩ්-19 වසංගත තත්ත්වය වූ කලී චීනය, යුරෝපය සහ නැගෙනහිර ආසියාකරයෙහි බොහෝ රටවල් වල වර්ධනය වෙමින් පැවැති අර්බුදයක්ව පැවති නමුදු ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 ආසාදිතයින් කිසිවෙකුත් නොසිටියේය.

ශ්‍රී ලාංකික පුරවැසියෙකු කොවිඩ්-19 ආසාදිතයකු බවට පත්වී ඇති බව මුලින්ම තහවුරු වුයේ වර්ෂ 2020 මාර්තු 11 වන දින වන අතර වර්ෂ 2020 මාර්තු 18 වන දින වන විට එකී ආසාදිත සංඛ්‍යාව 53 ක්[93] දක්වා වර්ධනය වී තිබුණි. මෙම කාල වකවානුව තුළදී සමහර දේශපාලන පක්ෂ සහ මැතිවරණ නිරීක්ෂණ ආයතන මඟින් මෙම වසංගත රෝගී තත්ත්වය තුළින් උද්ගතව ඇති තර්ජනාත්මක තත්ත්වය සමනය වන තෙක් මාස කීපයකට පාර්ලිමේන්තු මහ මැතිවරණය කල් දමන ලෙසට ඉල්ලීම් ඉදිරිපත් කරන ලදී.[94]

මීට අමතර වශයෙන්, වර්ෂ 2020 මාර්තු 16 වන දින රජයේ නිවාඩු දිනයක් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද අතර 17 සිට 19 වන දිනය තෙක් කාල පරාසය ''විශේෂිත නිවාඩු දින'' වශයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දේ සහ තවත් පියවරයන් කීපයක් ගන්නා ලද්දේ කොවිඩ්-19 වසංගත තත්ත්වය ව්‍යාප්ත වීම වැලැක්වීම උදෙසා ගන්නා ලද ක්‍රියාමාර්ගයන් වශයෙනි.[95] පාර්ලිමේන්තු මහ මැතිවරණය සම්බන්ධයෙන් වන ''හදිසි ක්‍රියාමාර්ගයන්'' සාකච්ඡා කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයින් ද මහජන සෞඛ්‍ය නිලධාරීන්ව හමුවී සාකච්ඡා කිරීමට පියවර ගන්නා ලදී.[96]

නාම යෝජනා භාරගැනීම වර්ෂ 2020 මාර්තු මස 19 වන දින අවසන් වීමත් සමගම පාර්ලිමේන්තු මහ මැතිවරණය කල් දමන බව මැතිවරණ කොමිසන් සභාව විසින් මාධ්‍යයට ප්‍රකාශ කරන ලදී.

---

[92] 2020 මාර්තු 02 වන දිනැති අංක 2165/8 දරන (අතිවිශේෂ) ගැසට් පත්‍රය http://documents.gov.lk/files/egz/2020/3/2165-08_S.pdf

[93] සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයෙහි වසංගත රෝග අංශය, කොරෝනා වෛරස් රෝගය (කොවිඩ්-19) පිළිබඳ වාර්තාව 2019. 2020.03.19, කොළඹ http://www.epid.gov.lk/web/images/pdf/corona_virus_report/sitrep-sl- en-19-03_10.pdf

[94] 'ජනතාවගේ ආරක්ෂාව 'ප්‍රමුඛතම ගැටළු' වේ, මැතිවරණය කල් දමන්න', දෙමළ ජාතික සංධානය, නිව්ස්වයර් http://www.newswire.lk/2020/03/16/safety-of-public-of-paramount-concern-postpone-election-tna/; '2020 පාර්ලිමේන්තු මහ මැතිවරණය කල් දමන ලෙසට මැතිවරණය ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය විසින් ඉල්ලා සිටී'. මැතිවරණය ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය https://cmev.org/2020/03/17/cmev-calls-for-postponement-of-general-election-2020/

[95] 'කොවිඩ්-19 පැතිරීම වලක්වාලීම උදෙසා තවදුරටත් තීරණයන් ගැනේ', ජනාධිපති මාධ්‍ය අංශය. http://www.pmdnews.lk/more- decision-to-contain-covid-19-outbreak/

[96] 'මැතිවරණ කොමිෂන් සභාව සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගතයුතු හදිසි පියවර සම්බන්ධයෙන් හෙට දින තීරණය කරනු ලබයි'. මංජුල ප්‍රනාන්දු, ද සන්ඩේ ඔබ්සර්වර්, කොළඹ http://www.sundayobserver.lk/2020/03/15/news/ec-health-ministry-decide-contingency-measures-tomorrow

## ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු මහ මැතිවරණය පිළිබඳ වර්තමාන තත්ත්වය

පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24(1) වගන්තිය යටතේ මැතිවරණ දිස්ත්‍රික්ක 22 සඳහා අපේක්ෂකයන් තරඟ වදිනු ලබන මැතිවරණ පවත්වනු ලබන බවට නිල වශයෙන් දැනුම් දෙමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී.[97]

කෙසේ නමුදු, ශ්‍රී ලංකාව තුළ පැතිරෙමින් පවතින කොවිඩ්-19 වසංගතයෙහි ව්‍යසන තත්ත්වය හේතුවෙන් අදාළ මැතිවරණ කොට්ඨාස 22 තුළ ඡන්ද විමසීම 2020 අප්‍රේල් මස 25 වන දින පැවැත්වීමට නොහැකි බව දක්වමින් වර්ෂ 2020 මාර්තු 21 දිනැති තවත් ගැසට් පත්‍රයක් මඟින් මැතිවරණ කොමිසන් සභාව මඟින් මහජනතාවට දැනුම් දෙන ලදී.[98] තවද, ඡන්ද විමසීමේ දිනය වර්ෂ 2020 මැයි මස 14 වන දිනෙන් පසුව දිනයක් මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබෙනු ඇති බවත් ''එම දිනය පසුව නිකුත් කරනු ලබන ගැසට් නිවේදනයක් මඟින් ප්‍රසිද්ධ කරනු ලබන බවත්'' එකී ගැසට් නිවේදනය මඟින් තවදුරටත් තහවුරු කරන ලදී.[99]

එබැවින්, පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති අන්දමින්ම තවදුරටත් පවතින අතර පාර්ලිමේන්තු මහ මැතිවරණය කවර දිනක පැවැත්වෙනු ඇත්ද යන්න සම්බන්ධයෙන් මේ වන විට නිශ්චිත අදහසක් නොමැත.

පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා නාම යෝජනා භාරදීමේ කාලය අවසන් වී ඇති අතර, ඒ ඒ මැතිවරණ කොට්ඨාශයන් සඳහා දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විසින් නම් කරන ලද අපේක්ෂකයින්ගේ නම් මේ වන තෙක් පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24(1) (ආ) වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර නොමැත.

තවද, ජනාධිපතිවරයා විසින් ස්වකීය මැතිවරණය ප්‍රකාශයට පත් කිරීමේ නිවේදනය ඔස්සේ නව පාර්ලිමේන්තුව රැස්වීම වර්ෂ 2020 මස 14 දිනට නියම කර තිබුණද, ඒ අන්දමට එවන් වූ දිනෙක රැස්වීම සඳහා පාර්ලිමේන්තුව පවතින්නේ නැත.

## පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමේ නෛතික ප්‍රතිවිපාක

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(1) අනු ව්‍යවස්ථාව ප්‍රකාරව, අභිනව පාර්ලිමේන්තුවේ ප්‍රථම රැස්වීම සඳහා නියම කල දින සිට වසර හතරක් සහ මාස හයක කාලයක් අවසන් වන දිනට පසු ඕනෑම අවස්ථාවක පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයාට හිමි වේ. ඉහතින් සඳහන් කල පරිදි වර්ෂ 2020 මාර්තු මස 02 වන දිනැති ගැසට් නිවේදනය මඟින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයා විසින් භාවිතා කරන ලද්දේ මේ ආකාරයෙන් ප්‍රකාශිත බලයයි. ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට කටයුතු නොකරනු ලැබුවේ නම්, පාර්ලිමේන්තුව වර්ෂ 2020 සැප්තැම්බර් මස දක්වා ක්‍රියාත්මකව පැවතීමට ඉඩ ප්‍රස්ථාව තිබුණි.[100]

මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ දිස්ත්‍රික්ක 22ක් සඳහා පැවැත්වීමට නියමිතව තිබූ පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමට භාවිතා කරන ලද්දේ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 24(3) වගන්තිය ප්‍රකාරව කොමිසම වෙත පැවරී ඇති බලතල ප්‍රකාරවය. එකී පනතේ විධිවිධාන අනුව ගත් කල, ඉහත කී බලය මැතිවරණ කොමිෂන් සභාවට භාවිතා කල හැකි වන්නේ පාර්ලිමේන්තු මැතිවරණ

---

[97] 2020 මාර්තු 20 දිනැති අංක 2167/12 දරණ ගැසට් (අති විශේෂ) පත්‍රය, යොමුව http://documents.gov.lk/files/egz/2020/3/2167-12_S.pdf

[98] 2020 මාර්තු 21 දිනැඩි අංක 2167/19 දරණ ගැසට් (අති විශේෂ) පත්‍රය, යොමුව http://documents.gov.lk/files/egz/2020/3/2167-19_S.pdf

[99] ඉහත එම (ii) වන ඡේදය

[100] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62(2) ව්‍යවස්ථාව

පනතේ 24(1) වගන්තිය ප්‍රකාරව අදාළ මැතිවරණය තරඟයක් වශයෙන් පැවැත් වෙන බවට ප්‍රකාශයක් නිකුත් කිරීමෙන් පසුව පමණි.[101]

ඒ අන්දමින් මැතිවරණ කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමේ නියෝගය නිකුත් කිරීමේ අවස්ථාව දක්වාම, වර්ෂ 2020 මාර්තු 02 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැරීම සම්බන්ධයෙන් තමන් විසින් නිකුත් කල ගැසට් නිවේදනය නැවත කැඳවීමට ජනාධිපතිවරයා සතු හැකියාව වලක්වන කිසිදු ප්‍රතිපාදනයක් හෝ අවහිරතාවයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හෝ පාර්ලිමේන්තු මැතිවරණ පනත තුළ නොතිබිණි. එවැනි ගැසට් නිවේදනයක් අත්තනෝමතික ලෙස ආපසු කැඳවීමේ බලයක් ජනාධිපතිවරයාට නොමැත අතර සාධාරණ ලෙස ක්‍රියා කිරීමේ බැඳී සිටීමේ වගකීම ජනාධිපතිවරයාට ඇත.[102]

කෙසේ නමුත්, වර්තමානයෙහි පවතින තත්ත්වයන් සලකා බලන කළ, එකී ගැසට් නිවේදනය ආපසු කැඳවීමක් සිදු කළේ නම්, ඔහුගේ එකී ක්‍රියාව පූර්ණ වශයෙන්ම සාධාරණීකරණය වන්නා සේම එය අත්තනෝමතික ක්‍රියාවක් බවට අර්ථ දැක්වෙන චෝදනා එල්ල වීමේ කිසිදු ඉඩ ප්‍රස්ථාවක් නොපවතින්නට ඇත. එකී ආපසු කැඳවීම සිදු වුයේ නම් එමගින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ආපස්සට හැරවීමක් වීමට ඉඩ තිබුණි.

කොවිඩ්-19 වසංගත තත්ත්වය සහිත සමාජ පසුබිමක පාර්ලිමේන්තු මහ මැතිවරණය පැවැත් වීමට කටයුතු කළේ නම් උද්ගත වීමට තිබූ අතිශය විනාශකාරී ප්‍රතිවිපාක හේතුවෙන් මැතිවරණය කල් දැමීම සඳහා එම අවස්ථාවේ දී මැතිවරණ කොමිෂන් සභාව විසින් ගත් තීරණය අගය කරනු ලැබේ.

කෙසේ වුවද, මැතිවරණ කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීම හේතුකොටගෙන උත්ගතව ඇති ගැටළු ගණනාවක් සම්බන්ධයෙන් පහතින් සාකච්ජා කෙරෙනු ඇත.

1. මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරය

පාර්ලිමේන්තු මැතිවරණ පනත මගින් තහනම් කර නොමැති ක්‍රියාකාරකම් ඔස්සේ මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාරයන්ට අදාළ කටයුතු කරගෙන යෑම සම්බන්ධයෙන් ඍජු බලපෑමක් මැතිවරණය කල් දැමීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් ගත් තීරණය ඔස්සේ සිදු නොවේ. මේ හේතුවෙන් මැතිවරණ අපේක්ෂකයින්ට ස්වකීය මැතිවරණ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමේ ඉඩ ප්‍රස්ථාවක් පැවැති අතර එතුලින් ඔවුන් කොවිඩ්-19 වසංගත තත්ත්වය ව්‍යාප්ත කරවන වාහකයින් වීමට සහ එමඟින් මහජනතාවට වඩාත් දැඩි අවධානම් තත්ත්වයකට පත් කරනු ලැබීමට ද ඉඩකඩ තිබුණි.

මෙකී අවදානම් සහගත තත්ත්වය අවම කිරීමේ අරමුණ පෙරදැරිව මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණය සඳහා තරඟ වදින අපේක්ෂකයින් සඳහා ලබාදෙන අනුක්‍රමික අංක සහ අපේක්ෂකයින්ගේ නම් ලැයිස්තුව ප්‍රසිද්ධියට පත් කරනු ලබන ගැසට් නිවේදනය නිකුත් නොකිරීමට පියවර ගන්නා ලදී. මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කල අපේක්ෂක අනුක්‍රමික අංක නොමැතිව අපේක්ෂකයෙකුට ඉතා සීමිත වපසරියක ස්වකීය මැතිවරණ ප්‍රචාරණ කටයුතු කිරීමට පමණක් අවස්ථාව හිමි වේ.

තවද, 'ඇඳිරි නීතිය' පැනවීම ප්‍රකාශයට පත් නොකලද, කොවිඩ්-19 වසංගතය ව්‍යාප්ත වීමට තුඩුදෙන අන්දමේ ප්‍රසිද්ධ මැතිවරණ ප්‍රචාරණයන් හා මැතිවරණ රැස්වීම් පැවැත්වීම වලක්වාලීම සඳහා ප්‍රමාණවත් නෛතික ප්‍රතිපාදන පොලිස් ආඥාපනතේ සහ අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ භාවිත කිරීමට හැකිය.[103]

---

[101] එය වර්ෂ 2020 මාර්තු මස 20 වන දින සිදු කරන ලදී. ඉහත අංක 97 දරණ පාද සටහන බලන්න.

[102] **රාජවරෝතියම් සම්පන්තන් සහ තවත් අය එදිරිව නීතිපති සහ තවත් අය** නඩුකරය බලන්න, **SC FR 351-356/2018, SC FR 358-361/2018**

[103] පොලිස් ආඥා පනතේ 77 සිට 81 දක්වා වගන්ති සහ අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 106 වගන්තිය බලන්න.

2. පාර්ලිමේන්තුව විසුරුවා හැරීම

මැතිවරණ කොමිෂන් සභාවට ඇත්තේ මැතිවරණය කල් දැමීමේ බලය පමණක් ය. එකී බලය භාවිත කරමින් නිකුත් කළ නියෝගය හරහා ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් නිකුත් කළ නියෝගය ආපසු හැරවීමක් සිදු නොවේ. ඒ අර්ථයෙන් බලන කළ, මෙම අවස්ථාව වන විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70 වන ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබෙන අතර පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වෙන හෝ අභිනව පාර්ලිමේන්තුව රැස්වන දිනයක් පිළිබඳව පැහැදිලි නිශ්චිත අර්ථ දැක්වීමක් නොමැත. මෙම තත්ත්වය මඟින් නීතිමය අභියෝගයන් කීපයක් ඉස්මතු කෙරේ.

I. ජනතාවගේ පරමාධිපත්‍ය බලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 වන ව්‍යවස්ථා ප්‍රකාරව ජනතාවගේ පරමාධිපත්‍ය බලය යන්නට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය ද අයත් වේ. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය භාවිතා කිරීමේ ප්‍රමුඛතම මෙවලම වශයෙන් ජනතා ඡන්දයෙන් තෝරා පත්කර ගන්නා මහජන නියෝජිතයින්ගෙන් සමන්විත වන පාර්ලිමේන්තුව ක්‍රියා කරනු ලබයි.

නිසි දිනට මැතිවරණ පැවැත්වීමට අපොහොසත් වීම හෝ මැතිවරණ කල් දැමීම වූ කලී ජනතාවගේ ඡන්ද අයිතිය මෙන්ම මූලික අයිතිවාසිකම් ද උල්ලංඝණය කිරීමක් බව ශ්‍රේෂ්ඨාධිකරණ විසින් ලබාදුන් තීන්දු මඟින් අවස්ථා ගණනාවකදීම තහවුරු කර තිබේ.[104] වර්තමානයේ පවතින තත්ත්වය හේතුවෙන් මැතිවරණය කල් දැමීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවට ඉතා සීමිත විකල්ප අවස්ථාවන් පැවැති මුත් එමඟින් පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකම් ලඝුකොට සැලකීමක් සිදුව තිබේ. ජනාධිපතිවරයා විසින් වර්ෂ 2020 මාර්තු 02 වන දින පාර්ලිමේන්තුව විසුරුවා හරිමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය ඉවත් කරනු ලැබුවේ නම් (පාර්ලිමේන්තු මැතිවරණය කල් දැමීමේ තීරණය ගැනීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව යොමු නොකර) එහිදී පාර්ලිමේන්තුව පැවැති පරිදිම යළිත් වර්ෂ 2020 අගොස්තු මස අවසානය දක්වා ක්‍රියාත්මකව පැවතීමට හැකියාව තිබූ බැවින් එහිදී ජනතාවගේ ඡන්ද අයිතිය උල්ලංඝණය වීමක් සිදු නොවන්නට ඉඩ ප්‍රස්ථාව පැවතුණි.

ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොපැවතීම මඟින් ජනතාවගේ පරමාධිපත්‍ය බලය අවමානයට ලක්වීමක් සේම ඒ ඔස්සේ රාජ්‍ය පාලනය සම්බන්ධයෙන් උද්ගත වන තවත් බරපතල ප්‍රශ්න ගණනාවක්ම ඉස්මතු කරනු ලබයි.

II. රාජ්‍ය මූල්‍ය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148[105] ව්‍යවස්ථාවෙහි විධිවිධාන ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් වන සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේය. ආණ්ඩුවේ ආදායම/ලැබීම් සහ ආණ්ඩුවේ වියදම් ද ඇතුළුව අනෙකුත් සියලු කාරණා සම්බන්ධයෙන් වන මෙකී පාලන බලයෙහි සවිස්තරාත්මක පැහැදිලි කිරීම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 සිට 152 දක්වා වූ ව්‍යවස්ථාවන් මඟින් ඉදිරිපත් කර තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථා ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් වන සියලු කරුණු කෙරේ පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතුව පැවැතීම අනිවාර්ය අංගයක් බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදුන් තීන්දු ගණනාවක්[106] හරහාම නිශ්චිත වශයෙන්ම නිගමනය කර තිබේ. ඒ අන්දමින් බලන

[104] **කරුණාතිලක එදිරිව. දායනන්ද දිසානායන (1999) 1 S.L.R. 157, පිටු 173-174; මොහොමට් හුසෙන් හජ්ජියාර් මොහොමඩ් සහ තවත් අය එදිරිව ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාව සහ තවත් අය SC FR 35/2016**

[105] ''රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේය. පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ නීතියක හෝ පවත්නා යම් නීතියක හෝ අධිකාරය අනුව හෝ ඒ යටතේ හෝ මිස කිසිම අධිකාරයක් විසින් හෝ කිසිම බද්ධක්, වරිපනමක් හෝ වෙනත් යම්කිසි බදු විශේෂයක් නියම කිරීමට බලයක් නොමැත්තේ ය.''

[106] ශ්‍රේෂ්ඨාධිකරණය විශේෂ විනිශ්චය 3 සහ 4/2008 (විසරජන පනත් කෙටුම්පත් පිළිබඳ නඩුකරය); ශ්‍රේෂ්ඨාධිකරණ විශේෂ විනිශ්චය 28 සහ 29/2016 මූල්‍ය කළමණාකරණ (වගකීම්) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ නඩුකරය බලන්න

කළ, පාර්ලිමේන්තුව සතුව සම්පූර්ණ පාලනය පවතිය යනුවෙන් අදහස් කරනු ලබන්නේ කුමක් ද යන්න ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පැහැදිලි කිරීමේ දී අදහස් කර ඇත්තේ:

(i) මුදල් මූලාශ්‍රයන් පිළිබඳව පාලනය, වෙනත් ආකාරයකින් පැහැදිලි කරනු ලබන්නේ නම්, බදු, අය කිරීම්, ගාස්තු ආදිය සහ ජනරජයේ ණය පිළිබඳ තත්ත්වය

(ii) ආණ්ඩුවේ විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන සඳහා රාජ්‍ය මූල්‍ය වෙන්කිරීම හා ඒවායේ වියදම් සීමා පැනවීම ඔස්සේ පාලනය කිරීම; සහ,

(iii) ඉහත (i) හා (ii) යන කරුණු වලට අනුකූලව කටයුතු කරනු ලබන්නේ ද යන්න සම්බන්ධයෙන් නිරන්තර විගණන මගින් පරීක්ෂා කිරීම ඔස්සේ පාලනය ආදී වශයෙනි.

මේ අනුව ඉතා වැදගත් කාරණය වන්නේ, මෙවන් පාලනයක් පාර්ලිමේන්තුව සතු වීමේ වැදගත්කම කුමක්ද යන්න සාධාරණීකරණය කිරීම පිළිබඳව හේතු දැක්වීමක් ශ්‍රේෂ්ඨාධිකරණය තම තීන්දු වලදී ඉදිරිපත් කර තිබීමයි. මූලික වශයෙන්ම රාජ්‍ය මූල්‍ය පිළිබඳව පාර්ලිමේන්තුවෙහි පාලනය යනු විධායකයෙහි කටයුතු පරීක්ෂා කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවේ කාර්ය කර්තව්‍යයන් අතරින් එක් අංගයකි. දෙවනුව පාර්ලිමේන්තුව විසින් මෙකී බලය භාවිතා කරනු ලබන්නේ තමන්ගේ යහපත පිණිස නොව එය මහජනතාව සඳහා වන ''භාරයක්'' වශයෙන්ය. එබැවින්, රාජ්‍ය මූල්‍ය යන්න විනිවිදභාවයකින් සහ විවෘතව පාලනය කිරීම තහවුරු කිරීම සඳහා පාර්ලිමේන්තුවට යුතුකමක් ද වේ.

රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් ඉහත කී අන්දමේ පාලනයක් වඩාත් විනිවිදභායකින් යුක්තව සිදු කිරීමට වඩාත් සුදුසුම ස්ථානය සාකච්ඡා කිරීම සඳහාම සැදුම්ලත් මන්ත්‍රණ සභාවක් වශයෙන් පවතින පාර්ලිමේන්තුව තුල බව නොකිවමනාය. පාර්ලිමේන්තුව තුළ සිදුවන කටයුතු ප්‍රසිද්ධ කරනු ලබන්නා සේම එය මහජනතාවට ප්‍රවේශ විය හැකි අන්දමට වාර්තාගත වීම පිළිබඳ කරුණකි. පාර්ලිමේන්තුව මගින් සම්මත කරනු ලබන පනත් කෙටුම්පත්, මෝසම් සහ යෝජනා ආදිය ද ප්‍රසිද්ධ ලේඛන බවට පත් වේ. පාර්ලිමේන්තුව තුල ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ප්‍රශ්න ඉස්මතු කිරීමට, ප්‍රකාශ නිකුත් කිරීමට සහ වාද විවාද සඳහා දායක වීම උදෙසා භාෂණයේ නිදහස තිබේ.

එබැවින් රාජ්‍ය මූල්‍ය පිළිබඳ කටයුතු පාර්ලිමේන්තු බලාධිකාරයෙන් ඔබ්බට විතැන් කර විධායකය වෙත නියාමනය නොකළ පාලන බලයක් සහිතව භාරදීම ඉතා පැහැදිලි වශයෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වනවා පමණක් නොව එය අනුවණ ක්‍රියාවක් මෙන්ම මහජන යහපතටද අගතිදායක තත්ත්වයක් ද උද්ගත කිරීමකි.

කෙසේ වුවද, මෙකී රීතියට එක් වැදගත් ව්‍යාතිරේකයක්[107] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(3) අනු ව්‍යවස්ථාව මගින් පෙන්වා දී තිබේ.

''යම්කිසි වර්ෂයක **විසර්ජන පනත් කෙටුම්පත නීතිය බවට පත්වීමට පෙර** හෝ ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ අවස්ථාවක **පාර්ලිමේන්තුව විසින් රජයේ සේවාවන් සඳහා මුදල් වෙන්කර නොමැත්තේ නම් අභිනව පාර්ලිමේන්තු රැස්වීමට නියමිත දින සිට මාස තුනක් ඉකුත් වන තෙක්** රජයේ සේවාවන් සඳහා **යම්කිසි මුදලක් අවශ්‍ය වෙතැයි ජනාධිපතිවරයා සලකයි නම්** ඒ මුදල ඒකාබද්ධ අරමුදලෙන් නිකුත් කිරීමටත් වැය කිරීමටත් නියම කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේය.''

ඉහත කී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධානය විශ්ලේෂණය කිරීමේදී පෙන්නුම් කෙරෙන්නේ එකී බලය පැවරීම වූ කලී සුවිශේෂී තත්ත්වයකට අදාළ කරුණක් වන බවය. එනම්, එකී තත්ත්වය පහතින් සඳහන් කරනු ලබන අවස්ථාවන්හි දී පමණක් අදාළ වේ:

[107] මැතිවරණ සම්බන්ධයෙන් අදාළ වන වියදම් පිළිබඳ විධිවිධාන පෙන්වා දී ඇති 150 (4) ව්‍යවස්ථාවද බලන්න.
''ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර මහ මැතිවරණයක් සඳහා දිනයක් හෝ දින නියම කරන අවස්ථාවක **ඒ මැතිවරණය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් ප්‍රතිපාදන සලසා නොමැති නම්** ඒ සඳහා අරමුදල් ඒකාබද්ධ අරමුදලෙන් නිකුත් කිරීමටත් මැතිවරණ කොමසාරිස්වරයා විමසා අවශය යයි සලකන අරමුදල් වැය කිරීමටත් ජනාධිපතිවරයාට බලය ඇත්තේය.''

(i) පාර්ලිමේන්තුව විසුරුවා හැරීමෙන් පසුව හා අභිනව පාර්ලිමේන්තුව ආරම්භ වන කාලය සඳහා වන වියදම් වෙනුවෙන් පාර්ලිමේන්තුව කිසිදු ප්‍රතිපාදනයක් වෙන් කර නොමැති තත්ත්වයක් දී;

(ii) ''රජයේ සේවාවන් සඳහා අවශ්‍ය'' ප්‍රමාණයට පමණක් ප්‍රතිපාදන ඒකාබද්ධ අරමුදලින් වෙන් කිරීමේ හැකියාව ජනාධිපතිවරයා සතු වේ;

(iii) මෙකී ප්‍රතිපාදන වෙන්කිරීම යම් සීමිත කාල පාරාසයකට මිස අසීමිත කාලයකට අදාළව සිදු කළ නොහැක.

වර්ෂ 2019 නොවැම්බර් මස පැවැත් වූ ජනාධිපතිවරණයෙන් පසුව පත් වූ නව ආණ්ඩුව විසින් අයවැයක් ඉදිරිපත් නොකරන ලදි. ඒ වෙනුවට, වර්ෂ 2020 ජනවාරි මස 01 වන දින සිට වර්ෂ 2020 අප්‍රේල් මස 30 වන දින දක්වා හෝ වර්ෂ 2020 සඳහා විසර්ජන පනත ඉදිරිපත් කරනු ලබන දින දක්වා යන මෙයින් කලින් එළඹෙන[108] කාරණයට අදාළ දිනය දක්වා බලපැවැත්වෙන පරිදි අතුරු සම්මත ගිණුමක් වර්ෂ 2019 ඔක්තොම්බර් 23 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගන්නා ලදී. පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇති පසුබිමක් තුල වර්ෂ 2020 අප්‍රේල් මස විසර්ජන පනත සම්මත කිරීමේ කිසිදු ඉඩකඩක් නොමැති අතර එසේ හෙයින්ම වර්ෂ 2020 අප්‍රේල් මස 30 වන දින යනු අතුරු සම්මත ගිණුම හරහා පාර්ලිමේන්තුව මඟින් මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමේ කාල පරාසය ද අවසන් වන දිනයයි. එබැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(3) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයාගේ බලය ක්‍රියාවට නැංවීම සිදු විය හැක්කේ වර්ෂ 2020 අප්‍රේල් මස 30 වන දිනෙන් පසුවය.[109]

ජනාධිපතිවරයාට එවැනි මුදල් ප්‍රතිපාදන වෙන් කිරීමේ හැකියාව ඇති කාලය සීමිත වන අතර, එය ''**අභිනව පාර්ලිමේන්තුව රැස්වීමට නියමිත දිනයේ සිට** මාස තුනක කාලයක් දක්වා'' පමණි. මේ අවස්ථාව වන විට ජනාධිපතිවරයා විසින් වර්ෂ 2020 මාර්තු මස 02 වන දින නිකුත් කල ගැසට් නිවේදනය වලංගුව සහ ක්‍රියාත්මකව පවතී. එසේ හෙයින්, වර්ෂ 2020 අගෝස්තු මස 14 වන දින තෙක් (වෙනත් ආකාරයකින් සඳහන් කරන්නේ නම්, අභිනව පාර්ලිමේන්තුව රැස්වීමට නියම කර ඇති දින සිට මාස 03ක කාලයක්) ''රජයේ සේවාවන් සඳහා අවශ්‍ය'' මුදල් පමණක් ගෙවීමේ හැකියාව ජනාධිපතිවරයාට ඇත. ඒ අනුව, ඊට පෙර පාර්ලිමේන්තු මැතිවරණය සිදුවිය යුතුව ඇති සේම, වර්ෂ 2020 අගෝස්තු 14 වන දිනට යෙදී ඇති කාලය ඉකුත් වීමේ සීමාවට පෙර විසර්ජන පනත පාර්ලිමේන්තුව තුල සම්මත කර ගැනීමද කල යුතුව තිබේ. කෙසේ නමුත්, පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ඇති පසුබිම තුළ, එය ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල නොහැකි කාල සීමාවක් බව ගම්‍යමාන වේ.

ඒ අනුව බලන කල, ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාවේ 150(3) ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා සතු බලතල කාලය යන සාධකය යටතේ සීමා කිරීමකට ලක්ව ඇති සේම එහි වපසරිය අනුවද සීමා වී ඇත්තේ අදාළ වියදම් ''රජයේ සේවාවන් සඳහා අවශ්‍ය වන තරමට පමණක්'' යන තත්ත්වය හේතුවෙනි. ''රාජ්‍ය සේවාවන් සඳහා අවශ්‍ය'' යන්න නිර්වචනය කර නොමැති මුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුලින් පැහැදිලිව අදහස් කෙරෙනුයේ පාර්ලිමේන්තුව මගින් සම්පූර්ණ ප්‍රතිපාදන අයවැය සම්මත කිරීමක් හරහා නියමිත පරිදි සිදු කරනු ලබන තෙක් අදාළ කටයුතු පවත්වාගෙන යාම උදෙසා අත්‍යාවශ්‍ය වියදම් පමණක් යන්නය. මීට අමතරව, දේශීය සහ විදේශීය ණය ගණන් පිළිබඳව ඇති නීති ගණනාවක් ද ආණ්ඩුවට

[108] https://www.parliament.lk/files/documents_news/2019/vote-on-account/resolution.pdf බලන්න.

[109] **ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ විනිශ්චය 30, 31, 32, සහ 33/2016 [අගය එකතු කළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත නඩුකරය]** මෙකී ප්‍රතිපාදනයන්ගේ සුවිශේෂී ස්භාවය සම්බන්ධයෙන් සලකනු ලබන විට, මුදල් සම්බන්ධයෙන් පනත් කෙටුම්පත් සහ/හෝ යෝජනාවක් සම්මත කිරීම සඳහා තිබෙන කාර්ය පටිපාටිය ඉතා දැඩිව අනුගමනය කල යුතු ය යන්න අධිකරණයෙහි මතය විය. අධිකරණය ස්වකීය දැඩි අර්ථනිරූපණය තහවුරු කරනු වස් සාධාරණීයකරණය කිරීම උදෙසා ''...... මෙම අධිකරණයෙහි වැදගත්ම කාර්යය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදන උල්ලංඝණය නොකරණ බවට තහවුරු කිරීම මෙන්ම ආණ්ඩුවේ ඒ ඒ අංශ වෙත පවරා ඇති බලතල ආරක්ෂා කර දීම වේ ...'' යනුවෙන් පෙන්වා දෙන ලදි.

බලපා තිබේ.[110] මෙකී ණය ගණන් වෙනස් කල හැකි වන්නේ පාර්ලිමේන්තුවේ වෙනත් පනත් හරහා පමණකි.

මේ අන්දමට පවතින මුල්‍ය දුෂ්කරතා විසඳා ගැනීම සඳහා ජනාධිපතිවරයාට භාවිත කළ හැකි යාන්ත්‍රණයන් කිහිපයක් අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානයන් තුළ අන්තර්ගත බව සිහි තබා ගත යුතුය. ඒ අතුරින් වඩාත් පැහැදිලිම යාන්ත්‍රණය වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(7) ව්‍යවස්ථා ප්‍රකාරව දැනට උද්ගතව ඇති හදිසි තත්ත්වය සලකා බලා නැවත පාර්ලිමේන්තුව කැඳවීමය.[111] පාර්ලිමේන්තුව කැඳවනු ලබන අවස්ථාවක දී, කොවිඩ්-19 වසංගත තත්ත්වය කළමණාකරණය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අනුමත කිරීම සිදු කල හැකිය. මෙමගින් උත්ගතව ඇති අර්බුදකාරී තත්ත්වයට අදාළව අරමුදල් රැස්කිරීම සහ වියදම් කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය විනිවිදභාවය ද තහවුරු කර ගත හැකිය. පවතින වර්තමාන සන්දර්භය තුළ විශේෂයෙන්ම මෙම අර්බුදකාරී තත්ත්වයෙහි බරපතලභාවය සහ පැවැත්වීමට නියමිත මැතිවරණය පිළිබඳ සැළකිමේදී, මෙකී වසංගතයෙහි ව්‍යාප්තිය වැළැක්වීම සඳහා ආණ්ඩුවට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන අනුමතකර දීම ප්‍රතික්ෂේප කිරීමට විරුද්ද පක්ෂයේ කිසිදු දේශපාලන පක්ෂයක් කටයුතු නොකරනු ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(7) ව්‍යවස්ථාවේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කිරීමේ වැදගත්කම වන්නේ, එසේ කැඳවනු ලැබූ පාර්ලිමේන්තුව හදිසි අවස්ථාව අවසන්වීම හෝ මැතිවරණ කොමිෂන් මගින් තීරණය කරනු ලබන දිනයක පාර්ලිමේන්තු මහ මැතිවරණය අවසන්වීම යන මෙයින් කලින් එළැබෙන අවස්ථාවකදී විසිරෙන්නේය යන තත්ත්වයයි. මේ හරහා පාර්ලිමේන්තු මහ මැතිවරණය අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව පැවැත්වීමේ වගකීම තහවුරු වීමක්ද සිදු වේ.

### III. මහජන හදිසි අවස්ථා සම්බන්ධයෙන් වන විශේෂ බලතල

ශ්‍රී ලංකාව තුළ පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය පැතිරීම වැළැක්වීම සඳහා ආණ්ඩුව විසින් පසුගිය සති දෙකක කාලය තුල විවිධාකාර පියවරයන් ගණනාවක් ගෙන තිබේ. එවන් වූ පියවරයන් අතරට;

- විශේෂයෙන්ම මෙකී වෛරසයට නිරාවරණය වී ඇති බවට සැක කරනු ලබන පුද්ගලයින් ඔවුන්ගේ නිවාස තුළ සහ රජය විසින් පහසුකම් සපයා ඇති මධ්‍යස්ථාන තුළ නිරෝධායනය කිරීම.
- සමහර විදේශ රටවල් වල සිට ශ්‍රී ලංකාවට පැමිණි පුද්ගලයින්ට සෞඛ්‍ය නිළධාරීන් වෙත ගොස් ලියාපදිංචි වන ලෙසට ඉල්ලීම් කිරීම සහ එලෙස ලියාපදිංචි වී නොමැති පුද්ගලයින්ව සොයා මෙහෙයුම් කිරීම.
- විශාල වශයෙන් පුද්ගලයින් එක්රැස් වීම වැළැක්වීම උදෙසා රජයේ නිවාඩු සහ වෙනත් නිවාඩු දින ප්‍රකාශයට පත් කිරීම
- රටේ ප්‍රදේශ ගණනාවක බලපැවැත්වෙන පරිදි ඇඳිරි නීතිය පැනවීම.
- පුරවැසියන් සඳහා අත්‍යාවශ්‍ය ආහාර හා වෙනත් ද්‍රව්‍ය ලබාදීම සඳහා සම්බන්ධීකරණ කටයුතු කිරීමේ යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම, ආදිය ඇතුළත් වේ.

මේ අන්දමින් ගනු ලබන සෑම පියවරයක්ම අවශ්‍ය වුයේ මෙම වෛරසය පැතිරයාම වැළැක්වීම සඳහා සහ මහජන සෞඛ්‍ය ආරක්ෂාව සහතික කිරීම සඳහාය. කෙසේ නමුත්, රජය විසින් ගන්නා ලද සමහර තීරණයන් සඳහා පැහැදිලි නෛතික පසුබිමක් හා පදනමක් පැවැතියද[112] තවත් සමහර තීරණ

[110] වර්ෂ 2019 විසරජන පනත සහ සක්‍රිය ණය කළමණාකරණ පනත බලන්න

[111] පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව කවර අවස්ථාවක වුව ද පාර්ලිමෙන්තුව නියමිත දිනයට කලින් රැස්වීම අවශ්‍ය වන ස්වභාවයක හදිසි තත්ත්වයක් උද්ගත වී ඇති බවට ජනාධිපතිවරයා සෑහීමකට පත් වුවහොත් විසුරුවා හැර ඇති පාර්ලිමේන්තුව ප්‍රකාශනයක් මඟින්, ඒ ප්‍රකාශනයේ දින සිට තුන් දවසකට කලින් දිනයක් නොවිය යුතු දිනයක දී රැස්වන ලෙස කැඳවීමට ජනාධිපතිවරයාට බලය ඇත්තේ ය. එසේ කැඳවනු ලැබූ පාර්ලිමේන්තුව හදිසි අවස්ථාව අවසන් වීම හෝ මහ මැතිවරණය අවසන් වීම යන මෙයින් කලින් එළඹෙන අවස්ථාවේ දී විසිරෙන්නේය.

[112] නිරෝධායන සහ රෝග වැලැක්වීමේ ආඥා පනතේ 3 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, යම් යම් පුද්ගලයින් නිරෝධායනය කිරීම සම්බන්ධයෙන් රෙගුලාසි පැනවීමේ බලය අමාත්‍යවරයා සතු වන්නේය.

සම්බන්ධයෙන් කිසිදු නෛතික පදනමක් පවතින තත්ත්වයක් විද්‍යමාන නොවේ. ඒ අනුව, නෛතික පදනමකින් තොරව කටයුතු කිරීම හරහා කෙටිකාලීන වශයෙන් ආණ්ඩුවට ක්‍රියාත්මක විය හැකි වුවද එය දිගු කාලීන වශයෙන් ගැටළුකාරීය.[113]

විවිධාකාර ව්‍යසන තත්ත්වයන් කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් දශක ගණනාවක අත්දැකීම් මෙරට තුළ පැවැතිය ද, කොවිඩ්-19 වසංගත තත්ත්වය පැතිරීමේ ව්‍යසනය හේතුවෙන් මනුෂ්‍ය ජීවිත, පුද්ගල අයිතිවාසිකම්, රාජ්‍ය පාලනය සහ ආර්ථිකය යන ක්ෂේත්‍ර තුළ උද්ගත කෙරෙන ප්‍රතිවිපාක හේතුවෙන් එමගින් මෙතෙක් අත්නොදකින ලද අන්දමේ අභියෝග ගණනාවක් ශ්‍රී ලංකා රජය ඉදිරියේද ඇති කර තිබේ. මෙම තත්ත්වය හේතුවෙන් ආණ්ඩුව විසින් අවම වශයෙන් වගකීමක් ඇති, විනිවිදභාවයෙන් යුක්ත සහ ඵලදායි පරිපාලන සහ තීරණ ගැනීමේ ව්‍යුහයන් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත. මෙකී අභියෝගයන්ගේ ඇති සුවිශේෂී ආවේණික ස්වභාවයන් හේතුවෙන්ම වර්තමානයෙහි පවතින නෛතික රාමුව තුළ ඉහත කී අන්දමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම අපහසු විය හැක.[114]

නව පාර්ලිමේන්තුවක් තෝරාපත් කර ගන්නා තෙක් එවැනි යාන්ත්‍රණයන් ස්ථාපිත කිරීම ප්‍රමාද කිරීමේ හැකියාව ආණ්ඩුවට නොමැත. එසේ හෙයින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 70(7) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව  නැවත කැඳවීම කඩිනමින්ම සිදු කළ යුතුය.

කිසියම් නොදන්නා හේතු පදනම් කරගෙන පාර්ලිමේන්තුව නැවත කැඳවීමට ආණ්ඩුව විසින් අකමැත්තක් දක්වන බව පැහැදිලිව විද්‍යමාන වේ. හදිසි අවස්ථාවන් කළමණාකරණය කිරීම සඳහාම වෙන් වූ නෛතික තත්ත්වයන් භාවිතා කිරීමට නොහැකි වීමද ඇතුළු කොවිඩ්-19 වසංගත තත්ත්වය පාලනය ඵලදායී ආකාරයට කිරීම උදෙසා භාවිතා කල හැකි මෙවලම් භාවිතා කිරීමට ඇති ඉඩ ප්‍රස්ථාව පාර්ලිමේන්තුව නොකැඳවීම හරහා අත්හැරීමක් ආණ්ඩුව විසින්ම සිදු කරනු ලබයි.[115] මෙකී නීති මඟින් හදිසි මහජන ව්‍යසන තත්ත්වයක් කළමණාකරණය කිරීම සඳහා ආණ්ඩුවට ඉතා පුළුල් අධිකාරී හා අභිමත බලයක් ලබාදෙන අතරම ඒ සම්බන්ධයෙන් අවම සුපරීක්ෂණයක් පමණක් ඇති අතර එහිදී ජනාධිපතිවරයා විසින් හදිසි තත්ත්වයක් සහ/හෝ ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශයට පත් කිරීමෙන් පසු පාර්ලිමේන්තුවේ යම් සීමිත අධීක්ෂණයක් පමණක් අවශ්‍ය වේ.[116]

අපගේ ආණ්ඩුක්‍රම පටිපාටියෙහි [117] සහ නීති ක්‍රමවේදයෙහි[118] පොදු ලක්ෂණයක් වන්නේ මෙවැනි හදිසි අවස්තාවන්හිදී විධායකයේ කාර්ය කර්තව්‍යයන් ඉටු කිරීමට සහය වීම සඳහා පාර්ලිමේන්තුව කැඳවීම සිදු කිරීමයි. සත්‍ය වශයෙන්ම, පාර්ලිමේන්තුවේ අධීක්ෂණයකින් තොරව ව්‍යසන තත්ත්වයන් සහ හදිසි අවස්ථාවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ විවෘත අධිකාරී බලයක් ආණ්ඩුවේ විධායකය වෙත ලබාදීම ඔස්සේ එවැනි බලතල අයථා ලෙස භාවිතා කිරීමේ ඉඩකඩක් සහ අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි අත්තනෝමතික ක්‍රියාවලට පෙළඹීමේ හේතුවක් විය හැකි බව පෙන්වා දීමට ශ්‍රේෂ්ඨාධිකරණයට සිදු විය.[119] ඒ අනුව ලබන විට, මෙහිදී ඉස්මතු කල හැකි තර්කය වන්නේ පවතින හදිසි/ව්‍යවසන තත්ත්වයක් සඳහා ඵලදායි ලෙස ප්‍රතිචාර දැක්වීමේදී ආණ්ඩුවේ විවිධ අංශ ඒ වෙනුවෙන් කටයුතු කිරීම සහ එකී කාර්ය කර්තව්‍යයන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියේ ආධිපත්‍යයට අනුකූල අන්දමින් සිදුවන බව තහවුරු කිරීම සමස්ථයක් වශයෙන් ගත් කල අපගේ නීති ක්‍රමවේදයෙහි අවශ්‍ය අංගයක් බවයි.

113 මේ හේතුවෙන් උද්ගත වියහැකි ගැටළුකාරී තත්ත්වයන් ගණනාවක්ම පවතින අතර විශේෂයෙන්ම රාජය නිලධාරීන් ද ඇතුළුව නියෝග/ ආණ්ඩුවේ වැඩපිළිවෙලවව් නොපිළිනොපදින තැනැත්තන්ට විරුද්ධව නෛතික පියවර ගැනීමට ආණ්ඩුව කටයුතු කලහොත් සංකීරණ තත්ත්වයක් ගණනාවක් උද්ගත විය හැකිය.

114 නිදසුනක් වශයෙන් ගත් කල, බෝවන රෝග ආඥා පනත සහ නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥා පනත යන නීති දෙකම වූ කලී මෙරට නිදහස ලැබීමට පෙර පැවැති වෙනස්ම සමාජ හා ආර්ථික පසුබිමක් පැවති තත්ත්වයන් යටතේ සකස් කරන ලද නීතින්ය.

115 මහජන ආරක්ෂක ආඥා පනත සහ ව්‍යසන කළමණාකරණ පනත බලන්න.

116 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ව්‍යවස්ථාව, මහජන ආරක්ෂක ආඥා පනතේ වගන්ති 2(3), 16 සහ 21; ශ්‍රී ලංකා ව්‍යසන කළමණාකරණ පනතේ 10 සහ 11 වගන්තීන් බලන්න.

117 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 සහ 70(7) ව්‍යවස්ථාවන් බලන්න.

118 මහජන ආරක්ෂක ආඥා පනතේ 2(3) 16 සහ 21 වගන්තීන්; ශ්‍රී ලංකා ව්‍යසන කළමණාකරණ පනතේ 10 සහ 11 වගන්තීන් බලන්න.

119 ශ්‍රේෂ්ඨාධිකරණයේ විශේෂ විනිශ්චය 04/2005 (ශ්‍රී ලංකා ව්‍යසන කළමණාකරණ පනතේ කෙටුම්පත් නඩුකරය) බලන්න.

කවර තත්ත්වයක් යටතේ වුවද, විධායකය සම්බන්ධයෙන් පවතින අධීක්ෂණය එතරම්ම පුළුල් නොවන්නා සේම පවතින තත්ත්වයට ප්‍රතිචාර දැක්වීම සඳහා වඩාත් පුළුල් ඉඩ ප්‍රස්ථාවක් විධායකයට ලැබේ. පුළුල් බලතල ලබාදෙන පවතින නීතින් භාවිතා කිරීමෙන් ආණ්ඩුව වැළකී ඒ වෙනුවට පැහැදිලි ලෙසම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නොවන සහ නීති විරෝධී යාන්ත්‍රණයන් ඔස්සේ කටයුතු කිරීමට තෝරාගැනීම අවබෝධකර ගත නොහැකි අන්දමේ ප්‍රහෙලිකාවකි.[120] එවැනි ක්‍රියාවන් හරහා හුදෙක් සිදු වන්නේ, මෙවැනි තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා ආණ්ඩුවට ඇති ධාරිතාවය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථානුකූල පාලනයකට සහ නීතියේ ආධිපත්‍යයට ඇති කැපවීම සහ මහජන යහපත වෙනුවෙන් ආණ්ඩුවේ අධිකාරී බලය මෙහෙය වීමේ හැකියාව ආදී කරුණු සම්බන්ධයෙන් මහජන විශ්වාසය පහත වැටීමයි. එතුළින් අනවශ්‍ය නෛතික සංකීර්ණතාවයන් මත ආණ්ඩුවේ කටයුතු අවුල් සහගත තත්ත්වයකට පත් කරන්නා සේම මහජන අවශ්‍යතාවයන් උදෙසා ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමේ හැකියාවද අවම මට්ටමකට පත් කරනු ලබයි.

[120] වර්ෂ 2020 මාර්තු 26 දිනැති අංක 2168/8 දරණ (අතිවිශේෂ) ගැසට් පත්‍රය. යොමුව http://documents.gov.lk/files/egz/2020/3/2168-08_S.pdf

## ඇමුණුම II

# ලුහුඬු මාර්ගෝපදේශ II

# ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වන ව්‍යුහයන්: ජනාධිපති කාර්ය සාධක බලකාය පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
වර්ෂ 2020 අප්‍රේල් 8 දින

**විධායක සාරාංශය**

කොවිඩ්-19 සෞඛ්‍ය හදිසි අවස්ථාවට ප්‍රතිචාර වශයෙන්, ශ්‍රී ලංකාව දැනට පවතින ව්‍යුහයන් සක්‍රීය කිරීම සහ නව ව්‍යුහයන් ස්ථාපිත කිරීම දක්නට ලැබේ. එවැනි එක් නව ආයතනික ව්‍යුහයක් වන්නේ සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසු විපරම පිණිස ස්ථාපිත කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකායයි (''කාර්ය සාධක බලකාය''). මෙකී කාර්ය සාධක බලකාය පිහිටුවන අවස්ථාව වන විට කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය ජනාධිපතිවරයා විසින් ස්ථාපිත කර තිබුණි. කෙසේ වෙතත්, කාර්ය සාධක බලකායට පැවරී ඇති නිලවරම සහ බලතල, අත්‍යාවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීම සහතික කිරීමේ සිට සමාජයේ අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වලට සහන සැලසීමේ ක්‍රමවේද දක්වා විෂය පථය සහ පරාසය ආවරණය වන පරිදි පුළුල් මට්ටමක පවතී.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සකස් කරන ලද මෙම ලුහුඬු මාර්ගෝපදේශය මගින් මෙකී කාර්ය සාධක බලකායේ රාමුව සම්බන්ධයෙන් කෙටියෙන් විමසා බලනු ලබයි. පවතින වසංගත තත්ත්වයේ බලපෑම අවම කිරීම සඳහා කාර්යක්ෂම හා ඵලදායී ක්‍රියාමාර්ගයක් කඩිනමින් අවශ්‍ය වන අතර, එවැනි ක්‍රියාමාර්ග ගත හැකිව තිබූ පවතින නීතිමය සහ ආයතනික රාමු ගණනාවක් පිළිබඳව මෙම මාර්ගෝපදේශය ඔස්සේ පෙන්වා දෙනු ලබයි. විශේෂයෙන්ම වර්ෂ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත මගින් මෙවැනි අවස්ථා කළමණාකරණය කිරීම සඳහා විධිවිධාන සලසා ඇති අතර පවතින ආයතන සහ ක්‍රියාකාරීන් කාර්යක්ෂමව සේවයේ යොදවා පුළුල් ක්‍රියාමාර්ග ගැනීමට ඉඩ සලසයි. කාර්ය සාධක බලකායට පවරා ඇති තනි කාර්ය කර්තව්‍යයන් ඉටු කළ හැකි වෙනත් විකල්ප නීති තිබේ.

කාර්ය සාධක බලකාය පිළිබඳ නිර්වචනයේ නොපැහැදිලි බව සහ එහි පුළුල් කාර්ය කර්තව්‍යය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි වගන්තිය සහ වෙනත් එක් එක් ලිඛිත නීති ගණනාවක් ද බලාතික්‍රමණය කරන බව මෙම මාර්ගෝපදේශය ඔස්සේ පෙන්වා දෙනු ලබයි. මෙම තාවකාලික පියවරයන් මගින් ජනනය කරන ලද විනිවිදභාවය සහ වගවීම නොමැතිකම මගින් මෙය තවදුරටත් සංකීර්ණ වේ. මේ අනුව, කාර්ය සාධක බලකාය පිහිටුවීමේ සැබෑ අභිප්‍රාය විමසා බැලීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වේ.

උද්ගතව ඇති හදිසි අවස්ථාවෙහි පෙර නොවූ විරූ පරිමාණය සහ පුළුල් බරපතල තත්ත්වය හමුවේ, ඒ සම්බන්ධයෙන් දක්වන්නා වූ ප්‍රතිචාරය ද කාර්යක්ෂමතාවය, නිසි සම්බන්ධීකරණ සහ ගැටුම් සම්බන්ධයෙන් වන සංවේදීතාව, සාධාරණත්වය, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්මවලට අනුකූල විය යුතු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහි දී සටහන් කරනු ලබයි. මෙම මාර්ගෝපදේශය මගින් පෙන්වාදෙනු ලබන පරිදි, පවතින වසංගත තත්ත්වය සම්බන්ධයෙන් දක්වන වර්තමාන ප්‍රතිචාරය වඩාත් සාධනීය තත්ත්වයකට පත්කළ හැකි සහ එසේ කළ යුතු විශේෂඥ දැනුම සහ කුසලතා සම්භාරයක් සිවිල් පරිපාලනය තුළ ශ්‍රී ලංකාවට ඇත. වඩාත් මූලික වශයෙන්ම වැදගත් වන්නේ, වසංගත තත්ත්වය සම්බන්ධයෙන් දක්වන ප්‍රතිචාර ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාමය සහ නීතිමය රාමුවට අනුකූලව සිදු විය යුතුය යන්නයි.

**හැඳින්වීම**

කොවිඩ්-19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවට ප්‍රතිචාර වශයෙන්, ජනාධිපතිවරයා විසින් වර්ෂ 2020 මාර්තු 26 වන දිනැති අංක 2168/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ස්ථාපිත කරන ලද ජනාධිපති කාර්ය සාධක බලකායක් (කාර්ය සාධක බලකාය) පිහිටුවන ලද බවට රජය විසින් ප්‍රකාශ කරන ලදී.

මෙම කාර්ය සාධක බලකාය ස්ථාපිත කරන ලද්දේ *''කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ දී වැඩි අවදානම් තත්ත්වයක් ඇති කොළඹ, කළුතර, ගම්පහ, පුත්තලම, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්ක වලට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශ වලට ග්‍රාමීය ප්‍රදේශ හා නිශ්පාදකයින් විසින් සපයනු ලබන ආහාර සැපයුම් සෘජුවම පාරිභෝගිකයන්ට ලබාදීම ඇතුළු සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසු විපරම පිණිස''* ය. මෙම කාර්ය සාධක බලකාය යනු ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා පත් කරන ලද නවතම ආයතනයයි. මීට පෙර ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් සෞඛ්‍ය සේවා සහ අනෙකුත් සේවාවන් සාමාන්‍ය ජනතාවට හොඳින් ලබාදීම සහතික කිරීම පිණිස වැළැක්වීමේ සහ කළමනාකරණ පියවර ගැනීම් පිළිබඳව සම්බන්ධීකරණය කිරීම සඳහා කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය පිහිටුවන ලදී.[121] ඉහත කී කාර්ය සාධක බළකාය පත්කිරීමෙන් පසුව ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානයක අඛණ්ඩ අවශ්‍යතාවක් මතුවන්නේ මන්ද යන්න අපැහැදිලි කරුණක් වන අතර එමගින් එකම කාර්ය කර්තව්‍යය එම ව්‍යුහයන් දෙක තුළින්ම සිදුවීමේ ගැටළුව පැන නගී. කෙසේ වෙතත්, කාර්ය සාධක බලකායේ විස්තීරණ ස්වභාවය සහ ප්‍රවේශය සැලකිල්ලට ගනිමින්, ඊට පවරා ඇති බලතල හරහා බලාතික්‍රමණයක් සිදුවේද සහ බලතල විස්තර කිරීමට භාවිතා කරන සමහර යෙදුම්වල නොපැහැදිලි බව පිළිබඳ තත්ත්වයන්ද සහිත පසුබිමක මෙකී කාර්ය සාධක බලකායට වඩා පුළුල් බලතල ප්‍රමාණයක් ලබා දී ඇත.

ශ්‍රී ලංකාව ව්‍යසන රැසකට මුහුණ දී ඇති අතර ඊට ප්‍රතිචාර වශයෙන් විවිධාකාර ව්‍යුහයන් සහ යාන්ත්‍රණ රැසක් නිර්මාණය කර ඇත. නිදසුනක් වශයෙන්, අත්‍යාවශ්‍ය සේවා අවශ්‍ය වූ හදිසි අවස්ථා කිහිපයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අත්‍යවශ්‍ය සේවා සඳහා කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කරන ලදී.[122] වර්ෂ 2004 දී සිදු වූ සුනාමි ව්‍යසනයෙන් පසුව, කාර්ය සාධක බලකායන් ත්‍රිත්වයක්[123] ද සමගින් ප්‍රතිසංස්කරණ හා සංවර්ධන නියෝජිතායතනය (Reconstruction and Development Agency-RADA) සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය[124] (Disaster Management Centre) ඇතුළු තවත් ව්‍යුහ කිහිපයක් ස්ථාපිත කරන ලදී. වර්ෂ 2009 දී පත් කරන ලද උතුරු පළාතේ නැවත පදිංචි කිරීම, සංවර්ධනය සහ ආරක්ෂාව සඳහා වූ ජනාධිපති කාර්ය සාධක බලකාය ඇතුළුව පශ්චාත් යුධ සන්දර්භය තුළ ද යාන්ත්‍රණ ගණනාවක් ද නිර්මාණය කරන ලදී.[125]

මීට අමතරව, මධ්‍යම රජයේ සහ ප්‍රාදේශීය මට්ටමින් පවතින ව්‍යුහයන් කිහිපයක් හදිසි අවස්ථා වලදී ප්‍රධාන භූමිකාවන් ඉටු කර ඇත. අතීතයේ දී, සමෘද්ධි වැඩසටහන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ග්‍රාම නිලධාරීන් වැනි ව්‍යුහයන් ඔවුන්ගේ නිශ්චිත ප්‍රදේශවල අවදානමට ලක්විය හැකි සහ පීඩාවට පත් වූ ප්‍රජාවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා අලුතින් ස්ථාපිත සහන යාන්ත්‍රණ සමග සම්බන්ධීකරණයෙන් යුක්තව ස්වකීය කාර්ය කර්තව්‍යයන් ඉටු කර ඇත. ආපදා සහ හදිසි අවස්ථාවන්ට මුහුණ දීමේ ශ්‍රී ලංකාවේ ඉතිහාසය සම්බන්ධයෙන් තත්ත්වය පිළිගනිමින්, වර්තමාන තත්ත්වය තුළ කාර්යභාරයක් ඉටු කළ හැකි සහ ඉටු කළ යුතු විශේෂඥ දැනුමක් සහ කුසලතා සම්භාරයක් සහිත සිවිල් පරිපාලනයක් මෙරට තුළ ඇත. කොවිඩ්-19 වසංගත තත්ත්වයෙහි මුල් වකවානුව තුළ පෙන්නුම් කරන ලද්දේ හදිසි අවස්ථාවට ප්‍රතිචාර දැක්වීමට සහ ඒවාට මුහුණ දීමට පරිපාලන සේවයෙහි එවන් වූ පෙරටුගාමී නිලධරයන්ට ඇති හැකියාවයි.

මේ අනුව, සෞඛ්‍ය හදිසි අවස්ථාවට මුහුණ දීම සඳහා හඳුන්වා දී ඇති ඕනෑම නව යාන්ත්‍රණයක් මගින් වත්මන් වසංගත ප්‍රතිචාර දැක්වීමේ දී මෙම පවතින ව්‍යුහයන්ට කාර්යභාරයක් ලබා දීම සහතික කළ යුතු අතර දේශපාලන වාසි සඳහා නව ව්‍යුහයන් ආරම්භ නොකිරීමට වග බලා ගත යුතුය.[126] තවද, මීට පෙර අත්දැකීම් වලින් ලබා ඇති උගත් පාඩම් සහ වර්තමාන හදිසි අවස්ථාවට ප්‍රතිචාර දැක්වීම ගැටුම් සංවේදීතාව, සමානාත්මතාවය, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්ම වලට අනුකූල වන අන්දමින් සිදු කිරීම ද ඉතා වැදගත් වේ.

කොවිඩ්-19 ශ්‍රී ලංකාව තුළ පෙර නොවූ විරූ අභියෝග මතු කර ඇති අතර ඉහත මූලධර්ම වලට අනුකූල වන සහ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාමය සහ නෛතික රාමුවට අනුගත වන අන්දමේ ඵලදායි, නිසි සම්බන්ධීකරණයෙන් යුත් සහ ඒ සියල්ලට අනුකූලව කටයුතු කෙරෙන ප්‍රතිචාරයක් අවශ්‍ය වේ. කාර්ය සාධක බලකාය පිහිටුවීම සහ එහි

---

121 ජනාධිපති මාධ්‍ය අංශය, 'කොවිඩ් 19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය හමුදාපති ශවේන්ද්‍ර සිල්වාගේ ප්‍රධානත්වයෙන්' http://www.pmdnews.lk/army-commander-shavendra-silva-heads-national-operation-center-forprevention-of-covid-19- outbreak/

122 හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) රෙගුලාසි, 2005 අංක 1 (සංශෝධිත පරිදි), 9 වන රෙගුලාසිය. https://www.refworld.org/pdfid/471712342.pdf

123 ගලවාගැනීම් සහ සහන සඳහා කාර්ය සාධක බලකාය (TAFRER), සැපයුම්, නීතිය සහ සාමය සඳහා කාර්ය සාධක බලකාය, (TAFLOL) සහ ජාතිය යළි ගොඩනැගීම සඳහා කාර්ය සාධක බලකාය (TAFREN)

124 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත යටතේ පිහිටුවා ඇත.

125 Reliefweb.int, ශ්‍රී ලංකාව: උතුරු පළාත ගොඩනැගීමට ජනාධිපතිවරයා විසින් නව කාර්ය සාධක බලකායක් පත් කරනු ලබයි. https://reliefweb.int/report/srilanka/ sri-lanka-president-appoints-new-task-force-rebuild-north

126 වර්ෂ 2020 අප්‍රේල් 6 වන දිනැති මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානයෙහි ලිපිය.

පුළුල් බලතල වත්මන් සෞඛ්‍ය හදිසි අවස්ථා සන්දර්භය  සහ ශ්‍රී ලංකාවේ පාලන රාමුව සම්බන්ධයෙන් පවතින තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් පවතින විශේෂඥතාව, කුසලතා සහ ව්‍යුහයන් තුළ පරීක්ෂාවට ලක් කළ යුතුය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම වත්මන් ලුහුඬු මාර්ගෝපදේශය සකස් කර ඇත්තේ කාර්ය සාධක බලකායේ කාර්ය භාරය සහ බලතල පරීක්ෂා කිරීමට සහ ප්‍රධාන ගැටළු මතු කිරීම ය. බහුවිධ ආයතනික ව්‍යුහයන් සහ නීති ක්‍රියාත්මක වන සන්දර්භයක් තුළ මෙතරම් පුළුල් බලතල සහිත කාර්ය සාධක බලකායක් පිහිටුවීමේ අවශ්‍යතාවය මෙම මාර්ගෝපදේශය ඔස්සේ ප්‍රශ්න කරනු ලබයි. අධීක්ෂණය සහ වගවීම සහතික කළ හැකි ක්‍රියාකාරී පාර්ලිමේන්තුවක් නොමැති සන්දර්භයක් තුළ මෙහිදී ඉස්මතු කෙරෙන ගැටළුකාරී තත්ත්වයන් වඩාත් සාධාරණ බව තවදුරටත් තහවුරු වේ.

**කාර්ය සාධක බලකාය පත් කිරීම**

ජනාධිපතිවරයාගේ යුතුකම් හා කාර්ය ඇතුළත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාව යටතේ මෙකී කාර්ය සාධක බලකාය පිහිටුවා ඇත. කාර්ය සාධක බළකාය පිහිටුවීම සඳහා 33(2) ව්‍යවස්ථාව යටතේ කුමන බලයක් මත පදනම්ව තිබේද යන්න නිශ්චිතව දක්වා නැත, නමුත් එහි සඳහන් බලතල 33 (2) (ය) හැර, ඉතා නිශ්චිත යඃ

> *(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ යම් ලිඛිත නීතියකින් හෝ ප්‍රකාශිතවම තමා වෙත පවරා හෝ නියම කර ඇත්තා වූ බලතලවලට සහ කාර්යයන්ට අමතරව, ජනාධිපතිවරයාට ...*

> ***(ඌ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක හෝ විධිවිධාන වලට පටහැනි නොවන්නා වූ ද ජාත්‍යන්තර නීතිය, චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය අනුව ඉටු කිරීමට ඔහුට නියමිතව හෝ බලය ලැබී ඇත්තා වූ ද සියලු ක්‍රියා හා දේ කිරීමට බලය ඇත්තේය.***

මේ අනුව තාර්කිකව නිගමනය කළ හැක්කේ වත්මන් කාර්ය සාධක බලකාය පිහිටුවීමට ජනාධිපතිවරයා විසින් මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ප්‍රතිපාදනය භාවිත කළ බව ය.[127] මෙම අනු ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට ලබා දී ඇති බලතල පුළුල් ලෙස පෙනෙන අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හෝ වෙනත් ලිඛිත නීතියකට පටහැනි කිසිවක් කිරීමට ජනාධිපතිවරයාට ඉඩ ප්‍රස්ථාව නොදෙන බව එහි පැහැදිලිවම සඳහන් වේ. මේ අනුව, කිසිදු ලිඛිත නීතියක් අභිබවා යාමට එම ව්‍යවස්ථාව මඟින් ජනාධිපතිවරයාට බලය ලබා නොදේ.

ජාත්‍යන්තර නීතිය, චාරිත්‍ර වාරිත්‍ර හෝ භාවිතය මගින් ජනාධිපතිවරයාට නියමිතව හෝ බලය ඇත්තා වූ දෙයක් සම්බන්ධයෙන් බලය ක්‍රියාත්මක කළ යුතුය. මෙම බලය සාධාරණ ලෙස ක්‍රියාත්මක කළ යුතු බව මෙයින් නිතැතින්ම ගම්‍ය වේ.

මෙම කාර්ය සාධක බලකායේ බලතල අනුව පහත දක්වා ඇති කරුණු සලකා බැලීමේදී, කාර්ය සාධක බලකාය පිහිටුවීමේදී 33(2) වගන්තිය මත රඳා පැවතීම සහ එහි නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න මතු කිරීම සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සටහන් කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි ව්‍යවස්ථාවෙන් ජනාධිපතිවරයාගේ බලතල පමණක් නොව ජනාධිපතිවරයාගේ ඊට අනුරූප කාර්යයන් ද සඳහන් වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම සහතික කිරීම ජනාධිපතිවරයාගේ කාර්ය බවට පත් කරන 33 (1) (අ) වගන්තිය මෙයට ඇතුළත් වේ. මෙයට අමතරව, 33අ ව්‍යවස්ථාවේ සඳහන් වන්නේ, *'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත් කාලයේ බලපවත්නා නීතිය ඇතුළු යම් ලිඛිත නීතියක් යටතේ ද ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය'* යනුවෙනි. මේ අනුව, ජනාධිපතිවරයා තම බලතල ක්‍රියාත්මක කරන ආකාරය සහ ඒවා සාධාරණ හා අවශය ප්‍රමාණයට පමණක් ක්‍රියාත්මක වන බව සහ එකී බලතල අයථා අන්දමින් භාවිත නොකරනු ලබන බව සහතික කිරීම සඳහා පාර්ලිමේන්තු අධීක්ෂණය වැදගත් වේ.

කොවිඩ්-19 වසංගත අර්බුදය මධ්‍යයේ මේ වන විට පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබෙන අතර පාර්ලිමේන්තු මැතිවරණය ක්‍රියාත්මක කිරීමේදී පවතින අනතුරුදායක තත්ත්වය හේතුවෙන් එය කල් දමා ඇත. මැතිවරණය සඳහා නව දිනයක් නියම කිරීම ප්‍රමාද කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කර ඇති අතර, මේ අනුව අභිනව පාර්ලිමේන්තුවක් තෝරා පත් කර ගැනීමට මාස කිහිපයක් ගත විය හැකිය. මෙම හදිසි අවස්ථාව තුළ පාර්ලිමේන්තුව නැවත කැඳවීමේ වැදගත්කම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මීට පෙර ඉස්මතු කර ඇති අතර, එසේ කිරීමට ජනාධිපතිවරයාට ඇති බලතල ද දක්වා ඇත.[128] යම් හෙයකින් පාර්ලිමේන්තුව නැවත කැඳවීමට

---

127 මීට අමතරව, උතුරු පළාතේ නැවත පදිංචි කිරීම, සංවර්ධනය සහ ආරක්ෂාව සඳහා වූ වර්ෂ 2009 ජනාධිපති කාර්ය සාධක බලකාය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33(ඊ) ව්‍යවස්ථාව යටතේ (දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට පෙර) පිහිටුවන ලද අතර එම වගන්තිය වර්තමාන 33(2)(ඌ) ව්‍යවස්ථාවට බොහෝ දුරට සමාන වේ.

128 'කොවිඩ්-19 සන්දර්භය තුළ විකාශනය වන නෛතිකමය ගැටළු - කෙටි මාර්ගෝපදේශය I', විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය,

ජනාධිපතිවරයා විසින් මෙම බලතල භාවිතා කරනු ලබන්නේ නම්, එය කොවිඩ්-19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් වඩාත් ඵලදායී ලෙස මැඩ පැවැත්වීමට සහ එය කළමණාකරණය කිරීමට මෙවලම් වශයෙන් නීති මාලාවක් ලබා දෙනු ඇත.[129]

වඩාත් පුළුල් ලෙස, විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය යන ආණ්ඩුවේ මූලිකාංගයන් ත්‍රිත්වයම ක්‍රියාකාරී ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ අවශ්‍ය වන අතර හඳුන්වා දෙනු ලබන ඕනෑම රාමුවක් අවශ්‍ය පරීක්ෂාවට ලක් කළ හැකි විය යුතුය. හදිසි අවස්ථාවකදී විධායක අංශයට යම් යම් පියවර ගැනීමට හැකි වුවද, ඒවා ද නීතියෙන් සපයා ඇති ක්‍රියාවලියක් හරහා සිදුවිය යුතුය. නිදසුනක් වශයෙන්, හදිසි තත්වයක් ප්‍රකාශ කිරීමේදී පවා, එවැනි හදිසි තත්ත්වයක් ප්‍රකාශ කිරීමේ ප්‍රකාශය දින 14ක් ඇතුළත පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු බවට නීතියෙන් නියම කෙරේ. මේ අනුව, කොවිඩ්-19 වසංගත තත්ත්වය නීත්‍යානුකූලව සහ ව්‍යවස්ථානුකූලව ආමන්ත්‍රණය කිරීමට සියලු පියවර ගෙන ඇති බව සහතික කිරීම සඳහා පාර්ලිමේන්තුව නැවත කැඳවීම ඉතා වැදගත් වේ.

## කාර්ය සාධක බලකායේ කාර්යයන් සහ බලතල

කාර්ය සාධක බලකායේ කාර්ය වන්නේ *'කොරෝනා වෛරසය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීමේ දී වැඩි අවදානම් තත්ත්වයක් ඇති කොළඹ, කළුතර, ගම්පහ, පුත්තලම, යාපනය, මන්නාරම, කිලිනොච්චිය, වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්ක වලට ප්‍රමුඛත්වය දෙමින් එම ප්‍රදේශ වලට ග්‍රාමීය ප්‍රදේශ හා නිශ්පාදකයින් විසින් සපයනු ලබන ආහාර සැපයුම් සෘජුවම පාරිභෝගිකයන්ට ලබාදීම ඇතුළු සමස්ත ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසු විපරම් කිරීම* **සහ** ඒ යටතේ පෙන්වා දී ඇති කාර්යයන් දොළහ ඉටු කිරීම වේ.

එම කාර්ය කටයුතු සිදුකිරීමේ අරමුණින් අවශ්‍ය පරිදි එවැනි විමසීම් කිරීමට සහ උපදෙස් ලබාදීමට මෙම කාර්ය සාධක බලකායට බලය පවරා ඇත. තවද, එම ගැසට් පත්‍රය මගින් ම, එම කාර්ය සාධක බලකාය විසින් උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි නැතහොත් සේවා සැපයීම සඳහා පිණිස සහාය ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් සහ එබඳු සෙසු තැනැත්තන් විසින් තත් කාර්යය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපසෙදස් වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයි ද, ලබාදිය හැකි සියලුම සහාය සැලසිය යුතු යැයිද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයිද මෙමගින් නියම කර තිබේ. එවැනි රාජ්‍ය නිලධාරියෙකුට හෝ එවැනි ආයතනයකට පැවරී ඇති රාජකාරි හා වගකීම් ඉටු කිරීමේදී කිසියම් අමාත්‍යාංශයක, රජයේ දෙපාර්තමේන්තුවක, රාජ්‍ය සංස්ථාවක හෝ වෙනත් ඒ හා සමාන ආයතනයක කිසියම් රාජ්‍ය නිලධාරියකුගේ හෝ ආයතනයක් අතපසු කිරීම් හෝ පැහැර හැරීම් සම්බන්ධයෙන් ජනාධිපතිවරයාට වාර්තා කිරීමට කාර්ය සාධක බලකාය විසින් පියවර ගත යුතු වේ.

මෙකී විධිවිධාන වූ කලී රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ආයතනවල ක්‍රියාකාරීත්වය සහ ගනුදෙනු සම්බන්ධයෙන් යම් පාලනයක් ඇතුළත් පුළුල් බලතල වේ. කොවිඩ්-19 වසංගත තත්ත්වය සම්බන්ධයෙන් ඵලදායී ලෙස ක්‍රියා කරන සහ ගනුදෙනු කරන ප්‍රතිචාරයක් අත්‍යවශ්‍ය වේ, නමුත් හඳුන්වා දී ඇති ව්‍යුහයන් සහ රාමු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ ලිඛිත නීතිවලට අනුකූලව එය කළ යුතුය. කාර්ය සාධක බළකායේ කාර්ය කර්තව්‍යය පුළුල් වන නමුදු, එහි වගවීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර හෝ බාහිර යාන්ත්‍රණයක් ඇති බවක් නොපෙනේ. විශේෂයෙන්ම වර්තමානයෙහි ක්‍රියාත්මකව පවතින පාර්ලිමේන්තුවක් නොමැති අවස්ථාවක මෙම කාර්ය සාධක බලකායේ බලය අනිසි ලෙස භාවිතා කිරීමට ඇති ඉඩකඩ සැබෑවක් වීමට හැකියාව ඇත. කාර්ය සාධක බලකාය කෙරෙහි ඵලදායී පරීක්ෂාවක් සහ අධීක්ෂණයක් ඇති කර ගැනීමට නොහැකි වීම බරපතළ ප්‍රතිවිපාකවලට තුඩු දිය හැකි අතර කාලයත් සමඟ විධායකයේ බලය තවදුරටත් තහවුරු කර ගැනීමට සහ අත්තනෝමතික පාලනයක් කරා ගමන් කිරීමට ද එමගින් දායක විය හැකිය.

## පවතින රාමුව සහ අවධානය යොමු කළයුතු ගැටළුකාරී ක්ෂේත්‍ර

මෙවැනි වසංගත තත්වයක් පෙර නොවූ විරූ අන්දමේ එකක් බවත්, දැනට පවතින නීති තත්ත්වයේ සියලු අංශ සමඟ කටයුතු කිරීමට ප්‍රමාණවත් නොවන බවත් පිළිගන්නා නමුදු, අර්බුදයට මුහුණ දීම සඳහා පවතින නීති භාවිතා කිරීමට ප්‍රථමයෙන් උත්සාහ කළ යුතුය. පාර්ලිමේන්තුව විසින් පනවන ලද පවතින නීති භාවිතා කිරීම බලධාරීන් බලය ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ යම් මට්ටමක අධීක්ෂණයක් ඇති බව සහතික කරයි.

---

https://www.cpalanka.org/wp-content/uploads/2020/03/Brief-Guide-I-_Evolving-Legal-Issues-in-the-Context-of- COVID-19.pdfUntitled

[129] ඉහත එම

**2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත**

වර්ෂ 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත ආපදාවක් ලෙස අර්ථ දක්වා ඇත්තේ 'ශ්‍රී ලංකාවේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකගේ ආරක්ෂාවට හෝ සෞඛ්‍යයට අන්තරාදායක වන්නා වූ හෝ අන්තරායකාරී වන බවට තර්ජනයක් පවතින්නා වූ නැතහොත්, යම් දේපළක් විනාශ කරන්නා වූ හෝ හානියට පමුණුවන්නා වූ හෝ විනාශ වන බවට හෝ හානි සිදුවන බවට හෝ තර්ජනයක් වන්නා වූ ද, ස්වාභාවික හෝ මිනිසා විසින් සිදු කරනු ලබන්නා වූ සිද්ධියක්, සැබැවින්ම සිදුවීම හෝ සිදුවීමට ආසන්න වීම' යනුවෙන් වන අතර ඊට (ඔ) වසංගතයක්' යන්න ද ඇතුළත් වේ. එබැවින්, කොවිඩ්-19 වසංගතය පිළිබඳ අර්බුදකාරී තත්ත්වය නිශ්චිත වශයෙන්ම මෙකී පනතේ විෂය පථයට අන්තර්ගත වේ.

මෙම පනතේ 3 වන වගන්තිය මගින් ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව ස්ථාපිත කිරීම සඳහා විධිවිධාන සලස්වා ඇති අතර එකී සභාවේ සාමාජිකත්වය සමන්විත වන්නේ :[130]

- ජනාධිපතිවරයා (සභාවේ සභාපතිවරයා විය යුත්තේය),
- අග්‍රාමාත්‍යවරයා,
- විපක්ෂ නායකවරයා,
- විවිධ විෂයයන් භාර අමාත්‍යවරුන්,
- පළාත්වල ප්‍රධාන අමාත්‍යවරුන් (හෝ පළාත් සභාව තේරී පත් වී නොමැති අවස්ථාවන්හි දී අදාළ පළාත් ආණ්ඩුකාරවරුන්), සහ
- පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් පස් දෙනෙකු (3(3) වගන්තිය).

විවිධ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් මෙහි සාමාජිකයන් බවට ඇතුළත් වීමෙන් ආපදා කළමනාකරණයට දායකත්වයක් ලබාදී තම පාලනය යටතේ පවතින විවිධ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය සහතික කරනු ඇත.

පහතින් සඳහන් කරනු ලබන කරුණු ද ඇතුළුව කාර්යයන් කිහිපයක් එකී සභාවේ කාර්ය කර්තව්‍යයන්ට අයත් වේ.[131]

- යම් ව්‍යසනයක් ඇති වූ විට, හදිසි ප්‍රතිචාර, යථාතත්විකරණය, සහන, පුනරුත්ථාපනය සහ ප්‍රතිසංස්කරණ කටයුතු පහසු කිරීම;
- ව්‍යසනයක් ඇති විය හැකි විටෙක සහ සැබැවින්ම ඇති වූ විටෙක දේශීය හා ප්‍රජා මට්ටමින් ස්වශක්තිය පහසු කිරීම සහ ඊට සහාය දීම, සහ
- අදාළ බලධාරීන්ගෙන් හා මණ්ඩලවලින් සහ 1993 අංක 58 දරන ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන අරමුදල පනත මගින් පිහිටුවන ලද ප්‍රතිසංස්කරණය සඳහා අරමුදල් වෙන් කිරීම නිර්දේශ කිරීම

තවද, ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානයක් පත් කිරීමට සභාව විසින් කළ යුතු වන අතර, 'ව්‍යසන කළමනාකරණයට අදාළ කටයුතු පිළිබඳ උචිත සංවිධාන වලට, රාජ්‍ය නොවන සංවිධාන වලට, දිසා ලේකම් කාර්යාලවලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට උපදෙස් සහ මාර්ගෝපදේශ නිකුත් කිරීම සහ එවැනි සංවිධාන සහ ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය වෙමින් වැඩසටහන් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම' ඇතුළු කාර්යයන් කිහිපයක් ඊට පවරා ඇත.[132]

කාර්ය සාධක බලකායට ඉටු කිරීමට පැවරී ඇති සියලුම කාර්යයන් මෙම විධිවිධාන මගින් දැනට පවතින නීතිය යටතේ ඉටු කිරීමට රජයට හැකියාව පවතී.

කාර්ය සාධක බලකායක් හරහා විස්තීරණ බලතල ක්‍රියාත්මක වන තත්ත්වවාදී ක්‍රමයට පක්ෂපාතීහු ඉදිරිපත් කරනු ලබන තර්කයක් වන්නේ මෙවැනි ආපදා හෝ හදිසි අවස්ථාවක දී කඩිනම් ක්‍රියාමාර්ග අවශ්‍ය බවයි. ව්‍යසන කළමනාකරණ පනතේ 11 වැනි වගන්තිය මගින් ජනාධිපතිවරයාට තමන්ගේම යෝජනාවක් මත හෝ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවේ උපදෙස් මත ව්‍යසන තත්ත්වයක් ප්‍රකාශ කිරීමට ඉඩ සලසන බැවින් එවැනි කඩිනම් ක්‍රියාමාර්ගයක් ගැනීමට මෙම පනත මගින් විධිවිධාන සලසා තිබීම විශේෂත්වයකි. එවන් අදාළ

---

130 ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, http://www.disastermin.gov.lk/web/index.php?option=com_content&view=article&id=51&Itemid=64&lang= en

131 වර්ෂ 2005 අංක 13 දරණ ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 4(ඈ), (එ) සහ (ච)

132 ඉහත එම, 8(2)(ඉ).

ප්‍රකාශනයක් දීර්ඝ කිරීම අවශ්‍ය වීමට පෙර මාස දෙකක් දක්වා ක්‍රියාත්මක විය හැකි අතර (11(2) වගන්තිය) එහි දී අදාළ ප්‍රකාශයෙන් පසුව පාර්ලිමේන්තුවේ පළමු රැස්වීමේදී එය ඉදිරිපත් කර අනුමත කළ යුතුය (11(3) වගන්තිය).

12 වැනි වගන්තියෙහි විධිවිධාන යටතේ, ව්‍යසන තත්වයක් ප්‍රකාශයට පත් කළ පසු, ජනාධිපතිවරයාට සුදුසු සංවිධානයක් (21 වගන්තිය යටතේ නම් කර ඇති පරිදි) වෙත;

> (අ) ව්‍යසනයේ හෝ ආසන්නතම ව්‍යසනයේ බලපෑම මැඩපැවැත්වීම සඳහා හෝ ඒ ව්‍යසනයේ හෝ ආසන්නතම ව්‍යසනයේ බලපෑම ලිහිල් කිරීම සඳහා, 11 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශනයක් කරන ලද්දේ යම් ප්‍රදේශයක් හෝ ප්‍රදේශ සම්බන්ධයෙන් ද, ඒ ප්‍රදේශය හෝ ප්‍රදේශ ඇතුළත පවත්නා අවශ්‍ය විය හැකි සියලුම සම්පත් මෙහෙයවීම, සම්බන්ධීකරණය කිරීම හා භාවිතා කිරීම;
>
> (ආ) අතිරේක සම්පත් ඇත්නම්, ඒ අතිරේක සම්පත් ලබාගත හැකි විටෙක, ඒ සම්පත් වෙන්කර දීම සම්බන්ධයෙන් ඇතිකර ගනු ලබන යම් වැඩපිළිවෙලට අනුකූලව ඒ අතිරේක සම්පත් මෙහෙයවීම, සම්බන්ධීකරණය කිරීම හා භාවිතා කිරීම; සහ
>
> (ඇ) ජනාධිපතිවරයා විසින් යම් උචිත සංවිධානයක් වෙත නිකුත් කරනු ලැබිය හැකි යම් විධිවිධානවලට අනුකූලව, අවස්ථාවෝචිත පරිදි, ජාතික ව්‍යසන කළමනාකරන සැලැස්මේ විධිවිධාන සලස්වා ඇති පරිදි යම් පියවර ගැනීම සඳහා ජනාධිපතිවරයා විසින් විධාන කරනු ලැබිය යුතුය.

මේ තත්ත්වයන් මත ජනාධිපතිවරයාට කඩිනමින් පුළුල් ක්‍රියාමාර්ග ගැනීමට ඉඩ සලසන සැලකිය යුතු බලතල පනත ප්‍රකාරව හිමි වේ. තාවකාලික කාර්ය සාධක බලකායක් හරහා නොව මෙම නීතිය හරහා ක්‍රියා කිරීමට ප්‍රමාණවත් කාලයක් ද තිබුණි. වර්ෂ 2020 ජනවාරි 28 වන දින වන විට රෝහල් 12 ක් ප්‍රතිකාර මධ්‍යස්ථාන ලෙස හඳුනාගෙන තිබූ අතර,[133] දෙවන තහවුරු කරන ලද කොවිඩ්-19 වෛරසය ආසාදිත වූ රෝගියා (සහ පළමු දේශීය රෝගියා) වර්ෂ 2020 මාර්තු 11 වන දින[134] හඳුනාගෙන ඇති අතර වර්ෂ 2020 මාර්තු 20 වන විට නිවාඩු කිහිපයක්[135] සහ දිවයිනටම බලපැවැත්වෙන පරිදි 'ඇඳිරි නීතිය' ප්‍රකාශයට පත් කර තිබුණි.[136] පවතින තත්ත්වය පාලනය කිරීමට ඒ වන විටත් පියවර ගණනාවක් ගෙන තිබූ පසුබිමක් තුළ කාර්ය සාධක බලකාය පත් කරනු ලැබුවේ වර්ෂ 2020 මාර්තු 26 වැනි දිනය. ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනත මත විශ්වාසය තබමින් - ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව කැඳවීම සහ ව්‍යසන කළමනාකරණ මධ්‍යස්ථානය සක්‍රීය කිරීම ඇතුළුව පියවර ගනු ලැබුවේ නම් වසංගත තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රතිචාර දැක්වීමේ කිසිදු ප්‍රමාදයක් ඇති නොවන්නට හැකියාව තිබුණි.

**අදාළ වෙනත් නීති**

කාර්ය සාධක බළකායට පවරා ඇති තනි කාර්යයන් ගණනාවක්, වර්තමානයේ ක්‍රියාත්මකව පවතින නීතීන් යටතේ ඇතැම් බලධාරීන්ට අයත් නිශ්චිත නිල කාර්ය කර්තව්‍යයන් වශයෙන් බලතල පැවරී තිබූ ඒවා වන අතර එවන් නීතීන්හි විධිවිධාන යටතේ එකී කාර්යයන් සිදු කළ හැකිව තිබුණි. එකී තත්ත්වයන් සම්බන්ධයෙන් බලාතික්‍රමණය පිළිබඳ ගැටලු සහගත අවස්ථාවන් ඇත්නම් ඒවා සම්බන්ධයෙන් ද අවධානය දක්වමින් අදාළ කරුණු පහත වගුව ඔස්සේ විස්තර කර තිබේ. කාර්ය සාධක බලකායේ කාර්යභාරය අර්බුදයට මුහුණ දීමේදී ගන්නා ඕනෑම ක්‍රියාමාර්ගයක් සාමූහික බව සහතික කිරීම සඳහා මෙම අධිකාරීන් මෙහෙයවීම, සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා සීමා වන්නේ නම්, එය මෙම නීති බලාතික්‍රමණය වන්නේ නැත. කෙසේ වෙතත්, මෙම ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීමට යොදවා ඇති නිල බලතල සහිත බලධාරීන් මඟ හරිමින් කාර්ය සාධක බලකාය මෙම බලතල තනිවම ක්‍රියාත්මක කිරීමට උත්සාහ කරන්නේ නම්, එම ක්‍රියාවන්හි නීත්‍යානුකූලභාවය ප්‍රශ්නකාරී වනු ඇත. කාර්ය සාධක බලකායේ අභිප්‍රාය ගැසට් පත්‍රයේ දක්වා ඇති පරිදි 'මෙහෙයවීම, සම්බන්ධීකරණය සහ පසු විපරම' නම්, 33 වැනි වගන්තිය යටතේ එයට බලතල ලබා දීම ඇත්තෙන්ම අසාමාන්‍ය දෙයකි. ඉදිරි සති සහ මාසවලදී මේ සම්බන්ධයෙන් වන තත්ත්වය හොඳින් අධ්‍යයනය කළ යුතුය.

---

133 සෞඛ්‍ය අමාත්‍යාංශය, වසංගත රෝග විද්‍යා අංශය, "තත්ත්ව වාර්තාව 2020.01.28" http://www.epid.gov.lk/web/images/pdf/corona virus report/sitrep-sl-eu-28-01.pdf පහත යොමුව හරහා සියලුම තත්ව වාර්තා ලබා ගත හැක. http://www.epid.gov.lk/web/index.php?option=com content&view=article&id=225&Itemid=480&lang=en

134 සෞඛ්‍ය අමාත්‍යාංශය, වසංගත රෝග විද්‍යා අංශය, "තත්ත්ව වාර්තාව 2020.03.12" http://www.epid.gov.lk/web/images/pdf/corona_virus_report/sitrep-sl-en-12-03_10.pdf

135 'රජය විසින් දින තුනක නිවාඩුවක් ප්‍රකාශයට පත් කරනු ලබයි., නිවුස් ෆස්ට්. https://www.newsfirst .lk/2020/03/17/government-declares-three-day-holiday/

136 'අද පස්වරු 06.00 සිට දිවයින පුරා ඇඳිරි නීතිය ක්‍රියාත්මකයි' නිවුස් ෆස්ට්. https://www.newsfirst .lk/2020/03/20/islandwide- curfew-will-be-in-effect-from-0600-pm-today/

| අංකය | කාර්යයන් | කාර්යයන් සක්‍රීය කරන විකල්ප නීති |
|---|---|---|
| 1 | වී, ධාන්‍ය වර්ග, එළවලු, පලතුරු, මාළු, මස්, කිරි සහ බිත්තර නිෂ්පාදනය මෙන්ම තේ, කුරුඳු, ගම්මිරිස් වැනි වැවිලි නිෂ්පාදන සඳහා ගොවිතැන් කටයුතු සඳහා ගොවීන්ට අවශ්‍ය පහසුකම් සැලසීම.<br><br>**විග්‍රහයඃ**<br><br>ගොවිජන සේවා පනත මඟින් ප්‍රාදේශීය මට්ටමින් ගොවිතැන් සඳහා පහසුකම් සැලසීමේ කාර්යය ඉටු කිරීම සඳහා පුළුල් රාමුවක් සපයයි. එසේම අපනයන කෘෂිකර්ම ප්‍රවර්ධන පනත වැවිලි භෝග නිෂ්පාදනය සඳහා රාමුවක් සපයයි. මෙම පවතින ආයතන භාවිතා නොකිරීමට හේතු පැහැදිලි නැති සේම මෙමගින් ඒ ඒ ව්‍යුහයන් යටතේ කටයුතු කරනු ලබන ක්‍රියාකාරීන්ගේ වැඩ කටයුතු එකිනෙක මත නැවත නැවත සිදුවීමට හේතු විය හැකි අතර එමගින් වගවීම සහ විනිවිදභාවය නොමැතිකම පිළිබඳ ගැටළු ඇති වේ. | 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත - කෘෂිකාර්මික භෝග සහ පශු සම්පත් නිෂ්පාදනය හැකිතාක් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස සිදු කිරීම සහතික කිරීමේ පනතකි.<br><br>● කාර්ය සාධක බලකායට ස්වකීය කාර්ය අංක 1 මගින් පාලනය ලබා දී ඇති සියලුම ගොවි කටයුතු ඇතුළත් වන විවිධ ක්‍රියාකාරකම් කෘෂිකර්මයට ඇතුළත් වේ (68 වන වගන්තිය)<br><br>● තම බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික කටයුතු සම්බන්ධීකරණය කිරීමට සහ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ගොවිජන සේවා කමිටුවලට බලය ඇත. (46 වන වගන්තිය)<br><br>● පනත යටතේ පත් කරන ලද වගා නිලධාරීන්ට තම බල ප්‍රදේශය තුළ කෘෂිකාර්මික හා සුළු වාරිමාර්ග කටයුතුවලට සම්බන්ධ සියලු කටයුතුවලට පෙනී සිටීමට බලය ඇත (55(2) වගන්තිය)<br><br>● පනත මඟින් ගොවිජන සේවා අරමුදලක් ස්ථාපිත කරයි. එයට මුදල් ගෙවිය හැකි ක්‍රම දෙකක් නම්, එවැනි මුදල් ප්‍රමාණයන් සඳහා පාර්ලිමේන්තුව ඡන්දය දීමෙන් සහ ඒකාබද්ධ අරමුදලින් ගෙවීමෙන් (60(2)(ඇ) සහ (ඈ) වගන්තිය). මෙම ක්‍රම දෙකම මහජන මුදල් පරිහරණය කරන ආකාරය සම්බන්ධයෙන් යම් ආකාරයක පාර්ලිමේන්තු අධීක්ෂණයක් ඇති බව සහතික කරයි. තවද, එම අරමුදලේ ගිණුම් එක් එක් මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපති විසින් විගණනය කළ යුතුය (60(5) වන වගන්තිය), අරමුදල් භාවිතා කරන ආකාරය පිළිබඳව වැඩිදුර විමර්ශනයක් සිදු කිරීමට ඉන් අවකාශය සැලසෙයි. |

| | | |
|---|---|---|
| | | 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්ම ප්‍රවර්ධනය කිරීමේ පනත<br><br>● වාර්ෂික නිෂ්පාදනයෙන් අවම වශයෙන් 50%ක් අපනයනය කරනු ලබන තේ, රබර්, පොල් සහ කජු හැර වෙනත් ඕනෑම බහු වාර්ෂික බෝගයක් නම්, පනත අදාළ වන අපනයන කෘෂිකාර්මික භෝග මොනවාද යන්න ප්‍රකාශ කිරීමට අමාත්‍යවරයාට බලය ඇත (2 වන වගන්තිය)<br><br>● දැනුම් දෙන ලද කෘෂිකාර්මික භෝගයක සැකසුම්කරුවෙකු, ගැනුම්කරුවෙකු, හිමිකරුවෙකු හෝ කපන්නෙකු ලෙස මෙම පනත යටතේ ලියාපදිංචි වී සිටින ඕනෑම පුද්ගලයෙකුට එම බෝගය සම්බන්ධයෙන් වාර්තා පවත්වාගෙන යාමට සහ එකී වාර්තා සැපයීමට අවශ්‍ය කරවීමට අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයාට බලය ඇත (6 වන වගන්තිය)<br><br>● දැනුම් දෙන ලද කෘෂිකාර්මික භෝග වගා කරන සහ සකස් කරන පුද්ගලයින්ට සහනාධාර සහ වෙනත් ආධාර, මූල්‍ය හෝ වෙනත් ආධාර ලබා දීම සඳහා යෝජනා ක්‍රම ලබා දීම ඇතුළු පනතේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් රෙගුලාසි සැකසීමට අමාත්‍යවරයාට බලය ඇත. මෙම රෙගුලාසි ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ යුතු අතර, අධීක්ෂණ මට්ටමක් සහතික කිරීම සඳහා අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය (වගන්තිය 15(1)-(3)). |

| | | |
|---|---|---|
| 2 | කෘෂිකාර්මික නිෂ්පාදන පාරිභෝගිකයින්ට සෘජුවම සැපයීම සඳහා ලංකා සතොස, සමුපකාර වෙළඳ ජාලය, කාගිල්ස්, කීල්ස්, ආර්පිකෝ සහ ලාෆ්ස් සිල්ලර ජාලය සංවිධානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.<br><br>**විග්‍රහයඃ**<br><br>'සංවිධානය කිරීම' සහ 'මෙහෙයවීම' යන වදන් වලින් මෙම සන්දර්භය තුළ අදහස් කෙරෙනුයේ කවරක්ද යන්න පැහැදිලි නැති අතර ඇඳිරි නීතිය පවතින කාලය තුළ මෙම භාණ්ඩ බෙදා හැරීම සඳහා පහසුකම් සැපයීමට සීමා වන්නේ නම් එහි අර්ථය අපැහැදිලිය. | 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු අධිකාරී පනත - අභ්‍යන්තර වෙළඳාම නියාමනය කිරීම සහ පාරිභෝගික කටයුතු අධිකාරිය බල ගැන්වීම.<br><br>● අධිකාරියේ අරමුණු අතරට හැකි සෑම විටම, පාරිභෝගිකයන්ට තරඟකාරී මිලට භාණ්ඩ හා සේවාවලට ප්‍රමාණවත් ප්‍රවේශයක් ලබාදීමට සහතික වීම (7(ඇ) වගන්තිය) සහ අසාධාරණ වෙළඳ පිළිවෙත්, සීමිත වෙළඳ පිළිවෙත් හෝ වෙළෙන්දන් විසින් සිදුකරන වෙනත් යම් ආකාරයක පාරිභෝගික සූරාකෑම්වලට එරෙහිව සහනයක් ලබාදීම (7(ඈ) වගන්තිය) ඇතුළත් වේ.<br><br>● යම් පංතියකට අයත් භාණ්ඩ සහ සේවා කිසිවක් සතුටුදායක තත්ත්වයකට ද සාධාරණ මිලකට ද සෑහෙන ප්‍රමාණයකට ද පාරිභෝගිකයාට ලබා ගත හැකි වන බවට සහතික වන පරිදි විකිණීම හෝ සැපයීම සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම භාර ගැනීමේ බලය අධිකාරියට ඇත (9 වන වගන්තිය).<br><br>● භාණ්ඩ කිසිවක් ලේබල් කිරීම, මිල ලකුණු කිරීම, ඇසිරීම, විකිණීම හෝ සෑදීම සම්බන්ධයෙන් සාදන්නන්ට හා වෙළෙඳුන්ට සාමාන්‍ය විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර ඒ භාණ්ඩ විකිණිය හැකි වේලාවන් හා එසේ විකිණිය හැකි ස්ථාන සහ භාණ්ඩ කිසිවක් සෑදීම, ආනයනය කිරීම, අලෙවි කිරීම, ගබඩා කිරීම, විකිණීම හා රැස්කිරීම පිළිබඳ වෙනත් යම් කොන්දේසි නිශ්චිතව සඳහන් කෙරෙන විශේෂ විධාන යම් පන්තියකට අයත් සාදන්නන් හෝ වෙළෙඳුන් වෙත නිකුත් කිරීම් බලය අධිකාරියට ඇත (10 වන වගන්තිය). මෙම කර්තව්‍යය යටතේ කාර්ය සාධක බලකාය විසින් සිදු කළ හැකි සමහර ක්‍රියා සඳහා මෙම මඟපෙන්වීම් ඔස්සේ විකල්පයක් සැපයිය හැකිය.<br><br>● කිසිම වෙළෙන්දකු විසින් යම් භෘණ්ඩයක් ඒ වෙලෙන්දගේ සාමාන්‍ය වෙළෙඳ අවශ්‍යතාවයන් ඉක්මවන ප්‍රමාණයකින් ඔහුගේ වෙළෙඳ ව්‍යාපාරික ස්ථානයෙහි හෝ වෙනත් යම් ස්ථානයක හෝ සඟවා තබා ගැනීම මෙම පනත යටතේ වරදකි (17 වන වගන්තිය). |

| | | |
|---|---|---|
| 4 | අත්‍යවශ්‍ය වියළි ආහාර, ඖෂධ ආනයනය මෙන්ම අපනයනය කරනු ලබන තේ, සනීපාරක්ෂක ඇඳුම් වැනි අපනයනයන් පහසු කිරීම සඳහා ශ්‍රී ලංකා වරාය, ශ්‍රී ලංකා රේගුව, ආයතනික බැංකු කටයුතු සහ අනෙකුත් රාජ්‍ය නියාමන ආයතන සම්බන්ධීකරණය හා අවශ්‍ය තීරණ ක්‍රියාත්මක කිරීම. | ● 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරාය අධිකාරී පනතේ 6 වැනි වගන්තිය යටතේ ඕනෑම නිශ්චිත වරායකට කාර්යක්ෂම හා විධිමත් සේවා සැපයීම වරාය අධිකාරියේ යුතුකම වන අතර, අධිකාරියට උපදෙස් දීමට ඇමතිවරයාට බලය ඇත.<br><br>● අමාත්‍යවරයා විසින් ජාතික අවශ්‍යතාවයට බලපාන බව පෙනෙන කරුණු සම්බන්ධයෙන් එහි කාර්යයන් ඉටු කිරීම සහ එහි බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ සාමාන්‍ය හෝ විශේෂ උපදෙස් ලිඛිතව ලබා දිය හැකි අතර අධිකාරිය එම උපදෙස් බලාත්මක කළ යුතුය (8(1) වගන්තිය)<br><br>● 1869 අංක 17 දරන ශ්‍රී ලංකා රේගු ආඥාපනතේ 103 වගන්තිය යටතේ  නැව් තුළට සහ පිටතට ඇතුළුවීම සහ ඔවුන් විසින් භාණ්ඩ ගොඩබෑම, නැව්ගත කිරීම සහ ප්‍රවාහනය කිරීම සම්බන්ධයෙන් කලින් කලට විශේෂ රෙගුලාසි සැකසීමට අමාත්‍යවරයාට බලය ඇත.<br><br>● 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත යටතේ (NMRA), ඖෂධ, වෛද්‍ය උපකරණ සහ ඖෂධීය ආහාර නිෂ්පාදන ආනයනය සම්බන්ධ සියලු දේ සඳහා මධ්‍යම නියාමකයා ලෙස ජාතික ඖෂධ නියාමන අධිකාරිය ක්‍රියා කරයි (3(ආ) වගන්තිය). ඖෂධ ආනයනය කිරීම සම්බන්ධයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරිය හට නියාමනය කිරීමට සහ බලපත්‍ර නිකුත් කිරීමට බලය ඇත. මෙම ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු වන්නේ එය ලිඛිත නීතියක් වන නිසාත්, ජාතික ඖෂධ නියාමන අධිකාරිය යනු කුමන ඖෂධ සහ අවශ්‍ය ප්‍රමාණවලින්ද යන්න පිළිබඳ දැනුමක් ඇති විෂය කරුණු පිළිබඳ විශේෂඥයන් වන නිසාත් ය (14 (ඉ) සහ (ඇ) වගන්ති).<br><br>● 1969 අංක 1 දරන ආනයන සහ අපනයන (පාලන) පනතට අනුව ඕනෑම භාණ්ඩයක් රටට හෝ රටෙන් ආනයනය කිරීම හෝ අපනයනය කිරීම අධිකාරිය යටතේ හෝ පනත යටතේ ආනයන හා අපනයන පාලක විසින් නිකුත් කරන ලද බලපත්‍රයක කොන්දේසිවලට අනුකූලව සිදු කළ යුතුය (4 (1) (වගන්තිය)). තවද, මෙම අවශ්‍යතා වලින් ඇතැම් භාණ්ඩ නිදහස් කිරීමේ රෙගුලාසි ඇතිකළ හැකිය (4(3) වගන්තිය).<br><br>● ඕනෑම පුද්ගලයෙකුට ලබා දී ඇති බලපත්‍රයක්, බලපත්‍රයේ දක්වා ඇති කොන්දේසිවලට සහ මෙම පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ ඇති ඕනෑම රෙගුලාසියකට යටත්ව, බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණයෙන් හෝ ප්‍රමාණයෙන් එවැනි වටිනාකමකින් යුත් භාණ්ඩ එම පුද්ගලයාට ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කිරීමට අවසර දිය යුතුය (8 වන වගන්තිය).<br><br>● අත්‍යවශ්‍ය මහජන සේවා පනතේ 2(1) වගන්තිය යටතේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, පළාත් පාලන ආයතන හෝ සමුපකාර සමිති මගින් සපයනු ලබන සේවාවන් අත්‍යවශ්‍ය මහජන සේවාවන් වශයෙන් ප්‍රකාශ කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත.<br><br>● මෙම පනතේ 2(2) වගන්තිය යටතේ, එවැනි සේවාවක් පවත්වාගෙන යාමට බාධා කරන හෝ අවහිර කරන හෝ වෙනත් අයෙකුට එම කාර්යයට සහභාගී වීමට බල කරන හෝ දිරිමත් කරන ඕනෑම පුද්ගලයෙකු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයෙන් පසුව වරදකරු වීම මත බරපතල සිරදඬුවමකින් හෝ දඩයකින් හෝ දඬුවම් ලැබිය යුතු වරදක් කරයි. |

| | | |
|---|---|---|
| 6 | අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා පාරිභෝගිකයන්ට ලබා දෙන ලොරි, ත්‍රිවීල්, බස් රථ, මෝටර් සයිකල් වල යෙදෙන රියදුරන් හා සහායකයින් ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක කටයුතු සඳහා පහසුකම් සැලසීම හා අවශ්‍ය ඉන්ධන ලබා ගැනීමට පොලිස් ඇඳිරි නීතිය පැවැත්වෙන කාලය තුළ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෝරාගත් ඉන්ධන පිරවුම්හල් විවෘතව තැබීම හා අවශ්‍ය ඉන්ධන ලබා දීම. | 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව පනත යටතේ, මුදල් අමාත්‍යවරයා සමඟ එකඟව, පෙට්‍රෝලියම්/ඛනිජ තෙල් මිල නියෝග (66(1) වගන්තිය) ලෙස හැඳින්වෙන ඇතැම් නියෝග සිදු කිරීමට අමාත්‍යවරයාට අවසර දෙයි. පනතේ 66(2) වගන්තියට අනුව, ඕනෑම ඛනිජ තෙල් විකිණීම, සැපයීම හෝ බෙදා හැරීමේ කොන්දේසි ද මෙම නියෝග යටතේ නියම කළ හැක. මේ අනුව පෙනී යන්නේ තෝරාගත් ඉන්ධන පිරවුම්හල් විවෘතව තැබීමට නියෝග කිරීමේ බලය ඉහත කී අමාත්‍යවරුන්ට හිමිවන බවයි. |

| | | |
|---|---|---|
| 7 | ගොවිතැන් කටයුතු සඳහා අවශ්‍ය බීජ, පැලෑටි, පොහොර, උපකරණ ලබා දීමට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, සමෘද්ධි අධිකාරිය, සමුපකාර ගොවි සමිති, ගොවි සංවිධාන, පෞද්ගලික බීජ නිෂ්පාදන ආයතන මෙහෙය වීම හා අවශය පහසුකම් සැපයීම.<br><br>විග්‍රහයː<br><br>ගොවිතැන සඳහා මෙම පහසුකම් සැපයිය හැක්කේ කාටද යන්න මෙම කාර්යය යටතේ නිශ්චිතව දක්වා නොමැත; එය ගොවීන්ට පමණක් නම් හෝ සන්නද්ධ ආරක්ෂක අංශ වැනි වෙනත් ආයතනවලට ලබා දිය හැකි නම් ගොවිතැන් කටයුතු කරගෙන යාමට එවන් අය සඳහා ද මෙය අදාළ විය හැක. | 2003 අංක 22 දරන බීජ පනත ඔස්සේ බීජ හා රෝපණ ද්‍රව්‍යවල ගුණාත්මකභාවය නියාමනය කිරීම අරමුණු කර ඇති අතර ඊට සම්බන්ධිත තවත් කරුණු කිහිපයක් සම්බන්ධයෙන් එකී පනත අදාල වේː<br><br>● පනත මගින් ජාතික බීජ සභාව පිහිටුවනු ලබන අතර එහි කාර්යයන් අතර උසස් තත්ත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා බෙදා හැරීම සහතික කිරීම සඳහා මාර්ගෝපදේශ ස්ථාපිත කිරීම සහ ගොවීන්ට බීජ නිෂ්පාදනය හා සැපයීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට සහ අනෙකුත් අදාළ බලධාරීන්ට උපදෙස් දීම ඇතුළත් වේ (6 (අ) සහ (ඇ) වගන්තීන්).<br><br>● සභාවේ බලතල වලට, බීජ හා රෝපණ ද්‍රව්‍යවල අවශ්‍යතාවය හඳුනා ගැනීම සහ ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සඳහා තාක්ෂණික සහාය සැපයීමට පහසුකම් සැලසීම; පුද්ගලික අංශයේ බීජ කර්මාන්තයේ දියුණුව සඳහා කටයුතු කිරීමේදී රාජ්‍ය අංශයේ ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම; සහ අරමුදල් සහ මිනිස් බලය සුරක්ෂිත කිරීම ඇතුළත් වේ. |

**නිගමනය**

ඉහතින් පෙන්වා දී ඇති පරිදි, කාර්ය සාධක බලකායට පවරා ඇති කාර්යයන් ඉටු කිරීම සඳහා දැනටමත් ක්‍රියාත්මකව පවතින නීති රාශියක් ඇති අතර කාර්ය සාධක බලකායට ලබා දී ඇතැයි කියනු ලබන බලතල ඇත්ත වශයෙන්ම බලාතික්‍රමණය විය හැකිය. එවැනි පුළුල් කාර්ය කර්තව්‍යන් සහිත කාර්ය සාධක බලකායක් පිහිටුවීමට 33(2) වගන්තිය මත පදනම්ව සිදුකළ හැකිද යන්න මූලික වශයෙන්ම මතු කළ යුතු ප්‍රශ්නයකි. කාර්ය සාධක බලකාය විසින් නියම කරන ලද ක්‍රියාවන්හි නීත්‍යානුකූලභාවය, සුජාතභාවය පිළිබඳ ප්‍රශ්න මතු කළ හැකි අතර ඒ ඔස්සේ අනපේක්ෂිත ප්‍රතිවිපාක උද්ගත වියහැකි වීමද ඇතුළත් වන බැවින් ඒ සම්බන්ධයෙන් හදිසි අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ.

කොවිඩ්-19 අර්බුදය කාර්යක්ෂමව සහ කඩිනමින් විසඳා ගැනීම අත්‍යවශ්‍ය වන නමුත් එය අන්ධ ලෙස අත්තනෝමතික ඒකාධිපති පාලනයක් කරා ගමන් කිරීම සාධාරණීකරණය නොකරයි. අනාගත හදිසි අවස්ථා වලදී ප්‍රතිචාර දැක්වීම සඳහා ක්‍රියාමාර්ග ක්‍රියාත්මක බව සහතික කිරීම සඳහා ව්‍යුහයන් හඳුන්වා දීමත් සමඟ ශ්‍රී ලංකාව වසර ගණනාවක් හදිසි අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීම සහ ඒවා සම්බන්ධයෙන් කටයුතු කර ඇත. විනිවිදභාවයේ සහ වගවීමේ අවශ්‍යතාවය තහවුරු වූ අතීත අවස්ථා වලින්ද පාඩම් උගෙන ඇත. මේ අනුව, අධීක්ෂණය සහ වගවීම සහතික කිරීම, වත්මන් හදිසි අවස්ථාවට ඵලදායී ලෙස කටයුතු කිරීමට අවශ්‍ය අරමුදල් සැපයීම සහ වත්මන් සන්දර්භය තුළ අවශ්‍ය වෙනත් ඕනෑම ක්‍රියාමාර්ගයක් සඳහා පාර්ලිමේන්තුව නැවත කැඳවීම අතිශයින්ම වැදගත් වේ.

## ඇමුණුම III

# ලුහුඬු මාර්ගෝපදේශ III

# කොවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් ඇඳිරි නීතියඃ

# ශ්‍රී ලංකාවේ නෛතික රාමුව සහ අදාළ ප්‍රශ්න

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
වර්ෂ 2020 අප්‍රේල් 21 දින

මහජන සෞඛ්‍යය, ජාතික ආරක්ෂාව, මහජන ආරක්ෂාව සහතික කිරීම සහ වෙනත් එවැනි කරුණු වැනි විශාල මහජන අරමුණක් සැලකිල්ලට ගනිමින්, නිශ්චිත වේලාවන් තුළ ජනතාව නිවෙස් තුළ රැඳී සිටිය යුතු බවට වන රජයේ රෙගුලාසියක් ලෙස සාමාන්‍යයෙන් වටහාගෙන ඇති ඇඳිරි නීතිය, නිදහස් ගමන් බිමන්වලට මූලික නිදහස සීමා කිරීමේ මාධ්‍යයකි. එවැනි සීමා කිරීම් අනුමත කළ හැකි වුවද, ඒවා නීත්‍යානුකූලභාවය සහ අවශ්‍ය ප්‍රමාණයට පමණක් භාවිත කිරීමේ සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මවලට අනුකූල විය යුතුය. ශ්‍රී ලංකාවේ ඇඳිරි නීතිය පැනවීමේ බලය ක්‍රියාත්මක කර ඇත්තේ විධායක ජනාධිපතිවරයා සහ පොලිසිය විසිනි.

වර්ෂ 2020 මාර්තු 20 වන දින ශ්‍රී ලංකා රජය 'ඇඳිරි නීතිය' පැනවීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයක් නිකුත් කළේය. මහජන සෞඛ්‍ය හදිසි තත්ත්වය හේතුවෙන් ගමනාගමනයට එවැනි සීමා පැනවීමට හේතුව සම්බන්ධයෙන් ප්‍රශ්න කර නොමැති අතර, එවැනි 'ඇඳිරි නීතිය' පැනවීමක් සඳහා පදනම වශයෙන් යොදාගත් නීතිමය කවරක් ද යන්න පෙන්වා දීමට රජය අපොහොසත් වී ඇති අතර එ ඔස්සේ එහි නීත්‍යානුකූලභාවය පිළිබඳ ප්‍රශ්න ඉස්මතු කරයි.[137] පහත දැක්වෙන්නේ වර්තමානයේ බලපැවැත්වෙන ඇඳිරි නීතියට අදාළ කාලරාමුව පිළිබඳ කෙටි සටහනකි.

→ **2020 මාර්තු 18**: පුත්තලම දිස්ත්‍රික්කයේ සහ මීගමුව කොච්චිකඩේ පොලිස් වසමේ පොලිස් ඇඳිරි නීතිය නැවත දැනුම් දෙන තුරු.[138]

→ **2020 මාර්තු 19**: ජා-ඇල සහ වත්තල පොලිස් වසම් තුළ ඇඳිරි නීතිය පනවා තිබියදී පුත්තලම, හලාවත, මීගමුව-කොච්චිකඩේ යන ප්‍රදේශයන්හි පොලිස් ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කෙරේ.[139]

→ **2020 මාර්තු 20**: 2020 මාර්තු 23 දක්වා දිවයින පුරා ඇඳිරි නීතිය පනවා ඇත.[140]

→ **2020 මාර්තු 23**: දිවයිනේ පනවා තිබූ ඇඳිරි නීතිය දිස්ත්‍රික්ක 8 ක් හැර පැය 8 ක කාලයක් සඳහා තාවකාලිකව ඉවත් කෙරේ.[141]

---

[137] වැඩබලන පොලිස්පතිවරයා විසින් නිකුත් කරන ලද මාධ්‍ය නිවේදනයේ දැක්වෙන්නේ නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත ප්‍රකාරව නිරෝධායනයේ විධිවිධාන සහ රෙගුලාසි උල්ලංඝණය වීම වැළැක්වීමේ අරමුණින් මුළු දිවයිනටම 'පොලිස් ඇඳිරි නීතිය' පනවා ඇති බවයි. කෙසේ වෙතත් එවැනි ඇඳිරි නීති තත්ත්වයක් පැනවීම සිදුකළ නීතිමය පදනම පිළිබඳව පෙන්වා දී නොමැත.
බලන්න, '2020.03.20 වන දින මාධ්‍ය නිවේදනය' (රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 2020)
<https://www.dgi.gov.lk/news/press-releases-sri-lanka?start=5> 2020 අප්‍රේල් මස 15 වන දින ප්‍රවේශ විය.

[138] 'පුත්තලම, හලාවත සහ මීගමුව-කොච්චිකඩේ ප්‍රදේශ සඳහා පොලිස් ඇඳිරි නීතිය පැනවේ' (*Adaderana.lk*, 2020)
<http://www.adaderana.lk/news.php?nid=61497> 2020 අප්‍රේල් මස 14 වන දින ප්‍රවේශ විය.

[139] 'පුත්තලම, හලාවත සහ මීගමුව-කොච්චිකඩේ ප්‍රදේශ සඳහා පනවා තිබූ පොලිස් ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කිරීමට නියමිතය' (*Adaderana.lk*, 2020)
<http://www.adaderana.lk/news.php?nid=61526> 2020 අප්‍රේල් මස 14 වන දින ප්‍රවේශ විය

[140] 'සඳුදා දක්වා දිවයින පුරා ඇඳිරි නීතිය පනවනු ලබයි' (*Adaderana.lk*, 2020)
<http://www.adaderana.lk/news.php?nid=61577> 2020 අප්‍රේල් මස 14 වන දින ප්‍රවේශ විය.

[141] 'දිස්ත්‍රික්ක 8ක් හැර ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කෙරේ' (*Adaderana.lk*, 2020)
<http://www.adaderana.lk/news.php?nid=61707> 2020 අප්‍රේල් මස 14 වන දින ප්‍රවේශ විය.

→ **2020 මාර්තු 24:** දිස්ත්‍රික්ක 8 ක ඇඳිරි නීතිය පැය 8 ක කාලයක් සඳහා තාවකාලිකව ඉවත් කෙරේ. කොවිඩ්-19 අධි අවදානම් ප්‍රදේශ ලෙස කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්ක හඳුනාගෙන ඇති අතර එම දිස්ත්‍රික්කවලට පනවා ඇති ඇඳිරි නීතිය නැවත දැනුම් දෙන තුරු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට නියමිතය.[142]

→ **2020 මාර්තු 30:** දිස්ත්‍රික්ක 6ක් හැර සෙසු ප්‍රදේශවල ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කෙරේ.[143]

→ **2020 අප්‍රේල් 6:** දිස්ත්‍රික්ක 6ක් හැර සෙසු ප්‍රදේශවල ඇඳිරි නීතිය පැය 8කට තාවකාලිකව ඉවත් කෙරේ.[144]

→ **2020 අප්‍රේල් 7:**ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම සඳහා නව රෙගුලාසි සඳහන් චක්‍රලේඛය ප්‍රකාශයට පත් කරන බව ජනාධිපති මාධ්‍ය අංශය මගින් නිවේදනය කළේය.[145] [146]

→ **2020 අප්‍රේල් 9**: දිස්ත්‍රික්ක 19ක ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කෙරේ.[147]

→ **2020 අප්‍රේල් 16:** දිස්ත්‍රික්ක 19ක ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කෙරේ.[148]

→ **2020 අප්‍රේල් 19:** දිස්ත්‍රික්ක කිහිපයක සහ පොලිස් බලප්‍රදේශ කිහිපයක දැනට ක්‍රියාත්මක ඇඳිරි නීතිය ලිහිල් කිරීමට රජය තීරණය කරයි.[149]

→ **2020 අප්‍රේල් 20:** අප්‍රේල් 22 දින (දිස්ත්‍රික්ක 4ක) ඉවත් කිරීමට නියමිතව තිබූ ඇඳිරි නීතිය අප්‍රේල් 27 දින දක්වා දීර්ඝ කෙරේ.[150]

මෙම ලුහුඬු මාර්ගෝපදේශය සකස් කරනු ලබන අවස්ථාව වන විට, සමහර ප්‍රදේශවල දැනට පවතින 'ඇඳිරි නීතිය' ලිහිල් කිරීමට රජය විසින් පියවර ගෙන ඇති නමුදු,[151] ඒ අන්දමින් 'ඇඳිරි නීතිය' පැනවීම සඳහා භාවිතා කරන ලද ව්‍යවස්ථාදායක රාමුව පිළිබඳව තවමත් ප්‍රසිද්ධියේ ප්‍රවේශ විය හැකි තොරතුරු නොමැත. මෙම තොරතුරු නොමැති පසුබිමක, 'ඇඳිරි නීතිය' නීත්‍යානුකූලව වලංගු වේද යන්න පිළිබඳව ප්‍රශ්න ඉස්මතු වේ. 'ඇඳිරි නීතිය' උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන ඇති පුද්ගලයින් 33,155[152] දෙනෙකුට එරෙහිව නඩු පැවරීමට උත්සාහ කළහොත් සහ ඉදිරි සති සහ මාසවලදී ඇඳිරි නීතිය අඛණ්ඩව / පැනවීමේ අවශ්‍යතාවයක් මතු

---

142 කොළඹ, ගම්පහ සහ කළුතර යන දිස්ත්‍රික්ක කොවිඩ්-19 අධි අවදානම් කලාප වශයෙන් වර්ගීකරණය කරන ලදි; නැවත දැනුම් දෙනතුරු ඇඳිරි නීතිය' (*Adaderana.lk*, 2020) <http://www.adaderana.lk/news.php?nid=61771> 2020 අප්‍රේල් මස 14 වන දින ප්‍රවේශ විය.

143 'දිස්ත්‍රික්ක 6ක් හැර ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කෙරේ' (*Adaderana.lk*, 2020) <http://www.adaderana.lk/news.php?nid=62017> 2020 අප්‍රේල් මස 14 වන දින ප්‍රවේශ විය.

144 'දිස්ත්‍රික්ක 6ක ඇඳිරි නීතිය නැවත දැනුම් දෙනතුරු අඛණ්ඩව ක්‍රියාත්මක වේ' (*Adaderana.lk*, 2020) <http://www.adaderana.lk/news.php?nid=62269> 2020 අප්‍රේල් මස 14 වන දින ප්‍රවේශ විය.

145 'ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීමේ නව රෙගුලාසි ප්‍රකාශයට පත් කෙරේ' (*Adaderana.lk*, 2020) <http://www.adaderana.lk/news.php?nid=62368> 2020 අප්‍රේල් මස 14 වන දින ප්‍රවේශ විය.

146 'ඇඳිරි නීති බලපත්‍ර සඳහා උපදෙස් Pdf' (*www.police.lk*, 2020) <https://drive.google.com/file/d/1pctm6WXKu2FJaf 7axPiQDs6KNErX4nmg/view>2020 අප්‍රේල් මස 9 වන දින ප්‍රවේශ විය.

147 'දිස්ත්‍රික්ක 19ක ඇඳිරි නීතිය තාවකාලිකව ඉවත් කෙරේ' (*Adaderana.lk*, 2020) <http://www.adaderana.lk/news.php?nid=62420> 2020 අප්‍රේල් මස 15 වන දින ප්‍රවේශ විය.

148 'දිස්ත්‍රික්ක 19ක ඇඳිරි නීතිය පස්වරු 4 දක්වා තාවකාලිකව ලිහිල් කෙරේ'. (*Adaderana.lk*, 2020) <http://www.adaderana.lk/news.php?nid=62672> 2020 අප්‍රේල් මස 18 වන දින ප්‍රවේශ විය.

149 'දිස්ත්‍රික්ක කිහිපයක සහ පොලිස් බල ප්‍රදේශ කිහිපයක ඇඳිරි නීතිය ලිහිල් කෙරේ' (*Adaderana.lk*, 2020) <http://www.adaderana.lk/news.php?nid=62771> 2020 අප්‍රේල් මස 18 වන දින ප්‍රවේශ විය.

150 අනෙකුත් සියලුම දිස්ත්‍රික්කවල ඇඳිරි නීතිය අප්‍රේල් 24 සිකුරාදා දින දක්වා රාත්‍රී 8.00 සිට අලුයම 5.00 දක්වා ක්‍රියාත්මක වේ. 'කොළඹ, ගම්පහ, කළුතර, පුත්තලම දිස්ත්‍රික්කවල ඇඳිරි නීතිය අප්‍රේල් 27 දින දක්වා දීර්ඝ කෙරේ' බලන්න (*Adaderana.lk*, 2020) <http://www.adaderana.lk/news/62818/curfew-in-colombo-gampaha-kalutara-puttalam-districts-extended-till-april-27> 2020 අප්‍රේල් මස 20 වන දින ප්‍රවේශ විය.

151 'සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා ඇඳිරි නීති රෙගුලාසි ලිහිල් කෙරේ - ජනාධිපති මාධ්‍ය අංශය' (ජනාධිපති මාධ්‍ය අංශය, 2020) <http://www.pmdnews.lk/curfew-regulations-relaxed-to-restore-normalcy-in-civilian-life/> 2020 අප්‍රේල් මස 19 වන දින ප්‍රවේශ විය.

152 2020 මාර්තු 20 වැනි දින සිට ඇඳිරි නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සිදු කර ඇති මුළු අත්අඩංගුවට ගැනීම් සංඛ්‍යාව (2020.04.19 දින පෙ.ව. 6.00 වන විට), 'ශ්‍රී ලංකාව : පසුගිය පැය 24 තුළ ඇඳිරි නීතිය කඩ කළ පුද්ගලයන් 1,475ක් පොලිස් අත්අඩංගුවට', බලන්න (*Colombopage.com*, 2020) <http://www.colombopage.com/archive_20A/Apr19_1587309025CH.php> 2020 අප්‍රේල් මස 20 වන දින ප්‍රවේශ විය.

වුවහොත් තවදුරටත් මෙය රාජ්‍ය නිලධාරීන්ට දුෂ්කරතා ගණනාවක් ඉස්මතු කරන අන්දමේ ගැටළුකාරී තත්ත්වයක් බවට පත්වනු ඇත.

මෙම ලුහුඬු මාර්ගෝපදේශය තුළ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ඇඳිරි නීතිය පැනවීම සම්බන්ධයෙන් අදාළ වන නීතිමය රාමුව සහ ඊට අදාළව අවධානය යොමු කළ යුතු අදාළ ප්‍රශ්න සම්බන්ධයෙන් කෙටියෙන් විමසා බලනු ලබයි. සංචරණ සීමා කිරීම් ද ඇතුළුව කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මෙහි දී සටහන් කරන අතරම, ඒ අන්දමින් ගනු ලබන ඕනෑම පියවරක් ව්‍යවස්ථාපිත හා නීතිමය රාමුවට අනුගත වී සිදු කිරීම ඉතා වැදගත් බවද මෙහිදී අවධාරණය කරයි.

**විධායක ජනාධිපතිවරයා විසින් පනවන ලද ඇඳිරි නීතිය**

ඇඳිරි නීතිය පැනවීමට ජනාධිපතිවරයාට ඇති බලය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ[153] සහ මහජන ආරක්ෂක ආඥාපනතෙහි[154] දක්වා ඇත.

මහජන ආරක්ෂක ආඥාපනතේ ඇඳිරි නීතිය පැනවීම හඳුන්වන්නේ 'ජනාධිපතිවරයාගේ විශේෂ බලයක්' ලෙසයි.[155] මහජන ආරක්ෂක ආඥාපනතේ 16 වැනි වගන්තියේ ඇඳිරි නීතිය පැහැදිළිව පිළිගන්නා අතර, ජනාධිපතිවරයා විසින් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයක් මගින් නිශ්චිත ප්‍රදේශයක පුද්ගලයන්ට, එවන් නියෝගයක් ප්‍රකාරව දෙන ලද බලයලත් එවැනි පුද්ගලයෙකු විසින් ලබා දෙන ලිඛිත අවසර පත්‍රයකයක් යටතේ හැර, එමගින් නියම කළ හැකි කාලයක් සඳහා පොදු ස්ථානවල සිටීම තහනම් කළ හැකිය. එවැනි නියෝගයක් ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියා පටිපාටියෙහි අවශ්‍යතා සපුරාලීමෙන් පසු ඇඳිරි නීතිය පැනවීමට ජනාධිපතිවරයාට ඇති බලය මෙම වගන්තිය පැහැදිලිවම පිළිගනී. එවැනි නියෝගයක් උල්ලංඝනය කිරීම දඩ සහ/හෝ සිරගත කිරීමකින් දඬුවම් ලැබිය හැකි වරදක් බව එම වගන්තියෙහි විධිවිධාන මගින් තවදුරටත් පෙන්වා දෙනු ලබයි.

16 වගන්තිය

*(1) කිසියම් ප්‍රදේශයක මහජන සාමය පවත්වාගෙන යාම සඳහා එසේ කිරීම අවශ්‍ය යැයි ජනාධිපතිවරයා සලකන විට, එම නියෝගයෙන් හෝ ඉන් පසුව සිදු කළ හැකි මේ වගන්තිය යටතේ පනවනු ලබන වෙනත් නියෝගයක් යටතේ වන යම් නිදහස් කිරීම්වලට යටත්ව, ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයක් මගින් එම ප්‍රදේශයේ කිසිදු තැනැත්තෙකු, නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පැය අතර, අධිකාරිය යටතේ නියෝගයේ සඳහන් කළ හැකි එවැනි පුද්ගලයෙකු විසින් ලබා දෙන ලිඛිත අවසර පත්‍රයක් හැර, ඕනෑම පොදු මාර්ගයක, දුම්රිය, පොදු උද්‍යානයක, පොදු විනෝදාත්මක භූමියක හෝ වෙනත් පොදු භූමියක හෝ මුහුදු වෙරළක නොසිටිය යුතුය.*

*(3) යම් තැනැත්තෙකු මෙම වගන්තිය යටතේ කරන ලද නියෝගයක් උල්ලංඝනය කරන්නේ නම්, ඔහු වරදකට වැරදිකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු පටිපාටියෙහි නඩු විභාගයකින් පසුව වරදකරු වීම මත, මාසයකට නොවැඩි කාලයක් සඳහා බරපතල සිරදඬුවමකට හෝ රුපියල් සියය නොඉක්මවන දඩයකට හෝ එම සිරදඬුවම සහ දඩය යන දෙකටම යටත් විය යුතුය.*

නියෝගයක් අවශ්‍ය පරිදි ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කළ පසු, එය ප්‍රකාශයට පත් කළ දින සිට (ගැසට් පත්‍රයේ) මාසයක කාලයක් ක්‍රියාත්මක වේ. නමුත් එම කාලසීමාව අවසන් වීමට පෙර නියෝගය අවලංගු කිරීමට හෝ එම කාලසීමාව අවසන් වන අවස්ථාවේ දී හෝ අවසන් වීමට පෙර තවත් එවන් නියෝගයක් සිදු කිරීමට හැකිය.[156]

වඩාත් වැදගත් වන්නේ, 21 වැනි වගන්තියේ (2) උපවගන්තිය මගින් පෙන්වන පරිදි, හදිසි අවස්ථා ප්‍රකාශයක්[157] පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු ආකාරයටම එම නියෝගය පාර්ලිමේන්තුවට දන්වා යැවිය යුතු බවයි.

[153] 1978 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මින්මතු 'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව' ලෙස හැඳින්වේ.

[154] 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥාපනත

[155] 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥාපනතේ III වන කොටස

[156] 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥාපනතේ 21 වන වගන්තිය

[157] 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තිය ප්‍රකාරව බලපවත්වන ලදී

*21(2) වගන්තිය*

*(2) 2 වන වගන්තියේ (3) උපවගන්තියේ විධිවිධාන, 2 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයකට අදාළ වන ආකාරයටම, 12 වැනි වගන්තිය, 16 වැනි වගන්තිය හෝ 17 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගයකට අදාළ විය යුතුය.*

16 වැනි වගන්තිය ප්‍රකාරව ඇඳිරි නීතිය පැනවීමේ නියෝගයක් හදිසි නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේදී කරන ලද ප්‍රකාශයකට අදාළ වන ක්‍රියා පටිපාටිය (2(3) වගන්තිය) අනුගමනය කිරීම අවශ්‍ය බව ඉහත විධිවිධානවල සඳහන් වේ.

*වගන්තිය 2(3)*

*(3) මෙම වගන්තියේ ප්‍රතිපාදන යටතේ ප්‍රකාශනයක් කරනු ලබන අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් වහාම පාර්ලිමේන්තුවට දන්වනු ලැබිය යුතු අතර, එදින සිට දින දහයක් ඇතුළත කල් ඉකුත් නොවන පරිදි පාර්ලිමේන්තුව රැස්වීම් කල් තැබීමක් නිසා හෝ වාර අවසාන කිරීමක් නිසා හෝ පාර්ලිමේන්තුව විසංයුක්තව තිබුණේ නම්, දින දහයක් ඇතුළත පාර්ලිමේන්තු රැස්වීම සඳහා ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එවන් ප්‍රකාශනයක් මගින් නියම කරනු ලබන දිනයේ දී පාර්ලිමේන්තුව රැස්විය යුතු අතර, එය එදින වන තෙක් රැස්වීම් කල් තැබීමක් හෝ වාර අවසාන කිරීමක් වූ ආකාරයටම අඛණ්ඩව පාර්ලිමේන්තුවේ අසුන්ගෙන ක්‍රියා කළ යුතුය.*

ඒ අනුව ඇඳිරි නීතිය පැනවීමට ජනාධිපතිවරයාගේ නියෝගය ගැසට් මගින් ප්‍රකාශයට පත් කර පසුව පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතු බව පැහැදිලිය. කෙසේ වෙතත්, වර්ෂ 2020 මාර්තු මාසයේදී පැනවූ 'ඇඳිරි නීතිය' සම්බන්ධයෙන් එවැනි පියවරක් ගෙන ඇති බවක් පෙනෙන්නට නැත.

මහජන ආරක්ෂක ආඥාපනතේ 16 වැනි වගන්තියට අමතරව, පුද්ගල අයිතීන් (නිදහසේ ගමන් බිමන් යාමේ අයිතිය ඇතුළුව) සීමා කිරීමේ මාධ්‍යයක් හදිසි අවස්ථා රෙගුලාසි භාවිත කිරීමට පසුගිය රජයන් විසින් කටයුතු කර ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ මහජන ආරක්ෂක ආඥාපනත ප්‍රකාරව මහජන ආරක්ෂාව සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යැයි ඔහු අදහස් කරන හදිසි නීති රෙගුලාසි නියම කිරීමට ජනාධිපතිවරයාට බලය ඇත.[158] [159] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වැනි ව්‍යවස්ථාව මඟින් මහජන ආරක්ෂක ආඥාපනතේ සපයා ඇති පරිදි හදිසි අවස්ථා රෙගුලාසි නිකුත් කිරීමේ බලය ජනාධිපතිවරයා වෙත පවරා ඇත. මෙම රෙගුලාසිවලට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හැර ඕනෑම නීතියක් ඉක්මවා යාම, සංශෝධනය කිරීම හෝ ක්‍රියාත්මක කිරීම අත්හිටුවීමේ නීතිමය බලපෑමක් ඇත.[160] කෙසේ වෙතත්, රට තුළ හදිසි තත්වයක් පවතින බවට ප්‍රකාශයක් නිකුත් කිරීමෙන් මිස එවැනි හදිසි නීති රෙගුලාසි ක්‍රියාත්මක නොවේ.[161]

*155 (3) වගන්තිය*

*යම් නීතියක විධිවිධාන යටපත් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ ඒ විධිවිධාන ක්‍රියාත්මක වීම අත්හිටුවීමේ නෛතික බලය ඇති හදිසි අවස්ථා නියෝග සෑදීමට ජනාධිපතිවරයාට බලය පවරන මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක විධිවිධාන, ඒ විධිවිධාන ක්‍රියාත්මක කරමින් ඒ නීතිය යටතේ ප්‍රකාශනයක් කරනු ලැබූ විට මිස ක්‍රියාත්මක නොවිය යුත්තේ ය.*

එවැනි ප්‍රකාශයක් නිකුත් කළ පසු එය පාර්ලිමේන්තුවට දැනුම් දිය යුතුය.[162] එවැනි ප්‍රකාශයක් නිකුත් කරන අවස්ථාවේ පාර්ලිමේන්තුව විසුරුවා හැර තිබුණද, එම ප්‍රකාශය මඟින් පාර්ලිමේන්තුව රැස්වීම සඳහා කලින් දිනයක් නියම කර ඇත්නම් මිස, එම ප්‍රකාශයෙන් පසුව එළඹෙන දසවැනි දින පාර්ලිමේන්තුව කැඳවිය යුතුය.[163] දින දාහතරක් ඇතුළත පාර්ලිමේන්තුවේ යෝජනාවක් මගින් ප්‍රකාශනය අනුමත කළ යුතු අතර, එසේ නොකළහොත්

[158] 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥාපනතේ II වන කොටස

[159] මහජන ආරක්ෂක ආඥාපනතේ 5(2) වගන්තියේ සඳහන් වන්නේ ජනාධිපතිවරයා විසින් සකස් කළ හැකි රෙගුලාසි ලැයිස්තුවකි. එකී ලැයිස්තුවේ කරුණක් වශයෙන් ඇඳිරි නීතිය පැනවීම සම්බන්ධයෙන් ප්‍රකාශිතව සඳහන් කර නැතත්, හදිසි නීති රෙගුලාසි සම්පාදනය කිරීම සඳහා ජනාධිපතිවරයාට ඇති බලතලවල සාමාන්‍යභාවයට මෙම ලැයිස්තුවෙන් කිසිදු අගතියක් සිදු නොවන බව ද එම වගන්තිය සපයයි.

[160] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(2) ව්‍යවස්ථාව

[161] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(3) ව්‍යවස්ථාව

[162] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(4) ව්‍යවස්ථාව

[163] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(4) (i) ව්‍යවස්ථාව

ප්‍රකාශනය කල් ඉකුත් වනු ඇත.[164] ජනාධිපතිවරයා විසින් එවැනි ප්‍රකාශනයක් කලින් අවලංගු කරන්නේ නම් මිස, එය මාසයක කාලයක් සඳහා ක්‍රියාත්මක වේ.[165]

හදිසි නීති රෙගුලාසි යටතේ ජනාධිපතිවරයා විසින් ඇඳිරි නීතිය පැනවීමට නම්, පසුව පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන ප්‍රකාශනයක් මගින් හදිසි තත්වයක් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය බව එවිට පැහැදිලිය.

රජය එවැනි පියවරක් ගෙන නොමැති බැවින් වර්ෂ 2020 මාර්තු 20 වැනි දින පැනවූ ඇඳිරි නීතිය හදිසි නීති රෙගුලාසි නිකුත් කිරීමට ජනාධිපතිවරයාට ඇති බලය මත පදනම් විය නොහැක.

**පොලිස් ඇඳිරි නීතිය**

ඇඳිරි නීතිය පැනවීමට පොලිසියට ව්‍යවස්ථාපිතව බලය පවරන කිසිදු ප්‍රකාශිත නීතිමය ප්‍රතිපාදනයක් නොමැත. කෙසේ වෙතත්, හදිසි අවස්ථා වලදී පොලිස් ඇඳිරි නීතිය පිළිබඳ සංකල්පය ශ්‍රී ලංකාව තුළ බොහෝ විට ක්‍රියාත්මක වේ. පොලිස් ඇඳිරි නීතිය පිළිබඳ සංකල්පය පිළිබඳව පොලිස් ආඥාපනත මගින් කිසිදු පැහැදිලි සඳහනක් නොකරයි. නමුත් ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 261 සහ 262 වගන්තිවල ආරක්ෂාවට ඇති මහජන අයිතිය පිළිගන්නා 'මහජන කරදර' පිළිබඳව සඳහන් වේ.

***261 වගන්තිය.*** *මහජනයාට හෝ සාමාන්‍යයෙන් අසල පදිංචිව සිටින හෝ දේපල බුක්ති විඳින ජනයාට පොදු පාඩුවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවයක් ඇති කරන නැතහොත් යම් පොදු අයිතිවාසිකමක් භුක්ති විඳීමේ අවස්ථාවකින් ප්‍රයෝජනයක් ගැනීමට සිදුවිය හැකි ජනයාට අවශ්‍යයෙන්ම පාඩුවක්, බාධාවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවයක් ඇතිවන යම් ක්‍රියාවකට හෝ එබඳු නීති විරෝධී නොකර හැරීමකට වරදකරු වන තැනැත්තෙක් මහජන කරදරය කිරීමේ වැරදිකාරයෙක් වේ.*

*යම් පහසුවක් හෝ ලාභයක් සැලකීමේ කරුණ උඩ මහජන කරදරයකට සමාව නොලැබේ.*

***262 වගන්තිය.*** *ජීවිතයට අන්තරාදායක වූ යම් රෝගයක් පැතිරවිය හැකි වූ ද, එලෙස පැතිරවියහැකි බව තමා දන්නා වූ හෝ එලෙස විශ්වාස කිරීමට කරුණු තිබෙන්නා වූ ද යම් ක්‍රියාවක් නීති විරෝධීව හෝ නොසැලකිලිමත්ව කරන තැනැත්තෙකුට හය මාසය දක්වා කාලයක, දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.*

කොවිඩ්-19 වසංගතයේ ඇති පුළුල්ව ව්‍යාප්ත වන ස්වභාවය අනුව, පොදු ස්ථානවල රැඳී සිටීම අන් අයගේ සෞඛ්‍ය/ජීවිතවලට අනතුරක් විය හැකි බව සාධාරණ ලෙස නිගමනය කළ හැකිය. නමුත් මෙය ඇඳිරි නීතිය පැනවීමට පොලිසියට ලැබී ඇති බලයක් ලෙස අර්ථ දැක්විය නොහැක. පොලිස් ආඥාපනතේ 56 වැනි වගන්තියෙන් මහජන පීඩා වැළැක්වීම සඳහා තම උපරිම උත්සාහය සහ හැකියාව භාවිත කිරීම සෑම පොලිස් නිලධාරියකුගේම යුතුකම බව සපයා ඇතත්, යම් ප්‍රදේශයක් තුළ ගමන් කිරීමේ අයිතිය සීමා කළ හැකි රෙගුලාසි සැකසීමේ බලතල පිළිබඳව ආඥාපනතෙහි සඳහන් නොවේ.

ඇඳිරි නීතිය පැනවීමට ප්‍රකාශිත බලතල ප්‍රදානය කර නොමැති අවස්ථාවක, 'පොලිස් ඇඳිරි නීතිය' නම් වූ චාරිත්‍රානුකූල භාවිතය ඉතා ප්‍රවේශමෙන් ක්‍රියාත්මක කළ යුතුය. දැනට පවතින 'ඇඳිරි නීතිය' මේ මත පදනම් වී ඇත්නම් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

මහජන ආරක්ෂක ආඥාපනත භාවිතා කර ඇති අවස්ථාවක, පොලිස් නිලධාරියෙකුට එම නියෝගය උල්ලංඝනය කරමින් වරදක් සිදු කරන හෝ කළ හෝ කළ බවට සැක කිරීමට සාධාරණ පදනමක් ඇති ඕනෑම පුද්ගලයෙකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගත හැකිය.[166] නමුත් මෙය අදාළ වීමට නම්, මහජන ආරක්ෂක ආඥාපනතේ (ඉහත සාකච්ඡා කර ඇති) දක්වා ඇති පියවර අනුගමනය කළ යුතුය.

**කොවිඩ්-19 කාලය තුළ වෙනත් නීති මගින් අයිතිවාසිකම් කෙරෙහි ඇති බලපෑම**

ඉහත කරුණු වලට අමතරව, කොවිඩ්-19 වැනි මහජන සෞඛ්‍ය අර්බුදයකදී වෙනත් නීති මගින් පුද්ගල අයිතිවාසිකම් නිශේධනය කරනු ලබන අවස්ථා දක්නට ලැබේ.

නිරෝධායන සහ රෝග නිවාරණ ආඥාපනත මගින් ශ්‍රී ලංකාව තුළ කිසියම් රෝගයක් හඳුන්වාදීම හෝ පැතිරීම වැළැක්වීමේ අරමුණින් අදාළ අමාත්‍යවරයාට අවශ්‍ය යැයි හැඟෙන පරිදි රෙගුලාසි පැනවීමට, අවලංගු කිරීමට

[164] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(6) ව්‍යවස්ථාව

[165] ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155(5) ව්‍යවස්ථාව

[166] 1947 අංක 25 දරණ මහජන ආරක්ෂක ආඥාපනතේ 18 වන වගන්තිය

හෝ වෙනස් කිරීමට හැකිය.[167] අමාත්‍යවරයා විසින් රෙගුලාසි සම්පාදනය කළ හැකි කරුණු මෙම ආඥාපනතේ 3 වැනි වගන්තියේ විධිවිධාන මගින් ලැයිස්තුගත කර ඇත. කෙසේ වෙතත්, ලැයිස්තුවේ කිසිවක් හරහා ඇඳිරි නීතිය පැනවීමට හෝ සාමාන්‍ය ජනතාවගේ ගමන් නිදහස සීමා කිරීමට කිසිදු බලයක් ලබා නොදේ. එබැවින් නිරෝධායන සහ රෝග නිවාරණ ආඥාපනත තුළ ඇඳිරි නීතිය පැනවීමට කිසිදු නීතිමය පදනමක් සොයාගත නොහැක.

**වත්මන් තත්ත්වය**

වසංගතයට එරෙහිව සටන් කිරීම සඳහා යම් යම් ක්‍රියාමාර්ග අවශ්‍ය වන නමුදු, 'ඇඳිරි නීතිය' නීත්‍යානුකූලව පනවා තිබේද යන්න ප්‍රශ්න කිරීම වැදගත්ය. මෙම ලුහුඬු මාර්ගෝපදේශ ලේඛනය සකස් කරනු ලබන මොහොත වන විටත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 වැනි ව්‍යවස්ථාව අනුව හදිසි නීති රෙගුලාසි කිසිවක් ක්‍රියාත්මක කිරීමට හෝ මහජන ආරක්ෂක ආඥාපනතේ 16 වැනි වගන්තියට අනුව ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට ජනාධිපතිවරයා විසින් පියවර ගෙන නැත. මේ අනුව, වර්ෂ 2020 මාර්තු 20 වැනි දින පනවා ඇති ඇඳිරි නීතිය සහ පසුව දීර්ඝ කිරීමේ නීතිමය පදනම පිළිබඳව ප්‍රශ්න කළ යුතුය. 'ඇඳිරි නීතිය' සඳහා නීතිමය පදනමක් නොමැති අවස්ථාවක, එම 'ඇඳිරි නීතිය' මත පදනම් වීම මත ගනු ලබන ක්‍රියාමාර්ගවල නීත්‍යානුකූලභාවය ද ප්‍රශ්නයට ලක්වන බව ද සඳහන් කළ යුතුය. සැලකිය යුතු ප්‍රතිවිපාක සහිතව, රජය විසින් 'ඇඳිරි නීතිය' සඳහා පදනම ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම සහ ඇඳිරි නීතිය සහ කොවිඩ්-19 වසංගතයට එරෙහිව සටන් කිරීමට අවශ්‍ය අනෙකුත් සියලුම ක්‍රියාමාර්ග ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික රාමුවට අනුකූලව ගන්නා බව සහතික කිරීම දූරදර්ශී වේ. කොවිඩ්-19 හේතුවෙන් පනවන ලද ඇඳිරි නීතියේ නීතිමය පදනම අවබෝධ කර ගැනීමේදී අදාළ වන ව්‍යවස්ථාපිත විධිවිධාන පහත වගුවේ දක්වා ඇත.

| **මූලාශ්‍රය** | **අදාළ නීතිමය විධිවිධාන** |
|---|---|
| ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව | 76 (2) වගන්තිය<br><br>*76. (1) පාර්ලිමේන්තුව විසින් පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලය අත් නොහළ යුත්තේ ය. කිසිම ආකාරයකින් අන්සතු නොකළ යුත්තේ ය. කවර වූ හෝ ව්‍යවස්ථාදායක බලයක් ඇති කිසිම අධිකාරයක් පාර්ලිමේන්තුව විසින් නොපිහිටුවිය යුත්තේ ය.*<br><br>***(2) පාර්ලිමේන්තුව විසින්, මහජන ආරක්ෂාවට අදාළ යම්කිසි නීතියකට අනුකූලව හදිසි අවස්ථා නියෝග සෑදීමේ බලය ජනාධිපතිවරයාට පැවරෙන විධිවිධාන, ඒ නීතියට ඇතුළත් කිරීම, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන කඩකිරීමක් නොවන්නේ ය.*** |
| | *155 වැනි වගන්තිය*<br><br>*(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීම ආරම්භ වන තෙක් මහජන ආරක්ෂාව බලපැවැත් වූ සංශෝධිත මහජන ආරක්ෂක ආඥාපනත පාර්ලිමේන්තුව විසින් පනවන ලද පනතක් සේ සැලකෙන්නේ ය.*<br><br>*(2) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හෝ මහජන ආරක්ෂාව පිළිබඳව තත් කාලයේ බලපවත්නා නීතිය යටතේ හෝ හදිසි අවස්ථා නියෝග සෑදීමේ බලයට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන හැර වෙනත් කවර වූ හෝ නීතියක විධිවිධාන යටපත් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ අත්හිටුවීමේ නෛතික බලය ඇති නියෝග සෑදීමේ බලය ද ඇතුළත් වන්නේ ය.*<br><br>*(3) යම් නීතියක විධිවිධාන යටපත් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ ඒ විධිවිධාන ක්‍රියාත්මක වීම අත්හිටුවීමේ නෛතික බලය ඇති හදිසි අවස්ථා නියෝග සෑදීමට ජනාධිපතිවරයාට බලය පවරන මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක විධිවිධාන, ඒ විධිවිධාන ක්‍රියාත්මක කරමින් ඒ නීතිය යටතේ ප්‍රකාශනයක් කරනු ලැබූ විට මිස, ක්‍රියාත්මක නොවිය යුත්තේ ය.*<br><br>*(4) එවැනි ප්‍රකාශනයක් කරනු ලැබූ විට ඒ බව, මේ ව්‍යවස්ථාවේ අනෙකුත් විධිවිධානවලට යටත්ව, නොපමාව ම පාර්ලිමේන්තුවට දන්වා යැවිය යුත්තේ ය; තව ද ඒ අනුව -* |

[167] 1897 අංක 3 දරන නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 2 වැනි වගන්තිය

*(i) ඒ ප්‍රකාශනය නිකුත් කරනු ලැබුවේ පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමෙන් පසුව නම්, ඒ ප්‍රකාශනයෙහි පාර්ලිමේන්තුව රැස්වීම සඳහා කලින් දිනයක් නියම කර ඇතොත් මිස, ඒ ප්‍රකාශනයෙන් අනතුරුව එළඹෙන දසවන දිනයෙහි පාර්ලිමේන්තුව රැස්වීම පිණිස කරන නැඳවීමක් සේ ඒ ප්‍රකාශය ක්‍රියාත්මක වන්නේ ය. පාර්ලිමේන්තුව රැස්වීම සඳහා ඒ ප්‍රකාශනයෙහි යම් දිනයක් නියම කරනු ලබන්නේ නම් ඒ දිනය එකී ප්‍රකාශනය කළ දින සිට දින තුනක් ඉකුත් වූ පසු එළඹෙන දිනයක් විය යුත්තේ ය; තවද එසේ කැඳවනු ලැබූ පාර්ලිමේන්තුව ඒ ප්‍රකාශනයේ හෝ වැඩිදුරටත් කරනු ලබූ යම් ප්‍රකාශනයක හෝ කාලය ඉකුත් වීම හෝ ඒ ප්‍රකාශනය හෝ වැඩිදුර ප්‍රකාශනය ප්‍රත්‍යාදිෂ්ට කිරීම නැතහොත් මහ මැතිවරණය නිම වීම යන අවස්ථා දෙකෙන් කලින් එළඹෙන අවස්ථාව තෙක් පවත්වාගෙන යා යුත්තේ ය. එකී කාලය ඉකුත් වූ විට හෝ ප්‍රත්‍යාදිෂ්ට කිරීම කරනු ලැබූ විට හෝ මහ මැතිවරණය නිම වූ විට හෝ එසේ කැඳවනු ලැබූ පාර්ලිමේන්තුව විසිරෙන්නේ ය.*

*(ii) ඒ ප්‍රකාශනය කරනු ලැබූ දිනයේ දී, එදින සිට දින දහයක් තුළ දී අවසන් නොවන පරිදි රැස්වීම කල් තැබීමක් නිසා හෝ වාර අවසාන කිරීමක් නිසා හෝ පාර්ලිමේන්තුව සංයුක්තව තිබුණේ නම්, දින දහයක් තුළ දී පාර්ලිමේන්තුව රැස්වීම සඳහා ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබිය යුත්තේ ය.*

*(5) මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක් යටතේ ප්‍රකාශනයක් කිරීමෙන් ඒ නීතියේ විධිවිධාන ක්‍රියාත්මක කර ඇති අවස්ථාවක, මේ ව්‍යවස්ථාවේ පසුව එළඹෙන විධිවිධානවලට යටත්ව, ඒ ප්‍රකාශනය කළ දින සිට එක් මාසයක කාලයක් ඒ ප්‍රකාශනය ක්‍රියාත්මකව පැවතිය යුත්තේ ය. එහෙත් ඒ කාලය අවසාන වීමට කලින් ඒ ප්‍රකාශනය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ ඒ කාලය අවසානයේ දී නැතහොත් ඊට පෙර යම් වැඩි දුර ප්‍රකාශනයක් කිරීමට හෝ එකී ක්‍රියාත්මක වීමෙන් හානියක් නොවන්නේ ය. (6) මේ ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ සඳහන් මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක යම් විධිවිධාන, ඒ නීතිය යටතේ ප්‍රකාශනයක් කිරීමෙන් ක්‍රියාත්මක කර ඇති අවස්ථාවක, ඒ ප්‍රකාශනය පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, ඒ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලැබූ දින සිට දින දාහතරක කාලයකට පසු, ඒ ප්‍රකාශනය නිර්බල විය යුත්තේ යඃ එසේ වුව ද (අ) ඒ ප්‍රකාශනය කරන දිනයේ දී පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබ තිබේ නම්; හෝ (ආ) මේ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ (ii) වන අනුඡේදයේ සඳහන් පරිදි එවැනි යම් රැස්වීම් කල් තැබීමක් හෝ වාර අවසාන කිරීමක් හෝ නිසා ඒ දිනයේ දී පාර්ලිමේන්තුව විසංයුක්තව තිබේ නම්; හෝ (ඇ) මේ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ (i) වන සහ (ii) වන අනුඡේදවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි, කැඳවනු ලැබූ විට පාර්ලිමේන්තුව රැස් නොවේ නම්, පාර්ලිමේන්තුව ඊළඟට රැස් වී කටයුතු කරන දිනයෙහි ඒ රැස්වීමේ දී ඒ ප්‍රකාශනය යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබුවහොත් මිස පාර්ලිමේන්තුව ඊළඟට රැස් වී කටයුතු කරන දිනයෙන් පසු දින දහයක් අවසානයේ දී ඒ ප්‍රකාශනය නිර්බල වන්නේ ය. (7) මහජන ආරක්ෂාවට අදාළ යම් නීතියක විධිවිධාන ක්‍රියාත්මක කරන ලද දිනයේ සිට දින දාහතරක කාලයක් ඇතුළත දී මේ ව්‍යවස්ථාවේ (6) වන අනුව්‍යවස්ථාවෙහි සඳහන් ප්‍රකාශනයක් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ විටක හෝ (6) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව එවැනි ප්‍රකාශනයක් නිර්බල වූ විටක, එසේ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ නැතහොත් නිර්බල වීමේ දින සිට එළඹෙන දින තිහක් ඇතුළත දී කරනු ලබන කිසිම ප්‍රකාශනයක්, එම ප්‍රකාශනය කිරීම පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් අනුමත කරනු ලබන තෙක්, ක්‍රියාත්මක නොවිය යුත්තේ ය.*

*(9) කැඳවනු ලැබූ විට පාර්ලිමේන්තුව රැස් නොවීමේ හේතුවෙන් ප්‍රකාශනයක් කිරීම පිළිබඳව පාර්ලිමේන්තුවට දැනුම් දීමට හෝ පාර්ලිමේන්තුවේ අනුමතය ලබා ගැනීමට හෝ නොහැකි වන්නේ නම්, ඒ ප්‍රකාශනයේ වලංගු භාවය හෝ ක්‍රියාත්මක වීම හෝ කෙරෙහි මේ ව්‍යවස්ථාවේ (6) වන හෝ (7) වන අනුව්‍යවස්ථාවල ඇතුළත්? කිසිවක් බලනොපාන්නේ යඃ එසේ වුව ද, එවැනි අවස්ථාවක දී, ඉන් පසු හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුව නැවත කැඳවිය යුත්තේ ය.*

| | |
|---|---|
| මහජන ආරක්ෂක ආඥාපනත | *5 වගන්ති*<br><br>*(1) ජනාධිපතිවරයා විසින් මහජන ආරක්ෂාව සහ මහජන සාමය ආරක්ෂා කිරීම සහ කැළඹීම්, කැරලි කෝලාහල හෝ සිවිල් කෝලාහල මැඩපැවැත්වීම සඳහා නැතහොත් ප්‍රජාවගේ ජීවිතයට අත්‍යවශ්‍ය සැපයුම් සහ සේවා නඩත්තුව සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යැයි තමාට හැඟෙන පරිදි නියෝග (මින් මතුවට ''හදිසි අවස්ථා නියෝග'' ලෙස හැඳින්වෙන) පැනවිය හැක.*<br><br>*(2) පෙර උපවගන්තිය මගින් ලබා දී ඇති බලතලවල සාමාන්‍යභාවයට අගතියක් නොවන පරිදි, එම උපවගන්තියේ සඳහන් ඕනෑම කටයුත්තක් සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය විය හැකි හදිසි අවස්ථා නියෝග පහත පරිදි පැවීමට ජනාධිපතිවරයාට හැකිය.*<br><br>*(අ) පුද්ගලයන් රඳවා තබා ගැනීමට අවසර දීම සඳහා;*<br><br>*(ආ) (i) යම් දේපලක් හෝ ව්‍යාපාරයක් රජය වෙනුවෙන් සන්තකයේ තබා ගැනීම හෝ පාලනය කිරීම; (ii) ඉඩම් හැර වෙනත් දේපලක් රජය වෙනුවෙන් අත්පත් කර ගැනීම සඳහා බලය පැවරීම;*<br><br>*(ඇ) කිසියම් පරිශ්‍රයකට ඇතුළු වීමට සහ සෝදිසි කිරීමට අවසර දීම;*<br><br>*(ඈ) කිසියම් නීතියක් සංශෝධනය කිරීම සඳහා, යම් නීතියක් ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම සඳහා සහ වෙනස් කිරීම් සහිතව හෝ රහිතව යම් නීතියක් ක්‍රියාත්මක කිරීම සඳහා විධිවිධාන සලසා දීම;*<br><br>*(ඉ) නියෝග වල අරමුණු සඳහා යම් බලපත්‍රයක්, අවසරපත්‍රයක්, සහතිකයක් හෝ වෙනත් ලියවිල්ලක් ප්‍රදානය කිරීම හෝ නිකුත් කිරීම සම්බන්ධයෙන්, රෙගුලාසි මගින් හෝ ඒ යටතේ නියම කළ හැකි ගාස්තුවක් අය කිරීම සඳහා විධිවිධාන සැලසීම; (ඊ) රෙගුලාසි මගින් පීඩාවට පත් වූ පුද්ගලයන්ට වන්දි ගෙවීම සහ වේතනය ලබා දීම;*<br><br>*(උ) නියෝග මගින් විධිවිධාන සලසා ඇති පරිදි, එවැනි ක්‍රියාපටිපාටියට අනුකූලව, යුද්ධාධිකරණ නොවන, එවැනි අධිකරණ මගින් වැරදිකරුවන් අත්අඩංගුවට ගැනීම සහ දඬුවම් කිරීම සහ ඔවුන්ගේ නඩු විභාගය සඳහා ප්‍රතිපාදන සම්පාදනය කිරීම සහ නියෝග හෝ තීරණ වලින් අභියාචනා කිරීම එවැනි උසාවි සහ එවැනි අභියාචනා විභාග කිරීම සහ බැහැර කිරීම.*<br><br>*(3) ඕනෑම හදිසි අවස්ථා නියෝගයක් පාර්ලිමේන්තුවේ යෝජනාවක් මගින් හෝ මෙම වගන්තියේ පෙර විධිවිධාන යටතේ සාදන ලද නියෝග මගින් වන විධිවිධාන එකතු කිරීම හෝ වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කළ හැකිය.* |
| | *16 වගන්තිය*<br><br>*(1) කිසියම් ප්‍රදේශයක මහජන සාමය පවත්වාගෙන යාම සඳහා එසේ කිරීම අවශ්‍ය යැයි ජනාධිපතිවරයා සලකන විට, එම නියෝගයෙන් හෝ ඉන් පසුව සිදු කළ හැකි මේ වගන්තිය යටතේ පනවනු ලබන වෙනත් නියෝගයක් යටතේ වන යම් නිදහස් කිරීම්වලට යටත්ව, ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගයක් මගින් එම ප්‍රදේශයේ කිසිදු තැනැත්තෙකු, නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පැය අතර, අධිකාරිය යටතේ නියෝගයේ සඳහන් කළ හැකි එවැනි පුද්ගලයෙකු විසින් ලබා දෙන ලිඛිත අවසර පත්‍රයක් හැර, ඕනෑම පොදු මාර්ගයක, දුම්රිය, පොදු උද්‍යානයක, පොදු විනෝදාත්මක භූමියක හෝ වෙනත් පොදු භූමියක හෝ මුහුදු වෙරළක නොසිටිය යුතුය.*<br><br>*(3) යම් තැනැත්තෙකු මෙම වගන්තිය යටතේ කරන ලද නියෝගයක් උල්ලංඝනය කරන්නේ නම්, ඔහු වරදකට වැරදිකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ ලඝු පටිපාටියෙහි නඩු විභාගයකින් පසුව වරදකරු වීම මත, මාසයකට නොවැඩි කාලයක් සඳහා බරපතල සිරදඬුවමකට හෝ රුපියල් සියය නොඉක්මවන දඩයකට හෝ එම සිරදඬුවම සහ දඩය යන දෙකටම යටත් විය යුතුය.* |
| | *18 වගන්තිය*<br><br>*18. 16 වැනි වගන්තිය යටතේ හෝ 17 වැනි වගන්තිය යටතේ යම් වරදක් සිදු කරනු ලබන හෝ සිදු කළ හෝ සිදු කළ බවට සැක කිරීමට සාධාරණ හේතු ඇති තැනැත්තෙකු වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමට ඕනෑම පොලිස් නිලධාරියෙකුට හැකිය.* |

| | |
|---|---|
| | *21(2) වගන්තිය*<br><br>*2 වන වගන්තියේ (3) උපවගන්තියේ විධිවිධාන, 2 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයකට අදාළ වන ආකාරයටම, 12 වැනි වගන්තිය, 16 වැනි වගන්තිය හෝ 17 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගයකට අදාළ විය යුතුය.* |
| පොලිස් ආඥාපනත | *56 වගන්තිය*<br>*56. මෙම ආඥාපනතෙහි අන්තර්ගත සියලු අරමුණු සඳහා සෑම පොලිස් නිලධාරියෙක්ම සෑම විටකම සේවයේ නිරතව සිටින ලෙස සලකනු ලබන අතර ලංකාවේ සෑම තැනකම පොලිස් නිලධාරියකුගේ බලතල ඇත.*<br>*(අ) සියලු අපරාධ, වරදවල් හා මහජන අනදර වළක්වාලීම සඳහා ඔහුගේ හොඳම උත්සාහයන් සහ හැකියාව භාවිතා කිරීමට*<br>*(ආ) සාමය ආරක්ෂා කිරීමට;*<br>*(ඇ) කරදරකාරී සහ සැක කටයුතු චරිත වලින් හෙබි පුද්ගලයන් අල්ලාගැනීමට;*<br>*(ඈ) වැරදිකරුවන් හඳුනාගෙන අධිකරණය ඉදිරියට ගෙන ඒම;*<br>*(ඉ) මහජන සාමය ආරක්ෂා කිරීමට තොරතුරු රැස් කිරීම සහ සන්නිවේදනය කිරීම; සහ*<br>*(ඊ) ඕනෑම නිසි බලධාරියෙකු විසින් ඔහුට නීත්‍යානුකූලව නිකුත් කරන හෝ පනවන සියලුම නියෝග සහ වරෙන්තු පිළිපැදීම හා ඉටුකිරීම පොලිස් නිලධාරියකුගේ රාජකාරිය වනු ඇත.* |
| නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනත. | 2 වගන්තිය<br><br>*2. යම් රෝගයක් ලංකාවට හඳුන්වා දීම සහ ලංකාව තුළ සහ ඉන් පිටත ඕනෑම රෝගයක් පැතිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය යැයි පෙනෙන රෙගුලාසි වරින් වර පැනවීමට සහ එසේ පැන වූ පසු ඒවා ඉවත් කිරීමට හෝ වෙනස් කිරීමට අමාත්‍යවරයාට හැකිය.* |
| | 3 කොටස<br><br>*3(2) සෑම විටම 2 වන වගන්තිය මගින් අමාත්‍යවරයා වෙත ලබා දී ඇති බලතලවල සාමාන්‍යභාවය සීමා කිරීමට මෙම වගන්තියේ ඇති කිසිවක් කිසිදු ආකාරයකින් සීමා කිරීම හෝ අර්ථකථනය නොකළ යුතුය, නමුත් එම බලතල ඒවාට සමාන හෝ නොවූවත් සියලු කාරණා සඳහා විහිදේ. මෙම ආඥාපනතේ අරමුණු වඩා හොඳින් ක්‍රියාත්මක කිරීම සඳහා රෙගුලාසි සම්පාදනය කිරීම යෝග්‍ය වන්නේ කුමක් ද යන්න මෙම වගන්තියේ සඳහන් කර ඇත.* |
| දණ්ඩ නීති සංග්‍රහය | 261 වගන්තිය<br><br>***261.** මහජනයාට හෝ සාමාන්‍යයෙන් අසල පදිංචිව සිටින හෝ දේපල බුක්ති විඳින ජනයාට පොදු පාඩුවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවයක් ඇති කරන නැතහොත් යම් පොදු අයිතිවාසිකමක් භුක්ති විඳීමේ අවස්ථාවකින් ප්‍රයෝජනයක් ගැනීමට සිදුවිය හැකි ජනයාට අවශ්‍යයෙන්ම පාඩුවක්, බාධාවක්, අන්තරායක් හෝ අප්‍රසන්නතාවයක් ඇතිවන යම් ක්‍රියාවකට හෝ එබඳු නීති විරෝධී නොකර හැරීමකට වරදකරු වන තැනැත්තෙක් මහජන කරදරය කිරීමේ වැරදිකාරයෙක් වේ.*<br>*යම් පහසුවක් හෝ ලාභයක් සැලකීමේ කරුණ උඩ මහජන කරදරයකට සමාව නොලැබේ.* |
| | 262 වගන්තිය<br><br>***262.** ජීවිතයට අන්තරාදායක වූ යම් රෝගයක් පැතිරවිය හැකි වූ ද, එලෙස පැතිරවියහැකි බව තමා දන්නා වූ හෝ එලෙස විශ්වාස කිරීමට කරුණු තිබෙන්නා වූ ද යම් ක්‍රියාවක් නීති විරෝධීව හෝ නොසැලකිලිමත්ව කරන තැනැත්තෙකුට හය මාසය දක්වා කාලයක, දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමක් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින් ම දඬුවම් කළ යුතු ය.* |

ඇමුණුම IV

## ප්‍රශ්න සහ පිළිතුරු:

## නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ

## නිකුත් කරන ලද රෙගුලාසි

## සහ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 ප්‍රතිචාර සම්බන්ධයෙන් ඒවායෙහි බලපෑම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
වර්ෂ 2020 නොවැම්බර් 6 දින

ශ්‍රී ලංකාව තුළ කොවිඩ්-19 රෝගය වැළඳී ඇති රෝගීන් කෙටි කාලයක් තුළ වැඩි වශයෙන් වාර්තා වීමෙන් අනතුරුව නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනතේ 2 හා 3 වගන්ති යටතේ සෞඛ්‍ය අමාත්‍යවරිය විසින් වර්ෂ 2020 ඔක්තෝම්බර් මස 15 වන බ්‍රහස්පතින්දා දින අංක 2197/25 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් රෙගුලාසි සකස් කරන ලදි. මෙම මාර්ගෝපදේශය ඔස්සේ එකී රෙගුලාසීන් වලට අදාළ නෛතික රාමුව සහ කොවිඩ් වසංගත තත්ත්වයට එරෙහිව කටයුතු කිරීම සඳහා ගෙන ඇති වෙනත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සංක්ෂිප්තව විමසා බලයි.

ශ්‍රී ලංකාවේ නීතියේ ආධිපත්‍යය තහවුරු කිරීම සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පාලනයට අනුගතව වසංගත තත්ත්වයක් මැඩපැවැත්වීමේ වැදගත්කම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් නිරන්තරයෙන් අවධාරණය කර තිබේ. කොවිඩ්-19 වසංගත තත්ත්වය හා සම්බන්ධ නීතිමය හා මානව හිමිකම් ගැටළු රාශියක් පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙයට පෙර අවස්ථාවන්හි දී තවත් ලේඛණ කිහිපයක් නිකුත් කරන ලද අතර ඒවා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ වෙබ් අඩවියෙන් ලබාගත හැකි ය.

1. **ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගතය පැතිර යාමෙන් පසු ගැසට් කර තිබෙන නිරෝධායන රෙගුලාසි මොනවා ද?**

- 2020 මාර්තු 20 වන සිකුරාදා දිනැති අංක 2167/18 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය - කොවිඩ්-19 වසංගතය නිරෝධායනය විය යුතු රෝගයක් බව ප්‍රකාශයට පත්කරමින් ආඥාපනත යටතේ සම්මත කර ඇති 1925 සහ 1960 නිරෝධායන රෙගුලාසි වල අරමුණ සඳහා මෙම රෙගුලාසි කොවිඩ්-19 රෝගී තත්ත්වයට සඳහා වන ක්‍රියාපටිපාටිවලට අදාළ වේ.
- 2020 මාර්තු 25 වන බදාදා දිනැති අංක 2168/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් නිසි බලධරයා යන්න සහ රෝගී ප්‍රදේශයක් යන්න අර්ථ නිරූපණය කරන ලදි.

- 2020 අප්‍රේල් මස 11 වන සෙනසුරාදා දිනැති අංක 2170/8 දරන ගැසට් පත්‍රය

මගින් කොවිඩ්-19 රෝගය හේතුවෙන් මියයන පුද්ගලයන් අනිවාර්යයෙන්ම ආදාහනය කිරීම පිළිබඳව රෙගුලාසි පනවන ලදි.

- 2020 ඔක්තෝම්බර් මස 15 වන දිනැති අංක 2197/25 වන අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් සංචරණ සීමා සහ පොදු ස්ථානයන්හි දි පිළිපැදිය යුතු රීති ගැසට් කරන ලදි.

## 2. මෙම රෙගුලාසි සාමාන්‍ය පුරවැසියන් හට කවර ආකාරයකින් බලපානු ලබයි ද ?

මෙම රෙගුලාසි සාමාන්‍ය පුරවැසියන්ගේ ජීවිතවලට පහත පෙන්වා දී ඇති පරිදි ඍජුවම බලපානු ලැබේ:

- මෙම රෙගුලාසි මගින් සමාජ දුරස්ථභාවය සහතික කිරීම සඳහා පොදු ගොඩනැගිලි සහ පොදු ප්‍රවාහන සේවයේ දී සිටිය යුතු උපරිම පුද්ගලයන් සංඛ්‍යාව සීමා කළහැකිය.[168]
- නිසි බලධරයකු විසින් රෝහලක් හෝ පුද්ගලයන් නිරීක්ෂණය කිරීම සඳහා ස්ථානයක් පිහිටුවා ඇත්නම් එවන් ස්ථානයක් වෙත ප්‍රවේශවීම හෝ ළඟාවීම එම ස්ථානයේ සිට යාර 100ක දුරක් දක්වා සිදුකළ නොහැකි ය.[169]
- නිසි බලධරයා විසින් *රෝගී තැනැත්තකු හෝ රෝගී බවට සැකකරන තැනැත්තනකු*[170] ප්‍රතිකාර සඳහා හෝ නිරෝධායන මධ්‍යසථානයකට හෝ රෝහලකට ගෙනයාම හෝ ඔහු විසින් අනුමත කරනු කාලයක් එකී පුද්ගලයන් රඳවා තබාගැනීම හෝ ස්වයංනිරෝධායනය වන ලෙස විධාන කළ හැකි අතර මෙම ක්‍රියාවලීන් සඳහා බාධා කරන ඕනෑම පුද්ගලයකු මෙම ආඥා පනත යටතේ වරදක් කරනු ලබන පුද්ගලයෙකු වශයෙන් සළකනු ලැබේ.[171]
- නිසි බලධරයකු හට ඕනෑම නිවසකට හෝ පරිශ්‍රයකට ඇතුළු වී එහි පදිංචිකරුවකුට බෝවන, පැතිරෙන හෝ වසංගත රෝගයක් තිබේදැයි සොයාබැලීමට හැකියාව ඇත.[172]
- බෝවන හෝ වසංගත රෝගී තත්ත්වයකින් පෙළෙන ඕනෑම පුද්ගලයකු හට පොදු ප්‍රවාහන සේවා භාවිත කිරීම තහනම් වේ (කුලී රථ සහ මාර්ගගත යෙදුම් හරහා ප්‍රවාහන සේවා සැපයීම ද ඇතුළුව).[173] නිසි බලධාරියකුගේ අවසරයකින් තොරව පොදු ප්‍රවාහන සේවයක හිමිකරුවකුට හෝ රියැදුරකු හට එවන් රෝගී මගියකු රැගෙන යාම මෙම රෙගුලාසි මගින් තහනම් කර ඇත.[174]
- පොදු ස්ථානයක හෝ වෙනත් ඕනෑම ස්ථානයක සිටින පුද්ගලයකු වෙනත් පුද්ගලයකු සමග සම්බන්ධතා පවත්වන අවස්ථාවක මෙන්ම, ඕනෑම රෝගී ප්‍රදේශයක සිටින සෑම අවස්ථාවකදී ම මුහුණු ආවරණයක් පැළඳිය යුතු අතර

[168] 1925 රෙගුලාසි වල 61 සහ 65 සහ 2020 ඔක්තෝබර් රෙගුලාසි වල 90, 94, 95 සහ 97 හි රෙගුලාසි.

[169] 1925 නිරෝධායන රෙගුලාසි වල 43 සහ 44 රෙගුලාසි

[170] මේ නිසා, යමෙකුට රෝග ලක්ෂණ නොතිබීම මත නිරෝධායනය සඳහා වාර්තා කිරීම ප්‍රතික්ෂේප කළ නොහැකිය.

[171] 1925 නිරෝධායන රෙගුලාසිවල 49 වන රෙගුලාසිය සහ ආඥාපනතේ 4 (1) වගන්තිය; 2020 ඔක්තෝබර් රෙගුලාසි වල රෙගුලාසි 91 සහ 92.

[172] 1925 නිරෝධායන රෙගුලාසි වල 66 වන රෙගුලාසිය

[173] මහජන ප්‍රවාහනය යනු ඕනෑම දුම්රිය මාර්ගයක ගමන් කරන දුම්රියක්, වීදි කාර් රථයක්, පාලම් පාරුවක්, කැබ් රථයක්, බස් රථයක්, ගුවන් යානයක් හෝ කුලී පදනම මත මගීන් රැගෙන යන වෙනත් වාහනයක් වශයෙන් පුළුල් ලෙස අර්ථ දැක්වේ.

[174] 1925 නිරෝධායන රෙගුලාසි වල 69 වන රෙගුලාසිය

මීටරයකට නොඅඩු සමාජ දුරස්ථභාවයක් පවත්වා ගත යුතු ය.[175]

- කිසිදු පුද්ගලයකු විසින් නිසි අධිකාරිය විසින් අවසර දී ඇත්නම් මිස, එකී අධිකාරිය විසින් තීරණය කරනු ලබන කාලසීමාව තුළ රෝගී ප්‍රදේශයක පිහිටා ඇති කිසිදු ආයතනයක්, ව්‍යාපාරික ස්ථානයක් හෝ වෙනත් පරිශ්‍රයක් මහජනයාට විවෘත නොකළ යුතු වේ. නිසි බලධාරියා විසින් රෝගී ප්‍රදේශයක ජාතික ආරක්ෂාව හෝ මහජන සෞඛ්‍යය පවත්වාගැනීම සඳහා අත්‍යවශ්‍ය සේවා හෝ වෙනත් සේවාවක් සපයනු ලබන ඕනෑම සේවා ස්ථානයක්, සුපිරි වෙළඳසැළක්, වෙළඳ සැළක්, වෙළඳ පොළක් හෝ වෙනත් යම් ව්‍යාපාරික ස්ථානයක් මෙහෙයවීම හෝ ක්‍රියාත්මක කිරීම සඳහා නිසි බලධරයා විසින් අවසර ලබාදිය හැකි ය.[176]
- එවන් අත්‍යවශ්‍ය සේවා හෝ වෙනත් යම් සේවාවක් සපයනු ලබන යම් ආයතනයක හෝ සේවා ස්ථානයක සේවායෝජක විසින් හෝ ඒ ආයතනයක හෝ සේවා ස්ථානය භාරව සිටින තැනැත්තා විසින් එකී සේවාවන් පවත්වාගෙන යාමේ දී-

(අ) පරිශ්‍රයක් තුළ අවසර දී ඇති උපරිම පුද්ගලයින් සංඛ්‍යාව ඉක්මවා නොයන බවට සහතික වීම සහ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම සහතික විය යුතු ය.

(ආ) එම ආයතනයට හෝ සේවා ඇතුල්වන සෑම පුද්ගලයකු සෑම අවස්ථාවක දීම මුව වැස්මක් පැළඳ සිටින බව සහතික විය යුතු ය.

(ඇ) ඇතුළු වන සියලුම පුද්ගලයින්ගේ ශරීර උෂ්ණත්වය මනිනු ලබන බවට සහතික විය යුතු ය.

(ඈ) එම ස්ථානයට ඇතුල්වන සියලු පුද්ගලයන් හට ඔවුන්ගේ අත් සෝදාගැනීමට පහසුකම් සැළැස්විය යුතු ය.[177]

- නිසි අධිකාරිය විසින් තීරණය කර ඇති පරිදි ඕනෑම පුද්ගලයකුගේ ශරීර උෂ්ණත්වය සාමාන්‍ය පුද්ගලයකුගේ ශරීර උෂ්ණත්ව මට්ටමට වඩා වැඩි නම් එවන් පුද්ගලයකු හට එවන් පරිශ්‍රයන් වෙත ඇතුළුවීමට ඉඩ ලබානොදිය යුතු ය.[178]
- රෝගී ප්‍රදේශයක පොදු ප්‍රවාහනය සඳහා භාවිත කරනු ලබන යම් මෝටර් රථයක රියදුරු, කොන්දොස්තර සහ හිමිකරු විසින් මගීන් අතර සමාජ දුරස්ථභාවය පවත්වාගත යුතු අතර වෙනත් රෝග වැළැක්වීමේ පියවරයන් අනුගමනය කළ යුතු වේ.[179]

## 3. නිසි බලධරයා යනු කවුරු ද?

වර්ෂ 2020 මාර්තු මස 25 දින අංක 2168/6 අතිවිශේෂ ගැසට් පත්‍රයේ නම් කරන ලද පරිදි සමස්ත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් 'නිසි බලධරයා' යන්නෙන් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා නම් කරන ලදී.

[175] 2020 ඔක්තෝබර් රෙගුලාසි වල රෙගුලාසි 90.
[176] 2020 ඔක්තෝබර් රෙගුලාසි වල රෙගුලාසි 92 සහ 93.
[177] 2020 ඔක්තෝබර් රෙගුලාසි වල රෙගුලාසි 94 සහ 95.
[178] 2020 ඔක්තෝබර් රෙගුලාසි වල රෙගුලාසි 96.
[179] 2020 ඔක්තෝබර් රෙගුලාසි වල රෙගුලාසි 97.

ඉහත ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍රයේ 1 වන රෙගුලාසි වලට අනුව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා ජනරාල්වරයා ඔහුගේ ඇතැම් බලතල සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාට මෙන්ම පළාත් පාලන ආයතනයන්හි සභාපතිවරුන් හට, වරාය හා ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් වනවිට ඒවායේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියා හට, යුධ, නාවික හෝ ගුවන් හමුදා ස්ථානයක් සම්බන්ධයෙන් වනවිට ඒ ස්ථානයේ වෛද්‍ය නිලධරයා සහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් වෙත පවරා දිය හැකි ය.

කෙසේ වෙතත්, වැඩබලන පොලිස්පතිවරයා වෙත ලිපියක් යවමින් නීතිපතිවරයා සඳහන් කර ඇත්තේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරයා විසින් වැඩබලන පොලිස්පතිවරයා වෙත නිසි බලධරයා වශයෙන් සිය බලතල පවරා දී ඇති බවයි.[180] කොවිඩ්-19 වසංගත තත්ත්වයට ප්‍රතිචාර දැක්වීමේ කොටසක් වශයෙන් පොලීසිය විසින් සිදුකරනු ලැබූ ක්‍රියාමාර්ග කිහිපයක නීත්‍යානුකූලභාවය අනුමත කිරීම සඳහා මෙම ලිපිය භාවිතා කර ඇතත්, නිසි බලධරයා විසින් වැඩබලන පොලිස්පතිවරයා වෙත සිය බලතල පවරා ඇත්තේ කුමන නීතිමය විධිවිධාන සහ රෙගුලාසියටතේ ද යන්න අපැහැදිලි ය.

## 4. ආසාදිත ප්‍රදේශයක් යනු කුමක් ද? ආසාදිත ප්‍රදේශයක් හඳුනාගත හැකිවන්නේ කවුරුන් හට ද?

නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත යටතේ "අසාදිත" යනුවෙන් අර්ථ දැක්වෙනුයේ ආසාදිත හෝ ආසාදිත බවට සැකකෙරෙන තත්වය කි.

වර්ෂ 2020 මාර්තු මස 25 වන දින පළකරන ලද අංක 2168/6 අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් අසාදිත ප්‍රදේශයක් ලෙස අර්ථ දක්වනුයේ නිසි බලධරයා විසින් යම් ප්‍රදේශයක් තමා නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා රෝගයක් මගින් ආසාදිත හෝ ආසාදිත වෙමින් පවතින බවට සැකකරන බවට ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රදේශයක් වශයෙනි. මෙම රෙගුලාසි වලට අනුව නිසි බලධරයා විසින් රෝගී ප්‍රදේශයක් හඳුනාගත යුතු ය. කෙසේ වෙතත් මේ වනවිට ආසාදිත ප්‍රදේශ හඳුනාගැනීම පිළිබඳ මහජන නිවේදන පොලීසිය විසින් නිකුත් කරන අතර ඉහත දක්වන ලද ගැසට් පත්‍රයේ පොලීසිය යනු නිසිබලධරයකු ලෙස අර්ථ දක්වා නොමැත.

## 5. මෙම රෙගුලාසි යටතේ නිරෝධායන ක්‍රියාවලිය සිදුකිරීම සඳහා බලය පවතින්නේ කා හට ද?

වර්ෂ 2020 ඔක්තෝම්බර් මස පනවන ලද රෙගුලාසීන්හි 91 හා 92 රෙගුාසි වලට අනුව, ඕනෑම නිවසක් තුළ හෝ ස්ථානයක ආසාදිත තැනැත්තකු හෝ ආසාදිත තැනැත්තකු බවට සැකකරන පුද්ගලයකු නිරෝධායන කාර්යය සඳහා රෝහලකට හෝ එකී කාර්යය සඳහා සකස්කර ඇති වෙනත් ස්ථානයකට ගෙනයාමට හෝ යම් නිශ්චිත කාලසීමාවක් සඳහා නිරෝධායනය වන ලෙස විධාන කිරීමට නිසි බලධරයාට හැකියාව ඇත.

[180] MENAFN, ශ්‍රී ලංකාව - 'පොලිසිය විසින් බලාත්මක කරන ලද පියවර නීතිපති විසින් අනුමත කරයි', යොමුව https://menafn.com/1100099455/Sri-Lanka-AG-approves-steps-enforced-by-Police 2020 නොවැම්බර් මස 04 වන දින ප්‍රවේශ විය.

කෙසේවුව ද වර්තමානයේ දී නිරෝධායන ක්‍රියාවලිය පොලිසිය සහ/හෝ හමුදාව විසින් සිදුකරනු ලබන අතර, එය මෙකී රෙගුලාසි යටතේ නිසි බලධරයෙක් වශයෙන් හඳුනාගෙන නොමැත. එම කරුණ මෙකී ක්‍රියාවලියේ වගවීම හා බලය අනිසි ලෙස භාවිත කිරීම පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් ඉස්මතු කරනු ලබයි.

## 6. නිරෝධායන මධ්‍යස්ථානයකට හෝ ස්වයං නිරෝධායනය වෙත පුද්ගලයකු යොමුකිරීමේ දී අනුගමනය කළයුතු ක්‍රියා පටිපාටි කවරේ ද?

නිරෝධායන රෙගුලාසි අංක 1925 යටතේ නිසි බලධාරියෙකු හට යම් පදිංචිකරුවකු බෝවන රෝගයකින් පෙළෙනවාද යන්න සොයා බැලීම සඳහා නිවසකට හෝ පරිශ්‍රයකට ඇතුළු වියහැකිය.[181] මෙම ක්‍රියාවලියට බාධා සිදුකිරීම මෙම ආඥා පනත යටතේ වරදකි.

කෙසේවෙතත්, මෙම ක්‍රියාවලියට අදාළ විවිධාකාර පැමිණිලි සහ අදහස් ප්‍රකාශකිරීම් සැළකිල්ලට ගනිමින්, නිරෝධායන ක්‍රියාවලියේ දී අනුගමනය කළයුතු මාර්ගෝපදේශ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරතිබේ.

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිරෝධායන ක්‍රියාවලිය නීතිය යටතේ විධිමත් කළයුතු බවට නිර්දේශ කරනු ලබයි;

- 'නිසි බලධරයා' විසින් බලතල පැවරීම සම්බන්ධයෙන් විනිවිදභාවයක් ඇතිකිරීම
- රෝග පරීක්ෂාව සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන් හට බලය ලබාදීම
- නිරෝධායන මධ්‍යස්ථාන ලෙස නම්කර ඇති ස්ථාන සහ ඒවායේ අධිකාරිය නම් කිරීම
- නිරෝධායනය විය යුතු කාලය පැහැදිලි කිරීම
- නිරෝධායනය කිරීම සඳහා හේතුව, ඔවුන් රැගෙන යන ස්ථානය සහ හුදකලා වශයෙන් සිටිය යුතු කාලය ඇතුළත්ව නිරෝධායනය වන පුද්ගලයන් සඳහා රිසිට්පතක් නිකුත්කිරීමට කටයුතු යෙදීම
- නිරෝධායන මධ්‍යස්ථාන බාහිර පරීක්ෂාවට ලක්කිරීම, විශේෂයෙන්ම 'නිසි බලධාරියා' මගින් සිදුකිරීම
- ආසාදිතයන් වෛරස තත්ත්වයක අවාසනාවන්ත වින්දිතයින් ලෙස හැඳින්වීමට වඩා ඔවුන් වැරදිකරුවන් ලෙස හුවාදැක්වීම නතර කිරීම පිණිස නිරෝධායන කාර්යයන් හසුරුවන්නන් විසින් එම කටයුතු මාධ්‍ය වෙත දැනුම්දීම තහනම් කිරීම.

නිරෝධායන ක්‍රියාවලිය මගින් පනවා ඇති දුෂ්කරතා අවම කිරීම සඳහා ද ශ්‍රී ලංකා මානව හිමිකම කොමිෂන් සභාව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කර ඇත.

- නිරෝධායන කාලසීමාව වැටුප් හෝ වැටුප් සහිත රාජකාරි නිවාඩු වශයෙන් සහතික කිරීම
- නිරෝධායනයෙහි යෙදී සිටින පුද්ගලයන්ගේ පවුල් සඳහා මූල්‍ය හෝ වෙනත් ආධාර ලබාදීම සහතික කිරීම
- පුද්ගලයකු නිරෝධායනයට ලක්කළ වහාම ග්‍රාම නිලධාරිවරයා වෙත දැනුම්දීම
- නිරෝධායන ක්‍රියාවලිය හේතුවෙන් පවුල්වල අවදානමට ලක්ව සිටින යැපෙන්නන් අතැහැරදමා ඇති තත්ත්වයන් තුළ නිසි බලධරීන් දැනුවත් කිරීම මෙන්ම අවදානම සහිත පුද්ගලයින් හට ග්‍රාම නිලධාරීවරයා හරහා ඔවුනට අවශ්‍ය සියලු සහායන් ලබාදීමට කටයුතු සැළැස්වීම.

[181] 1925 නිරෝධායන රෙගුලාසිවල 66 වන රෙගුලාසිය

## 7. ඇතැම් ප්‍රදේශවල වර්තමානයේ ඇඳිරිනීතිය පනවා ඇති නීතිමය පදනම කුමක් ද?

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් කොවිඩ්-19 හේතුවෙන් පැනනගින හදිසි තත්ත්වයට ප්‍රතිචාර වශයෙන් පැනවූ ඇඳිරිනීතියෙහි නීත්‍යානුකූලභාවය මෙයට පෙර ප්‍රශ්න කර තිබුණි.[182]

වර්තමාන ඇඳිරිනීතිය බොහෝවිට 'නිරෝධායන ඇඳිරිනීතිය' ලෙසට හැඳින්වේ. කෙසේවුව ද, නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත මගින් 'ඇඳිරිනීතිය' පැනවීම සඳහා කිසිදු අයුරකින් විධාන නිකුත් කර නොමැත. 'ඇඳිරි නීතිය' යන යෙදුම සොයාගත හැකිවනුයේ මහජන ආරක්ෂක ආඥා පනතේ 16 වන වගන්තිය යටතේ වන අතර එය ජනාධිපතිවරයා විසින් පැනවිය යුතුය.

- මහජන ආරක්ෂක ආඥා පනතේ 21(2) වගන්තියේ සඳහන් වන පරිදි ''2 වන වගන්තියේ 3 වන උපවගන්තියේ විධිවිධානයක් අවශ්‍ය වෙනස්කිරීම් සහිතව මහජන ආරක්ෂක පනතේ 12 වගන්තිය, 16 හා 17 වගන්ති යටතේ සිදුකරනු ලබන නියෝගයන්ට අදාළ වන බවයි''.
- මහජන ආරක්ෂ ආඥා පනතේ 2(3) වගන්තියට අනුව "මෙම වගන්තියේ පූර්ව විධිවිධාන යටතේ ප්‍රකාශනයක් කළ විට ඒ පිළිබඳ පාර්ලිමේන්තුව දැනුවත් කළ යුතු අතර, ඒ අවස්ථාවේ දී පාර්ලිමේන්තුව කල් තැබීම හෝ වාර අවසන් කිරීම නිසාවෙන් හෝ දින දහයකට වැඩි කාලයක් වෙන් වී ඇත්නම් දින දහයක් ඇතුළත පාර්ලිමේන්තුව කැඳවීම සඳහා නියෝගයක් නිකුත් කළ යුතු අතර, ඒ අනුව පාර්ලිමේන්තුව එම ප්‍රකාශනයේ සඳහන් දින රැස්විය යුතුය".

එබැවින් නීතියට අනුකූලව ඇඳිරි නීතිය පැනවීම නිල වශයෙන් ගැසට් කිරීමට ජනාධිපතිවරයා බැඳී සිටින අතර පසුව ගැසට් පත්‍රයේ අන්තර්ගත තොරතුරු පාර්ලිමේන්තුව වෙත අනාවරණය කළ යුතු වේ.

## 8. අහඹු ලෙස මහජනයාගේ උෂ්ණත්වය පරීක්ෂා කිරීමේ බලය පවතින්නනේ කාහට ද?

මාධ්‍ය වාර්තා පෙන්වා දෙන පරිදි ජංගම මුර සංචාරයේ යෙදෙන හමුදා භටයන් විසින් අහඹු ලෙස උෂ්ණත්ව පරීක්ෂා කිරීම් සිදුකරන බවයි. යුධ හමුදා මාධ්‍ය ප්‍රකාශක බ්‍රිගේඩියර් චන්දන වික්‍රමසිංහ ප්‍රකාශ කරන පරිදි ''කොළඹ දිස්ත්‍රික්කයේ සෑම ප්‍රදේශයකම අහඹු ලෙස උෂ්ණත්ව පරීක්ෂාවන් සිදුකරනු ලබන්නේ යුධ හමුදා භටයන් විසිනි. මෙමගින් සිදුවනුයේ කොවිඩ් 19 ආසාදනය වියහැකි අවස්ථා සඳහා සුපරීක්ෂාකාරීවීම සහ දැනුවත් කිරීම සහතික කිරීමයි. තව ද කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවල ද මාර්ග බාධක ක්‍රියාත්මක වූ අතර දිනකට වාහන 2,500ක් පමණ පරීක්ෂා කරන ලදි. මේ වනවිට අප විසින් වාහන 25,000 ක් පමණ පරීක්ෂා කර ඇති අතර පුද්ගලයන් 100 කට අඩු සංඛ්‍යාවක් රෝහල්වෙත වෙත යොමු කර ඇත."

---

[182] විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, කොවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් ඇඳිරි නීතිය: ලංකාවේ නීතිමය රාමුව සහ අදාළ ප්‍රශ්න' යොමුව <https://www.cpalanka.org/curfew-in-response-to-covid-19-legal-framework-and-relevant-questions-in-sri-lanka/> 2020 නොවැම්බර් මස 03 වන දින ප්‍රවේශ විය. ; ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, ඇඳිරි නීතිය පැනවීම විධිමත් කිරීම පිළිබඳ නිර්දේශ, යොමුව <https://www.hrcsl.lk/wp-content/uploads/2020/02/curfew.HRCSL-recommendation-final.pdf> 2020 නොවැම්බර් මස 03 වන දින ප්‍රවේශ විය.

අතිවිශේෂ ගැසට් පත්‍ර 2197/25[183] මගින් සේවා යෝජකයෙකු හෝ ඕනෑම ආයතනයක් හෝ සේවා ස්ථානයක් භාරව සිටින පුද්ගලයකුට සහ සුපිරි වෙළඳසැළක්, වෙළඳසැලක්, විකුණුම් අලෙවිසැල් හෝ වෙනත් ඕනෑම ව්‍යාපාරික ස්ථානයක් හිමි හෝ භාරව සිටින පුද්ගලයකු හට ශරීර උෂ්ණත්වය පරීක්ෂා කිරීම සඳහා බලය පවරා ඇති අතර උෂ්ණත්වය මැන බැලීම සිදුකරනුයේ එවන් පරිශ්‍රයක් වෙත ඇතුළුවීමට පෙර ය. නමුත් මෙම ආඥා පනත යටතේ නිකුත් කරන ලද ගැසට් පත්‍ර මගින් හමුදා නිලධාරීන් හට උෂ්ණත්වය මැන බැලීමට අවසර ලබා දී නොමැත.

## 9. නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනතත යටතේ පනවන රෙගුලාසි පිළිපැදීමට අපොහොසත් වූ විට අනුගමකය කළයුතු නීතිමය ක්‍රියා පටිපාටිය කුමක් ද?

මෙම ආඥාපනතේ දක්වා ඇති පරිදි ඒ යටත් ප්‍රකාශයට පත්කරන්නා වූ රෙගුලාසියකට පටහැනිව කටයුතු කරන්නා වූ ඕනෑම පුද්ගලයකුට කිසිදු නීත්‍යානුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිනම් එකී කඩකිරීම මෙම පනත යටතේ දඬුවම් ලැබිය හැකි වරදකි. යම් පුද්ගලයකු මෙකී රෙගුලාසි පිළිපැදීමට අපොහොසත් වුවහොත් ඔහුට විරුද්ධව මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකිවන අතර වරදකරු වුවහොත් මාස හයකට නොවැඩි දෙයාකාරයෙන් එක් ආකාරයක බරපතල හෝ බරපතල නොවන වැඩ සහිත සිරදඬුවමක් හෝ දඩයක් හෝ එකී දඬුවම් දෙකම නියම කළ හැකි ය.

ඊට අමතරව දණ්ඩ නීති සංග්‍රහයේ 262 වන වගන්තිය යටතේ ජීවිතයට අන්තරාදායක වූ රෝගයක් බෝවීම පැතිරවිය හැකි ඕනෑම ක්‍රියාවක් හෝ නොසැළකිලිමත් ක්‍රියාවක් සිදුකිරීම යටතේ මෙන්ම නොඑසේනම් රෝගයක් පවතින ස්ථාන හා වෙනත් ස්ථාන සමග පවත්නා අන්‍යෝන්‍ය සබඳතා පාලනය කිරීම සඳහා රජය විසින් ප්‍රකාශයට පත්කරන ලද ඕනෑම රීතියකට දැනුවත්ව අකීකරු වීම වරදක් ලෙස අර්ථදක්වා ඇති දණ්ඩ නීති සංග්‍රහයේ 264 වන වගන්තිය යටතේ දඬුවම් පැනවිය හැකි ය.

## 10. කොවිඩ් 19 හේතුවෙන් මියයන පුද්ගලයින් අනිවාර්යයෙන්ම ආදාහනය කිරීම පිළිබඳ නීතිමය ස්ථාවරය කුමක් ද?

රෝගී තත්ත්වයක් හේතුවෙන් මියයන ඕනෑම පුද්ගලයකු භූමදානය කිරීම හෝ ආදාහනය කිරීමට නියම කිරීම සම්බන්ධයෙන් වන රෙගුලාසි සම්පාදනය කිරීමට ආඥා පනතේ 3(1)(i) වගන්තිය මගින් අමාත්‍යවරයා වෙත බලය පවරා ඇත. වර්ෂ 2020 අප්‍රේල් මස 11 වන සෙනසුරාදා දින පළකරන ලද අංක 2170/8 දරන අතිවිශේෂ ගැසට්පත්‍රය මගින් කොවිඩ්-19 හේතුවෙන් මියගිය හෝ මියගිය බවට සැකකරන පුද්ගලයකුගේ දේහය ආදාහනය කිරීම අනිවාර්ය කර ඇත.

---

183 2020 ඔක්තෝබර් රෙගුලාසි වල රෙගුලාසි 94, 95 සහ 96.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් වර්ෂ 2020 මාර්තු 24 දින, මෙම කොවිඩ්-19 සන්දර්භය තුළ ආසාදන වැළැක්වීම හා පාලනය කිරීමට මළසිරුරක් සම්බන්ධයෙන් වන ආරක්ෂිත කළමණාකාරණය කිරීම සඳහා අතුරු මගපෙන්වීමක් කරඇත. එකී මාර්ගෝපදේශයේ දක්වනුයේ 'මෘත දේහයක් මගින් රෝග සම්ප්‍රේෂණය නොකරන' බවත් 'බෝවන රෝගයකින් මියගිය පුද්ගලයන් ආදාහනය කළ යුතු බව පොදුවේ පවත්නා මිථ්‍යාවක් වන අතර එය සත්‍යයක් නොවන බවත් ය. ඒ අනුව ආදාහනය කිරීම සංස්කෘතික වශයෙන් වන තෝරා ගැනීමක් හා පවතින සම්පත් පිළිබඳ වන කාරණයකි'.

එකී මාර්ගෝපදේශය මගින් ''සෑම තත්ත්වයක්ම එක් සිද්ධිය අනුව කළමණාකරණය කිරීම, පවුලේ අයිතීන් සමතුලිත කිරීම, මරණයට හේතුව සොයාබැලීමේ අවශ්‍යතාවය සහ ආදාහනයට නිරාවරණය වීමේ අවදානම'' යනාදී කරුණු පිළිබඳව සලකා බලා කටයුතු කිරීමට බලධාරීන්ට තවදුරටත් උපදෙස් ලබා දී ඇත. මෘතදේහ බැහැර කිරීම සම්බන්ධව සළකා බැලීමේ දී, එකී මාර්ගෝපදේශය පෙන්වා දෙනුයේ කොවිඩ්- 19 හේතුවෙන් මියගිය පුද්ගලයන් අදාහනය කිරීම මෙන්ම භූමදානය කිරීමටත් හැකියාව ඇති බවයි. අංක 2170/8 රෙගුලාසීන් සම්බන්ධව නැවත සළකා බැලීමක් සිදුකරන බව රජය මෑතක දී ප්‍රකාශය කර තිබුණි.

## ඇමුණුම V

## ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 වසංගත තත්ත්වයට ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් අදාළ වන නෛතික රාමුව පිළිබඳ දැනුවත් කිරීම

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
වර්ෂ 2021 මැයි 12 දින

2021 අප්‍රේල් අග සිට, ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව සීඝ්‍රයෙන් ඉහළ ගොස් ඇත.[184] වර්තමානයේ දී සෑම දිනකම වාර්තා වන සාමාන්‍ය නව ආසාදිත රෝගීන් සංඛ්‍යාව තවදුරටත් ඉහළ මට්ටමකට පැමිණ ඇති අතර, ඒ අනුව දිනකට රෝගීන් 2,000 කට වඩා වාර්තා වේ.[185] කොවිඩ්-19 ආශ්‍රිත මරණ සංඛ්‍යාව ද ඉහළ යමින් පවතින අතර එහිදී දැනටමත් ධාරිතාවය ඉක්මවා ඇති සෞඛ්‍ය යටිතල පහසුකම් සහ වෛද්‍ය කාර්ය මණ්ඩල කෙරෙහි ඇති දැඩි පීඩනය මෙකී තත්ත්වයට ප්‍රධාන වශයෙන්ම බලපා ඇත. ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, විශේෂඥ වෛද්‍යවරුන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සංගමයේ අන්තර් විද්‍යාලීය කමිටුව ඇතුළු වෛද්‍ය වෘත්තිකයන්ගේ එකතුවක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත ලිපියක් යොමු කරමින් පෙන්වා දෙන ලද්දේ පවතින තත්ත්වය තුළ ජාතික සෞඛ්‍ය සේවාව බිඳවැටීමේ මට්ටමකට ලඟා වී ඇති බවයි.[186] කොවිඩ්-19 වෛරසයේ නව ප්‍රභේද කිහිපයක් හඳුනා ගැනීම වෛද්‍ය වෘත්තිකයන් මෙන්ම සාමාන්‍ය ජනතාව අතර තවදුරටත් කනස්සල්ලට හේතු වී තිබේ. ශ්‍රී ලංකාව පෙර නොවූ විරූ සෞඛ්‍ය අර්බුදයක පසුවන අතර පවතින වසංගතය තත්ත්වයට ඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීමට ඉක්මන් පියවර නොගතහොත් තවදුරටත් මරණ, ආර්ථික දුෂ්කරතා සහ තවත් බොහෝ දේ සිදුවිය හැකි බව පෙන්නුම් කෙරේ.

දැඩි සංචාරක සීමා පැනවීම, පරීක්ෂණ ක්‍රියාවලිය වේගවත් කිරීම, සෞඛ්‍ය පහසුකම් ශක්තිමත් කිරීම සහ එන්නත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම එවැනි ක්‍රමවේදයන් මෙවැනි තත්ත්වයක් තුළ ගත යුතු හොඳම පියවර බව වෛරසය සීඝ්‍රයෙන් පැතිරීම පාලනය කිරීම සම්බන්ධයෙන් සටන් කරන වෙනත් රටවල අත්දැකීමෙන් ඔප්පු වී ඇත.[187]

කෙසේ වෙතත්, සාමාන්‍ය ජනතාවට ලබා ගත හැකි නිසි තොරතුරු නොමැතිකම සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇති වූ බිය සහ වැරදි තොරතුරු සංසරණය වීමේ වාතාවරණය හමුවේ ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 ප්‍රතිචාරය දුර්වල වීමට හේතු වී ඇත. මීට අමතරව, විශේෂයෙන් එන්නත් කිරීමේ ක්‍රියාවලිය, හුදකලා කිරීම සහ නිරෝධායන ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් වැඩි වශයෙන් දක්නට ලැබෙන අත්තනෝමතික ක්‍රියාමාර්ග ගැනීම් හේතුවෙන් පුරවැසියන්ගේ සෞඛ්‍ය හා ජීවිත අවදානමට ලක් විය හැකිය.

මෙම භයානක පසුබිම යටතේ, අදාළ නීති සහ ප්‍රතිපත්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නෛතික රාමුවට අනුකූලව ක්‍රියාත්මක වන අතර ඒවා අත්තනෝමතික හා තාවකාලික අන්දමේ නොවන බව සහතික කිරීම ඉතා වැදගත් වේ. කොවිඩ්-19 වසංගත තත්ත්වයට අදාළ අර්බුදය ආමන්ත්‍රණය කිරීමට ශ්‍රී ලංකාව දරන ප්‍රයත්නයන්හිදී ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ සහ නීතියේ ආධිපත්‍යයේ මූලධර්ම පිළිපැදීමේ අවශ්‍යතාවය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) නිරන්තරයෙන් අවධාරණය කර ඇති අතර එකී තත්ත්වයම වර්තමානයෙහි පවතින ගැටළුව ද වේ.[188]

---

184 'ශ්‍රී ලංකාවේ දෛනික කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාව වාර්තාගත ලෙස 1662 ක් බවට පත් වන විට, සමස්ථ රෝගීන් සංඛ්‍යාව 108,146 දක්වා ඉහළ යයි.
<http://www.colombopage.com/archive_21A/Apr30_1619799640CH.php>
2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

185 ලෝක සෞඛ්‍ය සංවිධානය, ශ්‍රී ලංකාව' යොමුව
<https://covid19.who.int/region/searo/country/lk> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය

186 'වෛද්‍ය විශේෂඥයන් ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටිනු ලබන්නේ සංචරණ සීමා පනවන ලෙස හෝ ව්‍යසනයකට මුහුණ දෙන ලෙසයි' සන්ඩේ ටයිම්ස්, යොමුව
http://www.sundaytimes.lk/210509/news/medical-experts-urge-president-to-impose-travel-restrictions-or-face-disaster-443061.html 2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය.

187 ඉහත එම.

188 'ලුහුඬු මාර්ගෝපදේශය I: කොවිඩ්-19 සන්දර්භය තුළ පැනනඟින නෛතිකමය ගැටලු', විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, යොමුව <https://www.cpalanka.org/brief-guide-i-evolving-legal-issues-in-the-context-of-covid-19/>

නිරෝධායන සහ රෝග නිවාරණ ආඥාපනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි පිළිබඳව ප්‍රශ්න හා පිළිතුරු ආකාරයෙන් ලේඛනයක් සැකසීම ද ඇතුළුව, කොවිඩ්-19 හා සම්බන්ධ නීතිමය සහ ප්‍රතිපත්තිමය ගැටළු මාලාවක් පිළිබඳව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මීට පෙර මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්තිමය සංක්ෂිප්ත සටහන් කිහිපයක් නිකුත් කරන ලදී.[189]

නිරෝධායන සහ රෝග නිවාරණ ආඥාපනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි මෙන්ම අනෙකුත් අදාළ නෛතික සහ නියාමන රාමු අනුව මෙම ලේඛනය මේ සම්බන්ධයෙන් මෑත කාලීන වර්ධනයන් කෙරේ අවධානය යොමු කරමින් යළි ඇගයීමට ලක් කර නැවත විමර්ශනය කරනු ලබයි.

## නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි මෑත මාසවලදී නිකුත් කරන ලද රෙගුලාසි කිහිපයක් පහත දැක්වේ:

1. අංක 2167/18 අතිවිශේෂ ගැසට් පත්‍රය - 2020 මාර්තු 20 සිකුරාදා දින, 1925 සහ 1960 ආඥාපනත යටතේ සම්මත කරන ලද දැනට පවතින නිරෝධායන රෙගුලාසිවල අරමුණු සඳහා කොවිඩ්-19 නිරෝධායන රෝගයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.

2. අංක 2168/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය - 2020 මාර්තු 25 වැනි බදාදා දින, නිසි බලධාරියා සහ ආසාදිත ප්‍රදේශයක් යන්න නිර්වචනය කිරීම.

3. අංක 2170/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය - 2020 අප්‍රේල් 11, සෙනසුරාදා දින, කොවිඩ්-19 හේතුවෙන් මිය යන පුද්ගලයන්ගේ අනිවාර්ය ආදාහනය.

4. අංක 2197/25 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය - 2020 ඔක්තොම්බර් 15, බ්‍රහස්පතින්දා දින, පොදු ස්ථානවල ගමන් කිරීම සීමා කිරීම සහ අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ.

5. 2021 පෙබරවාරි 25, බ්‍රහස්පතින්දා අංක 2216/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, කොවිඩ්-19 හේතුවෙන් මිය යන පුද්ගලයන් ආදාහනය කිරීම හෝ භූමදානය කිරීම.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් අවධානය යොමු කළ යුතු පහත සඳහන් ප්‍රධාන ගැටළු සම්බන්ධයෙන් ද මෙහි දී කරුණු ඉස්මතු කරයි:

## අධි අවදානම් කලාප හුදකලා කිරීම

ප්‍රදේශ හුදකලා කිරීමේ නීත්‍යානුකූලභාවය සහ ඒ සම්බන්ධයෙන් භාවිතා කළ යුතු ක්‍රියාවලීන් පිළිබඳව මෑත කාලීන සිදුවීම් කනස්සල්ලට හේතු වී ඇත. ඉහත රෙගුලාසි යටතේ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්වරයා මුළු ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් "නිසි අධිකාරිය" ලෙස නම් කරන ලදී.[190] ඉහත ගැසට් පත්‍රයේ නිකුත් කර ඇති රෙගුලාසිවල අංක 1 අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක ජනරාල්වරයාට තම බලතල සමහරක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාට මෙන්ම පළාත් පාලන ආයතනවල සභාපතිවරුන්ට, වරායන්, ගුවන් තොටුපළවල සහ ඕනෑම ස්ථානයක වෛද්‍ය නිලධාරීන්ට ද යුධ, නාවික හෝ ගුවන් හමුදා ස්ථානයක් සම්බන්ධයෙන් වනවිට ඒ ස්ථානයේ වෛද්‍ය නිලධරයාටද තවදුරටත් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් වෙත ද පවරා දිය හැකි ය.

---

2021 මැයි මස 7 වන දින ප්‍රවේශ විය.

[189] 'නිරෝධායනය සහ රෝග වැළැක්වීම ආඥා පනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි සහ මෙය ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 ප්‍රතිචාරයට බලපාන ආකාරය පිළිබඳ ප්‍රශ්න සහ පිළිතුරු', විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. https://www.cpalanka.org/q-and-a-on-regulations-issued-under-the-quarantine-and-prevention-of-dis eases-ordinance-how-this-impacts-the-covid-19-response-in-sri-lanka/ ; කොවිඩ්-19 ට ප්‍රතිචාර ප්‍රතිචාර වශයෙන් ඇඳිරි නීතිය: ශ්‍රී ලංකාවේ නෛතික රාමුව සහ අදාළ ප්‍රශ්න'. යොමුව https://www.cpalanka.org/curfew-in-response-to-covid-19-legal-framework-and-relevant-questions-in -sri-lanka/ ; ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාළ ව්‍යුහයන්: ජනාධිපති කාර්ය සාධක බලකාය පිළිබඳ කෙටි විග්‍රහයක්'. යොමුව https://www.cpalanka.org/structures-to-deal-with-covid-19-in-sri-lanka-a-brief-comment-on-the-presidential-task-force , 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

[190] 2020 මාර්තු 25 දිනැති අංක 2168/6 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය, යොමුව <http://www.documents.gov.lk/files/egz/2020/3/2168-06_E.pdf> 2021 මැයි මස 7 වන දින ප්‍රවේශ විය.

කෙසේ වෙතත්, මාධ්‍ය වාර්තාවලට අනුව, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ (Director General of Health Services-DGHS) නීත්‍යානුකූල බලය පැහැර ගනිමින් නිරෝධායන සහ රෝග නිවාරණ ආඥාපනත යටතේ මෑතකාලීන ක්‍රියාමාර්ග ගෙන ඇත.

කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය පාලනය කිරීමේ උත්සාහයක් ලෙස පිළියන්දල පොලිස් බල ප්‍රදේශය වර්ෂ 2021 මැයි මස 2 වන දින සවස් වන විට වහාම ක්‍රියාත්මක වන පරිදි හුදකලා කරන ලදී. කෙසේ වෙතත්, මෙම හුදකලාව පසුදින ඉවත් කෙරුණු අතර ඒ වෙනුවට පිළියන්දල පොලිස් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 10ක් හුදකලා කිරීමට පියවර ගැනුණි. සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුව, පිළියන්දල පොලිස් බල ප්‍රදේශයට පනවා ඇති කොවිඩ්-19 ආශ්‍රිත හුදකලා කිරීම ඉවත් කිරීමට ගත් තීරණය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් (DGHS) වෛද්‍ය අසේල ගුණවර්ධනගෙන් නොලැබීම නිසා එකී තීරණය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගෙන නොතිබුණි. කැස්බෑව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය සමන්තිකා විජේසුන්දර මහත්මියගේ ඉල්ලීම වූයේ මුළු පිළියන්දල ප්‍රදේශයම වසා දමන ලෙසත් පනවා ඇති පොදු හුදකලා කිරීම ඉවත් කිරීමට ගත් පියවර පිළිබඳව ඇයව දැනුවත් නොකළ බවත් පසුව වාර්තා විය.[191]

මේ පිළිබඳ මහජන විරෝධයෙන් පසුව, පිළියන්දල ප්‍රදේශයේ කොවිඩ්-19 තත්ත්වය සම්බන්ධයෙන් ඇගයීමක් සිදු කිරීමට රජය විසින් විශේෂඥ කණ්ඩායමක් යවා ඇති අතර එමගින් ප්‍රදේශය වසා දැමීමේ අවශ්‍යතාවයක් නොමැති බව තීරණය විය.[192] පසුගිය දින කිහිපය තුළ කොළඹ දිස්ත්‍රික්කයේ වැඩිම කොවිඩ්-19 රෝගීන් සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ පිළියන්දල ප්‍රදේශයෙන්ය.

සම කැබිනට් ප්‍රකාශක අමාත්‍ය රමේෂ් පතිරණ විසින් වාර්තා කරන ලද්දේ, අගුලු දැමීම් සහ හුදකලා කිරීම් සම්බන්ධයෙන් සියලු තීරණ ගනු ලබන්නේ ජාතික කොවිඩ්-19 කාර්ය සාධක බලකාය[193] විසින් බවත් පිළියන්දල අගුලු දැමීම හදිසියේ ඉවත් කිරීමේදී කිසිදු හදිසි දේශපාලන බලපෑමක් භාවිතා නොකළ බවත්ය.

කොවිඩ්-19 පැතිරීම වැළැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය (NOCPCO) ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා විසින් මෙහෙයවනු ලැබේ.[194]

නියමිත නිසි අධිකාරියේ නෛතික අධිකාරී බලය පොලිසිය සහ අනෙකුත් ක්‍රියාකාරීන් විසින් උදුරා ගනිමින් 'ආසාදිත ප්‍රදේශ' හඳුනාගෙන ක්‍රියා කිරීම සම්බන්ධයෙන් ඇති ගැටළුකාරී තත්ත්වයන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය මීට පෙර ඉස්මතු කර ඇත.[195]

පසුගිය දා ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර, වසංගත රෝග සහ කොවිඩ්-19 රෝග පාලන රාජ්‍ය අමාත්‍ය වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය විසින් ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාවේ වසංගත තත්ත්වය අවශ්‍ය

---

[191] හිරන්‍යා දේවසිරි, 'පිළියන්දල හුදකළා කිරීම ඉවත් කරන ලද්දේ සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් නොවේ'(ද මෝර්නින්, 2021 මැයි 5) යොමුව <https://www.themorning.lk/piliyandala-lockdown-lifting-not-by-health-ministry/ > 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

[192] 'පිළියන්දල අගුලු දැමීම ලිහිල් කිරීමේදී අනවශ්‍ය දේශපාලන බලපෑම් සිදු වූ බව රජය විසින් ප්‍රතික්ෂේප කරයි', ඉකොනමිනෙක්ස්ට්. <https://economynext.com/govt-denies-undue-political-influence-in-relaxing-piliyandala-lockdown-81472/> 2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය.; 'මෝඩයන් වෛද්‍යවරුන් වන්නට උත්සහ දරන විට' ද අයිලන්ඩ්, යොමුව. https://island.lk/when-mutts-try-to-be-docs/, 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

[193] 'පිළියන්දල අගුලු දැමීම ලිහිල් කිරීමේදී අනවශ්‍ය දේශපාලන බලපෑම් සිදු වූ බව රජය විසින් ප්‍රතික්ෂේප කරයි', ඉකොනමිනෙක්ස්ට්. <https://economynext.com/govt-denies-undue-political-influence-in-relaxing-piliyandala-lockdown-81472/> 2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය. ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාළ ව්‍යුහයන්: ජනාධිපති කාර්ය සාධක බලකාය පිළිබඳ කෙටි විග්‍රහයක්'. ද බලන්න, යොමුව <https://www.cpalanka.org/structures-to-deal-with-covid-19-in-sri-lanka-a-brief-comment-on-the-presi dential-task-force/ >

[194] 'සම්පූර්ණයෙන් රට වසා දැමීමක් ප්‍රකාශ කිරීමට කිසිදු තීරණයක් ගෙන නොමැත' යොමුව <http://www.dailynews.lk/2021/05/10/local/248889/no-decision-taken-declare-complete-lockdown> 2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය.

[195] 'නිරෝධායනය සහ රෝග වැළැක්වීම ආඥා පනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න සහ පිළිතුරු', විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය. යොමුව <https://www.cpalanka.org/q-and-a-on-regulations-issued-under-the-quarantine-and-prevention-of-diseases-ordinance-how-this-impacts-the-covid-19-response-in-sri-lanka/> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

වුවහොත් රට වසා දැමීමට සිදුවනු ඇති බවයි.[196] නිරෝධායන සහ රෝග නිවාරණ ආඥාපනත යටතේ සකස් කර ඇති රෙගුලාසිවලට අනුව සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් සමස්ථ රට වසා දැමීමක් සිදු කිරීම ක්‍රියාත්මක කළ හැක. පසුගිය කාලයේ කොවිඩ්-19 වෛරසය ව්‍යාප්ත වීම පාලනය කිරීම සඳහා අගුලු දැමීම් ක්‍රියාත්මක කරන ලද්දේ ජනාධිපතිවරයා හෝ පොලිසිය විසින් පැනවූ ඇඳිරි නීතිය මගිනි. එවැනි අගුලු දැමීමේ යාන්ත්‍රණවල නීත්‍යානුකූලභාවය පිළිබඳව පවතින ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මීට පෙර අවස්ථාවන්හි දී ඉස්මතු කර ඇත.[197] රටපුරා අගුලු දැමීමක් අවශ්‍ය වන අවස්ථාවක, මේ සම්බන්ධයෙන් සියලු ක්‍රියාමාර්ග අවශ්‍යතාවය මත සහ පවතින නීතිමය රාමුවට අනුකූලව ගනු ලබන බවට සහතික විය යුතුය.

## COVID-19 නිසා මිය යන පුද්ගලයන්ගේ මෘතදේහ ආදාහනය හෝ භූමදානය

කොවිඩ්-19 රෝගයෙන් මිය යන පුද්ගලයන් ආදාහනය කිරීම හෝ භූමදානය කිරීම සම්බන්ධයෙන් ගත් කල, වර්ෂ 2021 පෙබරවාරි 25, බ්‍රහස්පතින්දා දිනැති අංක 2216/38 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය, කොවිඩ්-19 රෝගයෙන් මිය යන පුද්ගලයන් ආදාහනය කිරීම පිළිබඳ මතභේදාත්මක නියෝගය (වර්ෂ 2020 අප්‍රේල් 11, සෙනසුරාදා දින අංක 2170/8 අති විශේෂ ගැසට් පත්‍රය මගින් නිකුත් කරන ලද) රටෙහි මුස්ලිම් සහ ක්‍රිස්තියානි සුළු ජාතීන් මෙන්ම මිනිස් අයිතිවාසිකම් සම්බන්ධයෙන් ජාතික[198] සහ ජාත්‍යන්තර මට්ටමේ කණ්ඩායම්[199] විසින් මාස 10ක පමණ දීර්ඝ කාලයක් පුරාවට සිදුකල විවේචනවලින් පසුව, කොවිඩ්-19 වින්දිතයන්ගේ සිරුරු ආදාහනය කිරීම සම්බන්ධ තීරණය වෙනස් කරන ලදී. ආදාහනයට අමතරව භූමදානය ඇතුළත් කිරීමට පෙර නියෝගය සංශෝධනය කරන ලද අතර, නව උප-රෙගුලාසියක් එකතු කරන ලද්දේ ''භූමදානය කිරීමේදී, එවැනි පුද්ගලයෙකුගේ මෘත දේහය භූමදාන කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද උපදෙස් වලට අනුකූලව එම අධිකාරියේ අධීක්ෂණය යටතේ නිසි බලධාරියා විසින් අනුමත කරන ලද සුසාන භූමියක හෝ ස්ථානයක එසේ කළ යුතුය.''[200]

## නිරෝධායන රෙගුලාසි කඩ කරන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම අඛණ්ඩව සිදු කෙරේ

වර්ෂ 2021 මැයි 10 වැනි දින නිකුත් කළ නිවේදනයක පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති අජිත් රෝහණ යළිත් අවධාරණය කළේ නිරෝධායන රෙගුලාසි කඩ කරන පුද්ගලයින්ට නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ සහ අපරාධ නීතියේ ප්‍රතිපාදන යටතේ නඩු පවරන බවයි.[201] නිරෝධායන රෙගුලාසි උල්ලංඝනය කරන පුද්ගලයින්ට නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 4 සහ 5 වගන්ති යටතේ සහ දණ්ඩ නීති සංග්‍රහයේ 264 වගන්තිය යටතේ චෝදනා එල්ල කළ හැක.[202]

නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 4(1) වගන්තියේ සඳහන් වන්නේ, ''නීත්‍යානුකූල බලයක් හෝ නිදහසට කරුණක් නොමැතිව (ඔහු මත පවතිනු ලබන සාක්ෂිය), මෙම ආඥාපනත යටතේ සාදන ලද ඕනෑම රෙගුලාසියකට පටහැනිව ක්‍රියා කරයි නම්, හෝ කරන්නේ නම් හෝ නොකර හරින්නේ

---

196 පවතින තත්වයකට අවශ්‍යතාවක් උද්ගත වේ නම් ශ්‍රී ලංකාව වසා දැමීමට ඉඩ ඇත: රාජ්‍ය අමාත්‍ය ප්‍රනාන්දුපුල්ලේ, යොමුව <https://economynext.com/sri-lanka-may-go-into-lockdown-if-situation-calls-for-it-state-minister-fernandopulle-81638/> 2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය.

197 'විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, කොවිඩ්-19 ට ප්‍රතිචාර දැක්වීම පිණිස ඇඳිරි නීතිය පැනවීම: ශ්‍රී ලංකාවේ නීතිමය රාමුව සහ අදාළ ප්‍රශ්න' යොමුව <https://www.cpalanka.org/curfew-in-response-to-covid-19-legal-framework-and-relevant-questions-in-sri-lanka/2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය

198 'බලහත්කාරයෙන් ආදාහනය කිරීම පිළිබඳ ප්‍රකාශය' විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, යොමුව https://www.cpalanka.org/statement-on-forced-cremations/ > 2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය.

199 'කොවිඩ්-19 වින්දිතයින්ගේ බලහත්කාර ආදාහන කටයුතු ශ්‍රී ලංකාව තුළ අවසන්' ද හින්දු, යොමුව <https://www.thehindu.com/news/international/sri-lanka-ends-forced-cremations-of-covid-19-victims/article33940422.ece> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය

200 2021 පෙබරවාරි 25 බ්‍රහස්පතින්දා දිනැති අංක 2216/38 දරණ (අතිවිශේෂ) ගැසට් පත්‍රය < http://documents.gov.lk/files/egz/2021/2/2216-38_S.pdf>

201 'නිරෝධායන නීති කඩ කිරීම සම්බන්ධයෙන් 351 දෙනකු අත්අඩංගුවට; 2020 ඔක්තෝබර් සිට 7000+ අත්අඩංගුවට', සුලෆික් ෆර්සාන් (නිවුස් ෆස්ට්, 2021 මැයි 10) <https://www.newsfirst.lk/2021/05/10/351-arrested-for-violating-quarantine-rules-7000-arrested-since- october-2020/> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

202 'නිරෝධායන කඩ කිරීම් සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ 75 දෙනෙක් පොලිස් අත්අඩංගුවට' (ඩේලි නිව්ස්, 2021 මැයි 6) යොමුව http://www.dailynews.lk/2021/05/06/law-order/248538/police-arrest-75-wp-quarantine-violations> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

නම් මෙම ආඥාපනතේ විධිවිධාන යටතේ හෝ ඒ යටතේ සම්පාදනය කර ඇති ඕනෑම රෙගුලාසියක් යටතේ ඔහු විසින් නොකළ යුතු හෝ නොසලකා හැරිය යුතු ඕනෑම දෙයක් කිරීමට හෝ මෙම ආඥාපනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් රෙගුලාසියක් ක්‍රියාත්මක කිරීමේදී මෙම ආඥාපනත යටතේ පත් කර ඇති කිසියම් පරීක්ෂකවරයෙකුට හෝ වෙනත් නිලධාරියෙකුට හෝ ඕනෑම පොලිස් නිලධාරියෙකුට අවහිර කිරීම හෝ බාධා කිරීම සිදු කරයි නම් ඔහු මෙම ආඥාපනතට එරෙහි වරදකට වැරදිකරු විය යුතුය.''

නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥාපනතේ 5(1) වගන්තියට අනුව, ''මෙම ආඥාපනතට එරෙහි වරදකට යම් තැනැත්තෙකු වරදකරු වන්නේ නම්, ඔහු මහේස්ත්‍රාත්වරයා ඉදිරියේ වරදකරු වීම මත මාස හයකට නොවැඩි කාලයක් සඳහා සිරගත කිරීමට හෝ රුපියල් දෙදහසකට අඩු සහ රුපියල් දස දහස නොඉක්මවන දඩයකට හෝ ඒ දෙකටම යටත් විය යුතුය.''

ඒ හා සමානව, දණ්ඩ නීති සංග්‍රහයේ 264 වගන්තියේ සඳහන් වන්නේ ''බෝවෙන රෝගයක් ඇති ස්ථානයක් වෙනත් ස්ථාන සමග ඇති අන්‍යොන්‍ය සම්බන්ධත්වය පාලනය කිරීම සඳහා ආණ්ඩුව විසින් පනවා ප්‍රසිද්ධ කරනු ලැබූ යම් ව්‍යවස්ථාවකට දැනුවත්ව අකීකරු වන තැනැත්තෙකුට මාස හය දක්වා කාලයක, දෙයාකාරයෙන් එක් ආකාරයක, බන්ධනාගාරගත කිරීමකින් හෝ දඩයකින් හෝ එකී දඬුවම් දෙකින්ම දඬුවම් කළ යුතුය.''

වර්ෂ 2020 ඔක්තෝබර් 30 සිට වර්ෂ 2021 මැයි 10 දක්වා කාලය තුළ මුඛ ආවරණ පැළඳීම සහ සමාජ දුරස්ථභාවය පවත්වා නොගැනීම වැනි නිරෝධායන රෙගුලාසිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් පුද්ගලයින් 7316 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.[203]

පොලිස් මාධ්‍ය ප්‍රකාශක[204] විසින් ප්‍රකාශ කරන ලද්දේ නිරෝධායන නීති රීති මහජනතාව පිළිපදින්නේ ද යන්න පරීක්ෂා කිරීම සඳහා විශේෂ කණ්ඩායම් පොදු පරිශ්‍රවල යොදවා ඇති බවයි. ප්‍රධාන වශයෙන් කොළඹ නගර සීමාවේ මෙන්ම ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල ද පොලිසිය විශේෂ මෙහෙයුම් අඛණ්ඩව ක්‍රියාත්මක කරන බවත් බස් රථ පර්යන්ත, දුම්රිය ස්ථාන, වෙරළ, උද්‍යාන, ආපනශාලා වැනි පොදු ස්ථාන වැටලීම් සිදුකරන බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කළේය.[205] මෙම විශේෂ මෙහෙයුම් නීතියේ තෝරාගත් භාවිතයේ තවත් අවස්ථාවක් ලෙස විවේචනයට ලක්ව ඇත.[206]

## කොවිඩ්-19 එන්නත සඳහා ජාතික යෙදවීම සහ එන්නත් කිරීමේ සැලැස්ම සඳහා ජනාධිපති කාර්ය සාධක බලකාය පිහිටුවීම, කොවිඩ්-19 සඳහා ජාතික යෙදවීම සහ එන්නත් කිරීමේ සැලැස්ම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය

වර්ෂ 2020 දෙසැම්බර් 31 වැනි බ්‍රහස්පතින්දා දිනැති අංක 2208/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් කොවිඩ්-19 ජාතික එනත්ත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාදක බලකාය ස්ථාපිත කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 33 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් කාර්ය සාධක බලකාය ස්ථාපිත කරන ලද අතර, එය මෑත මාසවල පත් කරන ලද නවතම කාර්ය සාධක බලකාය වේ.[207]

---

203 'නිරෝධායන නීති කඩ කිරීම සම්බන්ධයෙන් 351 ක් අත්අඩංගුවට; 2020 ඔක්තෝබර් සිට 7000+ අත්අඩංගුවට'

සුලෆික් ෆර්සාන් (2021 මැයි මස 10 වන දින නිවුස් ෆස්ට්). https://www.newsfirst.lk/2021/05/10/351-arrested-for-violating-quarantine-rules-7000-arrested-since- october-2020/> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

204 ඉමේෂ් රණසිංහ, 'නිරෝධායන රෙගුලාසිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් ශ්‍රී ලාංකිකයන් 7,316ක් පොලිසිය අත්අඩංගුවට ගනී' (ඉකොනමිනෙක්ස්ට්, 10 මැයි 2021) <https://economynext.com/police-arrest-7316-sri-lankans-for-alleged-non-compliance-of-quarantine-reg ulations-81736/> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

205 ඉහත එම.

206 ඉහත එම.

207 විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් ජනාධිපති කාර්ය සාධක බලකායන් පිහිටුවීමේ නීතිමය සහ ප්‍රායෝගික තත්ත්වයන් හා ගැටලු සම්බන්ධයෙන් මීට පෙර විමර්ශනය කර ඇත.
ශ්‍රී ලංකාවේ කොවිඩ්-19 සම්බන්ධයෙන් කටයුතු කිරීමට ව්‍යුහයන්: ජනාධිපති කාර්ය සාධක බළකාය පිළිබඳ කෙටි අදහස් දැක්වීමක්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, බලන්න. යොමුව <https://www.cpalanka.org/structures-to-deal-with-covid-19-in-sri-lanka-a-brief-comment-on-the-presidential-task-force/ >

කාර්ය සාධක බලකායේ කාර්ය කර්තව්‍යයන් පහත පරිදි වේ,

(අ) තාකක්ෂණික විශේෂඥයන් සමග සාකච්ඡා කිරීමෙන් සහ පවතනා සාක්ෂි මත පදනම්ව ශ්‍රී ලංකාව සඳහා වඩාත් සුදුසු ආරක්ෂිත සහ කාර්යක්ෂම කොවිඩ් - 19 එන්නතක් හඳුනා ගැනීම.

(ආ) කොවිඩ් - 19 එන්නත නියමිත කාලයට ලබාදීමේ දී හදිසි අනුමත කිරීම්, කඩිනම් ප්‍රසම්පාදනය, ආනයනය, රේගු නිදහස් කිරීම් හා ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා නිකුත් කිරීම් කිරීමේ දී සුදුසු හා විධිමත් නියාමන හා පරිපාලන පටිපාටි ස්ථාපිත කිරීම.

(ඇ) තාකක්ෂණික හා ද්‍රව්‍යමය සහාය සඳහා අදාළ තානාපති කාර්යාල, ආධාර ලබා දෙන ආයතන, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ වෘත්තිකයින් සමග එක්ව කටයුතු කිරීම.

(ඈ) එන්නත්කරණ පළමු අදියර සඳහා කොවිඩ් - 19 වැළඳීමට ඉහළ අවදානමක් සහිත ජන කණ්ඩායම් හඳුනාගෙන ප්‍රමුඛතාවය ලබා දීම සහ ඉන්පසු අනුක්‍රමිකව සාමාන්‍ය ජනතාවට ලබා දීම සඳහා සැලසුම් කිරීම.

(ඉ) පැහැදිලි වගකීම්, සම්මත මෙහෙයුම් ක්‍රියාපටිපාටි සහ සහභාගී වන පාර්ශවකරුවන් සඳහා කාල රාමු සහ වාර්තාකරන ක්‍රියා පිළිවෙලවල් සහ කළමනාකරණ ව්‍යුහයන් ද ඇතුළත් කොවිඩ් - 19 එන්නත බෙදා හැරීම සහ එන්නත්කරණ සැලැස්මක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

(ඊ) එන්නත් ගබඩා කිරීම, බෙදා හැරීම, උෂ්ණත්ව නියාමනය හා අධීක්ෂණය සහ එන්නත්තොග ප්‍රමාණ වාර්තා කිරීම පිණිස වර්තමානයේ පවතනි ක්‍රමවේදයන්හි අඩුපාඩු හඳුනා ගැනීම හා ඒ සඳහා පිළියම් යෙදීම පිණිස පවතින සැපයුම්දාම විශ්ලේෂණය කිරීම.

(උ) එන්නත් භාවිතය අධීක්ෂණය හා වාර්තා කිරීම ද ඇතුළත්ව එන්නත් තොග කළමණාකරණය සහ බෙදා හැරීම් සඳහාවන ශක්තිමත් සැපයුම්දාම තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම.

(ඌ) එන්නත්කරණය සඳහා ස්ථාන සහ එන්නත්කරණ කණ්ඩායම් හඳුනා ගැනීම, වෛද්‍ය උපකරණ සහ පරිභෝජන ද්‍රව්‍ය මිලදී ගැනීම සහ බෙදා හැරීම, ශීත තත්ත්වදාම ධාරිතාව සහ එන්නත් ගබඩා කිරීම යනාදී කටයුතු ඇතුළත් එන්නත්කරණ සැලසුම ක්‍රියාවටනැංවීම සඳහා සුදුසු සැපයුම් සේවා සැලැස්මක් සකස් කිරීම සහ එය ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම.

(එ) එන්නත් බෙදා හැරීම හා එන්නත්කරණය නියමිත කාලයට සිදුකිරීම තහවුරු කිරීම සඳහා අවශ්‍යවන මානව සම්පත, තාක්ෂණය හා මූල්‍ය ප්‍රතිපාදන හඳුනා ගැනීම.

(ඒ) කොවිඩ් - 19 එන්නත් පිළිබඳව ගෝලීය තොරතුරු අඛණ්ඩව සමාලෝචනය කිරීම හා එම තොරතුරු සුදුසු ලෙස, කොවිඩ් - 19 එන්නත් බෙදා හැරීම හා එන්නත්කරණ ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී හා සකස් කිරීමේ දී භාවිතා කිරීම.

(ඔ) එන්නත්කරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සහ අහිතකර සිද්ධීන් ක්ෂණිකව වාර්තා කිරීම සඳහා එන්නත් සුපරීක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම.

(ඕ) එන්නත් බෙදා හැරීම සහ එන්නත්කරණය සාර්ථකව සහ නියමිත කාල රාමුව තුළ සිදු කිරීම සඳහා සැපයුම්දාම හා සෞඛ්‍ය කාර්යය මණ්ඩල විධිමත් ලෙස පුහුණු කිරීම තහවුරු කිරීම සහ එම පුහුණුවෙහි ගුණාත්මක බව තහවුරු කිරීම පිණිස අදාළ විශේෂඥයින් හා ආයතන සමග ඒකාබද්ධව කටයුතු කිරීම.

(ක) එන්නත් බෙදා හැරීම හා එන්නත්කරණයේ ප්‍රගතිය පිළිබඳව වාර්තා කිරීමට පොදු සන්නිවේදන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

කාර්ය සාධක බලකායට තම කාර්ය කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි උපදෙස් නිකුත් කිරීමට, කරුණු සොයා බැලීමට සහ පරීක්ෂා කිරීමට තවදුරටත් බලය ඇත. සියලුම රජයේ නිලධරයන් හා සෙසු තැනැත්තන්ට තත්කාර්ය සම්බන්ධයෙන් නිසි අයුරින් පිළිපැදිය හැකි එබඳු උපදෙස්වලට අනුකූලව ක්‍රියාකළ යුතු යැයි ද, ලබාදිය යුතු සියලුම සහාය සැලසිය යුතු යැයි ද, සැපයිය හැකි සියලුම තොරතුරු ලබාදිය යුතු යැයි ද මෙම ගැසට් නිවේදනය අනුව අවශ්‍ය වේ.

සෞඛ්‍ය අංශයේ සහ හමුදාවේ මුල් පෙළේ සේවකයින් ඇතුළු පුරවැසියන් 925,242 දෙනෙකුට ඔවුන්ගේ පළමු එන්නත ලබා දීමෙන් ශ්‍රී ලංකාව මේ වසරේ ජනවාරි 29 වන දින එන්නත් නිකුත් කිරීම ආරම්භ

කළේය. තෝරාගත් ප්‍රදේශවල මහජනතාවට ද ඉන් පසු සති කිහිපය තුළ මෙම එන්නතෙහි පළමු මාත්‍රාව ලැබුණි.

කෙසේ වෙතත්, ප්‍රමුඛතා ලැයිස්තුවක් අවිධිමත් ලෙස ඉවත දමා අක්‍රමිකතා ඇති බවට එල්ල වූ චෝදනා මධ්‍යයේ, අප්‍රේල් 15 දින එන්නත් ක්‍රියාවලිය අත්හිටුවන ලදී.[208] අප්‍රේල් 23 දින සිට මැයි 09 දක්වා වූ කාලය තුළ, මුල්පෙළේ සේවකයින් ඇතුළු 925,242 න් 196,546 දෙනෙකුට ඔවුන්ගේ දෙවන AstraZeneca එන්නත් මාත්‍රාව ලබා ගන්නා ලදී.

ඉන්දියානු රජය විසින් පරිත්‍යාග කරන ලද, COVAX පහසුකම හරහා ලැබුණු හෝ නිෂ්පාදකයාගෙන් සෘජුවම මිලදී ගත් AstraZeneca මාත්‍රා 1,264,000 න්, දෙවන මාත්‍රාව ලෙස ලබාදීම සඳහා බලධාරීන් 338,758 ක් ගබඩා කර තබා ගෙන ඇත. අද වන විට 586,484 දෙනෙකුට ඔවුන්ගේ දෙවන මාත්‍රාව තවමත් ලැබී නොමැත.

මේ අතර, ජාතික ඖෂධ නියාමන අධිකාරියේ (NMRA) අනුමැතියෙන් පසුව, ශ්‍රී ලංකාව චීනයේ නිෂ්පාදිත Sinopharm එන්නත සහ රුසියාවේ නිෂ්පාදිත Sputnik V එන්නත සාමාන්‍ය ජනතාව අතරට නිකුත් කිරීම ආරම්භ කර ඇත.[209] මෑතක දී ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් Pfizer කොවිඩ්-19 එන්නත සඳහා ද අනුමැති ලබා දී තිබුණි.[210]

කෙසේ වෙතත්, පසුගිය මාස කිහිපය තුළ එන්නත් කිරීමේ ක්‍රියාවලියේ අඩුපාඩු සහ අක්‍රමිකතා රාශියක් වාර්තා විය.

කොවිඩ්-19 ප්‍රතිචාරයේ පෙරමුණේ සිටියද හෙදියන්ට තවමත් කොවිඩ්-19 එන්නත ලැබී නොමැති බව සමස්ත ලංකා හෙද සංගමයේ මහ ලේකම්වරයා පැවසීය.[211]

ජාත්‍යන්තරව පිළිගත් යාන්ත්‍රණයක් මත නොමිලේ ලැබුණු එන්නත් ලබාදීමට රජය අපොහොසත් වූ බව විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරුන් පෙන්වා දී ඇත.

ඇතැම් පාර්ශව විසින් ගනු ලබන තීරණ හේතුවෙන් කොවිඩ්-19 එන්නත ලබාදීමේ ක්‍රමවේදයේ ගැටලු මතුව ඇති බව ප්‍රාථමික සෞඛ්‍ය, වසංගත රෝග සහ කොවිඩ් රෝග පාලන රාජ්‍ය අමාත්‍ය වෛද්‍ය සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය පිළිගෙන තිබේ.

"මහජන සෞඛ්‍යය ගැන කිසිම අවබෝධයක් නැති සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන්ගේ ක්‍රියාකලාපය තමයි මේකට හේතුව. කොවිඩ් මර්දන අමාත්‍යවරයා වශයෙන් කොවිඩ් මර්දන කමිටු රැස්වීමක් තිබෙන බව මම දන්නේ නැහැ. සන්නිවේදන ගැටළු හේතුවෙන් යම් ව්‍යාකූලත්වයක් පවතිනව. මේක වෙනස් කරන්න ඕන." යනුවෙන් රාජ්‍ය ඇමැතිවරිය ප්‍රකාශ කරන ලදී.[212] එන්නත් කිරීමේ ක්‍රියාවලියේ අක්‍රමිකතා එන්නත් නිකුත් කිරීමට අදාළ ක්‍රියාවලිය පිළිබඳව මහජනතාවට තොරතුරු සැපයීම සඳහා ඒකාබද්ධ මහජන ව්‍යාපාරයක් නොමැතිකම නිසා බිය සහ අවිනිශ්චිතභාවය ඇති කරයි.

---

208 චන්ක ජයසිංහ, ශ්‍රී ලාංකිකයින් 7500කට වැඩි පිරිසක් කොවිඩ් 19 සඳහා සිනොෆාර්ම්, ස්පුට්නික් V එන්නත් ලබාගෙන ඇත. (ඉකොනමිනෙක්ස්ට්, 10 මැයි 2021) යොමුව <https://economynext.com/over-7500-sri-lankans-have-received-sinopharm-sputnik-v-vaccines-against-covid-19-81758/> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

209 ඉහත එම.

210 'ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ෆයිසර් එන්නත ශ්‍රී ලංකාව තුළ භාවිතයට අවසර දෙයි' <http://www.ft.lk/front-page/NMRA-approves-Pfizer-vaccine-for-use-in-SL/44-717560> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

211 'හෙදියන්ට තවමත් කොවිඩ්-19 එන්නත් ලබා ගැනීමට හැකි වී නැත; වෘත්තීය සමිති පන්වා දේ', යොමුව <https://www.newsfirst.lk/2021/05/03/nurses-yet-to-receive-covid-19-vaccines-union-claims/> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

212 කොවිඩ් එන්නත ලබාදීමේ ගැටළු රාජ්‍ය අමාත්‍යවරයා පිළිගන්නා අතර, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීන්ට දොස් කියයි. (කළම්බුපේජ්, 2021 පෙබරවාරි 24) යොමුව හැක<http://www.colombopage.com/archive_21A/Feb24_1614188873CH.php> 2021 මැයි මස 10 වන දින ප්‍රවේශ විය.

බස්නාහිර පළාත කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇති බැවින් එන්නතකරණය ජාතික වශයෙන් දීප ව්‍යාප්තව සිදු වන්නේ කෙසේද යන්න පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු නොමැත. මෙවැනි ගැටළුකාරී තත්ත්වයන් වහාම නිවැරදි කළ යුතුයි.

## නිගමනය

පවතින වසංගතය තත්ත්වය සම්බන්ධයෙන් ඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් නෛතික සහ ව්‍යුහාත්මක රාමුවක් පවතින බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මීට ඉහත දී ඉදිරිපත් කරන ලද මාර්ගෝපදේශ මගින් පෙන්වා දී ඇත. ශක්තිමත් මහජන සෞඛ්‍ය අංශයක් සහ පුළුල් ව්‍යසන කළමනාකරණ යාන්ත්‍රණයක් සමග හදිසි අවස්ථා සහ ව්‍යසන වලට සාර්ථකව මුහුණ දීමේ වසර ගණනාවක අත්දැකීම් ශ්‍රී ලංකාවට ඇත.

හදිසි අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීම සඳහා ක්‍රියාත්මක කර ඇති යාන්ත්‍රණයන්හි පූර්ණ ප්‍රතිලාභ පුරවැසියන්ට ලැබෙන බව සහතික කිරීම සඳහා සියලු ක්‍රියාවන්හි විනිවිදභාවය, වගවීම සහ නීත්‍යානුකූලභාවය අවශ්‍ය බව ව්‍යසන සහ ජාතික හදිසි අවස්ථා පිළිබඳ අතීත අවස්ථා ද පෙන්නුම් කර ඇත.[213]

එසේ තිබියදීත්, වෛරසය පැතිරීම අවම කිරීම සහ අත්‍යාවශ්‍ය සේවා සැපයීමේ සිට කොවිඩ්-19 එන්නත්කරණ ක්‍රියාවලිය පරිපාලනය නියාමනය කිරීම දක්වා කොවිඩ්-19 වසංගතය ආශ්‍රිත විවිධ ගැටළු විසඳීම සඳහා අනුප්‍රාප්තික ජනාධිපති කාර්ය සාධක බලකායන් පිහිටුවීම පසුගිය වසර තුළ දක්නට ලැබුණි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම ව්‍යුහයන්ගේ නීත්‍යානුකූලභාවය මෙන්ම වසංගතය සහ ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් වශයෙන් ඵලදායි ලෙස පාලනය කිරීම කෙරෙහි මෙයින් ඇති විය හැකි අනපේක්ෂිත ප්‍රතිවිපාක පිළිබඳව ඇති ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් ස්වකීය කනස්සල්ල ඉස්මතු කර ඇත.[214] වර්තමාන අර්බුදය ඔස්සේ පෙන්නුම් කරන්නේ ඉස්මතු වෙමින් පවතින සෞඛ්‍ය අර්බුදයට මෙම ව්‍යුහයන් හරහා විසඳුම් සෙවීමට අපොහොසත් වී ඇති අතර විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් වර්තමාන හමුදාකරණය වූ ප්‍රවේශයට සහ තාවකාලික ක්‍රියා පටිපාටිවලට වඩා කොවිඩ්-19 ප්‍රතිචාරය තුළ සෞඛ්‍ය වෘත්තිකයන්ගේ සහ අනෙකුත් ප්‍රවීණයන්ගේ දායකත්වයෙන් සපිරි වඩාත් ශක්තිමත් භූමිකාවක් පැවතීමේ අවශ්‍යතාවය යෝජනා කරනු ලබයි.

---

[213] වගවීම සහ විනිවිදභාවය පිළිබඳ ප්‍රශ්න මතු කරමින් ඌන ප්‍රයෝජනයට ගෙන ඇති ඉටුකම කොවිඩ්-19 අරමුදලේ ගැටලු පිළිබඳව මාධ්‍ය වාර්තා පෙන්වා දෙන බව මේ සම්බන්ධයෙන් සඳහන් කළ යුතුය. ඩේලි එෆ්.ටී., 'කොවිඩ් අභියෝග' යොමුව <http://www.ft.lk/ft_view__editorial/COVID-challenges/58-717654> 2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය.; <https://www.transparency.org/en/blog/ensuring-covid-19-relief-reaches-sri-lankas-people> 2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය.

[214] ශ්‍රී ලංකාවේ කොවිඩ් 19 තත්ත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අවැසි ව්‍යුහයන්: ජනාධිපති කාර්ය සාධක බලකාය පිළිබඳ ලුහුඬු විග්‍රහයක්" යොමුව <https://www.cpalanka.org/structures-to-deal-with-covid-19-in-sri-lanka-a-brief-comment-on-the-presidential-task-force/> 2021 මැයි මස 11 වන දින ප්‍රවේශ විය.